වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2021

වාරිමාර්ග අමාත්‍යාංශය

நீர்ப்பாசன அமைச்சு

Ministry of Irrigation

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

අන්තර්ගතය

වැය ශීර්ෂ අංකය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 05
පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 49
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 55
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 56
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 58
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 59

වැය ශීර්ෂ අංකය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 66
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 74
පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 98
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 105
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 105
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 106
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 111

ඇමුණුම්

ඇමුණුම I - වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඇමුණුම II - වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඇමුණුම III - විගණකාධිපතිවරයාගේ වාර්තාව (වාරිමාර්ග අමාත්‍යාංශය)

ඇමුණුම IV - විගණකාධිපතිවරයාගේ වාර්තාව (වාරිමාර්ග දෙපාර්තමේන්තුව)

වැය ශීර්ෂ - 198

වාරිමාර්ග අමාත්‍යාංශය

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

විවිධ වූ විෂය පථයන් සහිත අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ වාරිමාර්ග අමාත්‍යාංශය අංක 2187/27 සහ 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් වාරිමාර්ග අමාත්‍යාංශය ලෙස කැබිනට් අමාත්‍යාංශයක් බවට පත්වූ අතර, ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය පිණිස සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි. මෙහිදී අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් ලෙස මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත විය.

කෘෂිකාර්මික සංවර්ධනය තුළින් රටෙහි සමස්ථ ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමෙහිලා වාරි ජලය සැපයුමත්, ඉන් ඔබ්බට යමින් පානීය, කෘෂිකාර්මික හා විදුලි උත්පාදන යන බහුවිධ අරමුණු ඔස්සේ ජල සම්පත් සංවර්ධනය හා මෙහෙයවීමත් තුළින් සිය කාර්යභාරය වඩාත් පුළුල් කිරීමට කටයුතු කර ඇති වාරිමාර්ග අමාත්‍යාංශය කාර්යක්ෂම ලෙස එම කාර්යයන් ඉටු කිරීම සඳහා තවදුරටත් කටයුතු කරයි.

ඒ අනුව, මධ්‍යම හා මහා වාරි කලාප ආශ්‍රිතව ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් ඔස්සේ ගොවි ප්‍රජාව සවිබල ගැන්වීමත්, භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් එහි ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පවත්වා ගැනීමත් සඳහා විවිධ වැඩසටහන් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

වාරිමාර්ග අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේ දී ඒ සඳහා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධිත ආයතන වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග කළමනාකරණ අංශය මඟින් ලැබුණු දායකත්වය ඉතා වැදගත් වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1. දැක්ම

"තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම"

1.2.2. මෙහෙවර

ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් බහුවිධ අවශ්‍යතා ඉටු කරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවැත්ම සැලසීම

1.2.3. අරමුණු

i. රටේ සියලු ජල පරිභෝජන හා බලශක්ති අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ජල සම්පත සංවර්ධනය හා කළමනාකරණය

ii. ඉඩම් හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

iii. ගංහා ද්‍රෝණි හා ජල මූලාශ්‍ර සංරක්ෂණය මගින් ජලයේ ගුණාත්මක බව හා තිරසාර බව ආරක්ෂා කිරීම

iv. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අවශ්‍ය වාරි ජල පහසුකම් සැලසීම

v. සියලු ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය ආරක්ෂිත ගෘහස්ත ජල සැපයුමක් තහවුරු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම

vi. පාරිසරික සමතුලිතතාව හා සංවර්ධනය සඳහා අවශ්‍ය ජල පහසුකම් සැලසීම

vii. වාරි පද්ධති ආශ්‍රිත ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ තිරසාර බව තහවුරු කිරීම

viii. ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය

1.3. ප්‍රධාන කාර්යයන්

i. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය හා ඇගයීම.

ii. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය

iii. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුලු ව වාරිමාර්ග පද්ධති හා ගංහා ද්‍රෝණි කළමනාකරණය

iv. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.

v. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන් කිරීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරීම.

vi. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැලැක්වීමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපායමාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

vii. ගොඩබිමට කරදිය ගලා ඒම වැලැක්වීමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

viii. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.

ix. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.

x. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.

xi. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.

xii. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xiii. දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම.

1.4. සංවිධාන සටහන


අමාත්‍යාංශ ලේකම්
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.තු.සේ.)
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.කෘ.සේ.)
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ඉ.සේ.)
අති.ලේකම් (තාක්. හා ප්‍රසම්.)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
අති.ලේකම් (සාලනා)
අති.ලේකම් (ජල සම්.කළ. හා සං.)
අති.ලේකම් (ව්‍යා.පිරිස්.කළ.)
අති.ලේකම් (ඉඩම් හා නීති)
අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍යක්ෂ (තාක්.විග.
ප්‍ර.අ.වි.
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
ප්‍රධාන ගණකාධිකාරී
ජෙ.ස. ගේ
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ (ජල සම්.කළ. හා සං.)
අධ්‍යක්ෂ (ඉඩම් හා නීති)
සහ.අධ්‍ය. (සැලසුම්)
සහ.අධ්‍ය. (තාක්,විග.)
අ.වි.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍ය.
සහ. අධ්‍යක්ෂ
ගණකාධිකාරී
සහ. ලේකම්
සහ. අධ්‍යක්ෂ
සහ. අධ්‍යක්ෂ
සහ. අධ්‍යක්ෂ
සහ.අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.පරි.සේ.)
සහ.අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.පරි.සේ.)
නීති නිලධාරී
පරි. නිලධාරී
භාෂා පරිවර්තක
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ශාඛා ප්‍රධානී
ලේකම්තුමා සම්බන්ධීකරණ ලේකම්
සං.නිල. ක.සේ.නි.
සං.නිල., ඉ-ඊ. සහ ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සං.නිල. ක.සේ.නි.
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්
සුළු සේවකයින්

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ අරමුදල්

- වාරිමාර්ග කළමනාකරණ අංශය
- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
- මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව
- මහවැලි උපදේශක සේවා කාර්යාංශය

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම	**ආ) දායක නියෝජිතායතනය**	**ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම් (රු.මි.)**	**ඈ) ව්‍යාපෘති කාල සීමාව**
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)	ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා ජනරජය	160,356 (සංශෝධිත) (මූලිකව ඇ.ඩො.මි. 675)	2015 – 2024
උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය (2015 වසරේ සිට දේශීය අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ)	ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව	89,800 (ඇ.ඩො.මි.514.06 +රු.මි. 98,361.70)	2010 මාර්තු - 2022 ජුනි
මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය	CDB, SFD, KFAED, OFID, GOSL	117,700 (ඇ.ඩො.මි. 770.41)	2007 - 2022
දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය	ලෝක බැංකුව	17,764.80 (ඇ.ඩො.මි. 110)	2014 අගෝස්තු - 2021 ඔක්තෝබර්
දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 11	ලෝක බැංකුව	6,783.00 (ඇ.ඩො.මි. 42)	2016 අගෝස්තු - 2021 ඔක්තෝබර්
භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය	නෙදර්ලන්තයේ රාබෝ බැංකුව විසින් ලබා දෙන ලද ණය මුදලකි	5,613.00 (යූරෝ මිලියන 20.63)	2018 මාර්තු - 2022 දෙසැම්බර්
ජල කළමනාකරණයට ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් දේශගුණික විචල්‍යතා කළමනාකරණය (වැව්ගම් පුබුදුව - CRIWMP)	හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය	9,114 (ඇ.ඩො.මි. 52.08)	2017 – 2024
ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	ලෝක බැංකුව	14,199.43	2021 - 2026

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1. විශේෂ කරුණු

* තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය, මාදුරු ඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය ඇතුලු විශාල ව්‍යාපෘති රැසක ඉදිකිරීම් කටයුතු 2021 වසර තුළ ආරම්භ කිරීමට හැකිවිය.

* ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය සහ කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන්ගේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2021 වර්ෂයේ දි සිදු කරන ලදී.

* ශ්‍රී ලංකාවේ මේ වන විට ක්‍රියාත්මක විශාලතම ජල සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය වන මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි පළමු අදියරට අයත් ඉදිකිරීම් පැකේජ 21න් දොළහක ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය අවසන් වන විට ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, ඉන් කිහිපයක වැඩ අවසන් කර ඇත.

2.1.2. ප්‍රගතිය

තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අරමුණ පෙරදැරි කර ගත් වාරිමාර්ග අමාත්‍යාංශය, දිවයින පුරා ඇති වැව් හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණයට අමතරව වාරිමාර්ග පද්ධතීන් පුළුල් කිරීමට ද උර දී සිටියි. එසේම, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක බෝහෝ ව්‍යාපෘති හුදෙක් වාරිමාර්ග සංවර්ධනයට පමණක් සීමා නොවී, ජාතික අවශ්‍යතාවයන් වන පානීය ජලය සහ ජල විදුලිබල උත්පාදනය ද ඉලක්ක කර ඇත.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සුවිශේෂී ජයග්‍රහණ රැසක් අත්කර ගත් වසරක් ලෙස 2021 වර්ෂය හැඳින්විය හැකිය. මොරගහකන්ද සහ කළුගඟ ජලාශ මේ වනවිට ක්‍රියාකාරී මට්ටමේ පවතින අතර, මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ සමස්ථ කාර්යයන්ගෙන් 98%ක භෞතික ප්‍රගතියක් 2021 වර්ෂය අවසන් වනවිට ලභා කරගෙන ඇත.

මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ඉදිකිරීමේ ප්‍රතිලාභ ඉලක්කගත ප්‍රදේශ වෙත ලබා දීම උදෙසා මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ මිනිපේ වම් ඉවුරු ඇළ, උතුරු මැද පළාත් ඇළ සහ වයඹ පළාත් ඇළ ඉදි කරමින් පවතී. පළමු අදියර යටතේ හඳුනාගෙන ඇති ඉදිකිරීම් පැකේජ විසි එකෙන් පැකේජ පහක වැඩ මේ වන විට භෞතිකව අවසන් කර ඇති අතර, පැකේජ හතක ඉදිකිරීම් කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත. එසේම ව්‍යාපෘතියෙහි තවත් ඉදිකිරීම් පැකේජ අටක, ඉදිකිරීම් 2022 වර්ෂය තුළ ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් ලංසු කැඳවීම් කටයුතු 2021 වර්ෂයේදි සිදු කරන ලදී. මේ අනුව ඉතිරි පැකේජයට අදාළ ලංසු කැඳවීම සහ ඉදිකිරීම් ආරම්භය 2022 වර්ෂයේ දි සිදු කිරීමට සැලසුම් කර ඇත.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලස්ථායි වැඩ සංරචකයෙහි 97.02%කට වැඩි සහ පහළ නිම්න සංවර්ධන කටයුතු වල 65%ක භෞතික ප්‍රගතියක් හා 93.82%ක සමස්ථ ප්‍රගතියක් 2021 අවසන් වන විට ලභා කර ගෙන තිබේ. ව්‍යාපෘතියේ කෘෂිකාර්මික, පානීය ජල සහ විදුලිබල උත්පාදන ප්‍රතිලාභ 2022 වසරේ මැද භාගය වන විට රටට ලබා දීමට සැලසුම් කර ඇත.

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ අවසන් කිරීමට ලැබීම අප ලැබූ ජයග්‍රහණයකි. මෙම ව්‍යාපෘතිය යටතේ විස්තරාත්මක ද්‍රෝණි අධ්‍යයනයක් සිදු කරන ලද අතර, ඒ යටතේ කැළණි ගඟ, අත්තනගලු ඔය, ගිං ගඟ, නිල්වලා ගඟ, මල්වතු ඔය, මහ ඔය, දැදුරු ඔය, කලා ඔය සහ ගල් ඔය ද්‍රෝණි සඳහා ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කරන ලදී. මෙහිදී දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන දීර්ඝ කාලීන අධි බලපෑම් අවම කිරීමෙහි ලා වන විභව්‍ය විකල්ප හඳුනා ගන්නා ලද අතර, ජල විද්‍යාවේ සහ ද්‍රෝණි නිරූපනයෙහි නව තාක්ෂණික ප්‍රගමණයන් සම්බන්ධව අත්දැකීම් ලැබෙන පරිදි ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්හි අදාළ කාර්ය මණ්ඩල පුහුණු කිරීම සිදු කරන ලදී.

මහා වාරිමාර්ග ව්‍යාපෘතීන්ට පමණක් සීමා නොවී, අපේ වාරි ශිෂ්ඨාචාරය තුළ ඉතා වැදගත් සංරචකයක් වන ග්‍රාමීය වැව් පද්ධතීන් සංවර්ධනය කෙරෙහි ද අමාත්‍යාංශයේ අවධානය යොමු කර ඇත. වයඹ පළාත් ඇළ සහ උතුරු මැද පළාත් ඇළ මඟින් කුඩා වැව් එල්ලංගාවන්ට ජලය ලබා දීමට සැලසුම් කර ඇත. මීට අමතරව දේශගුණික ප්‍රතිවිරෝධී ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය හෙවත් වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය හරහා ප්‍රධාන ගංඟා ද්‍රෝණි තුනක සහ කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, වවුනියාව, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ග්‍රාමීය වැව් 300ක් පමණ පුනරුත්ථාපනය කිරීම මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. 2021 වර්ෂය අවසන් වන විට ග්‍රාමීය වාරි පද්ධති 137ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර වාරි පද්ධති 84ක පුනරුත්ථාපන කටයුතු සිදු වෙමින් පවතී.

එසේම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ඇති වාරි ව්‍යාපාර රැසක දෙකන්නය වගා කිරීම සඳහා අවශ්‍ය ජලය සාර්ථක ලෙස කළමනාකරණය කර ගැනීමට 2021 වර්ෂය තුළ ද හැකිව ඇත.

වාරි කළමනාකරණ අංශය මඟින් ක්‍රියාවට නැංවූ මහා වාරිමාර්ග ව්‍යාපාර වල ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන් මඟින් ගොවි සංවිධාන ශක්තිමත් කිරීම තුළින් ප්‍රජාව සවිබල ගැන්වීමත්, ගොවීන් දැනුවත් කිරීම මත නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීමත් සඳහා කළ විවිධ වැඩසටහන් ද 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී.

2021 මූල්‍ය වර්ෂයේ සිට ඇරඹෙන ඉදිරි පස් වසර තුළ "වාරි සෞභාග්‍යා" ජාතික වැඩසටහනට අනුකූලව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ග්‍රාමීය වැව් සහ අමුණු 5,000ක පමණ පුනරුත්ථාපන කාර්යයන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව 2021 වර්ෂය තුළදී වැව් 1,000ක් ප්‍රතිසංස්කරණය කිරීමට මූලිකව ඉලක්ක කළ ද වැව් 1,423ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ අතර, 2021 වර්ෂය තුළ එයින් වැව් 757ක ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කරන ලදී.

ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සහ කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිවල ඉදිකිරීම් දැනටමත් ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉටු කර ගැනීම සඳහා සාකච්ඡා කිරීම 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතය.

ඉඩම් හෙක්ටයාර 1,057 අලුතින් වගා කිරීමට ද, දැනට පවතින වගා හෙක්ටයාර 12,420කට ජලය ලබාදීමට ද, වවුනියා, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට සහ වාර්ෂිකව ගිගාවොට් පැය 4.68 විදුලිබල සැපයුමක් නිපදවීම වෙනුවෙන් ආරම්භ කරන ලද පහළ මල්වතු ඔය බහුකාර්ය ව්‍යාපෘතියෙහි වේල්ලේ ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, ජලාශයේ පිටවානෙහි සහ විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

රටේ සියලු වේලිවල ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා, වේලි ආරක්ෂණ උපදේශන මධ්‍යස්ථානය සහ වේලි ආරක්ෂණ නියාමන යාන්ත්‍රණය ස්ථාපනය කිරීම පිළිබඳ වන අමාත්‍ය මණ්ඩල සංදේශය වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් 2020 වසරේ ඉදිරිපත් කරන ලද අතර ඊට අදාළව ලැබුණු නිරීක්ෂණ අනුව අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකාවේ පොදු දියබෙත්ම කළමනාකරණ ප්‍රවේශයක් ඇති කිරීම සඳහා වන උපායමාර්ගික යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා පත් කළ කමිටු වාර්තාව අනුව අදාළ ඉදිරි කටයුතු 2022 වසරේ දී සිදු කිරීමට නියමිතය.

වාරිමාර්ග ආඥාපනත සංශෝධනය කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර, ඊට අදාළ ඉදිරි කටයුතු 2022 වසරේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත.

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගතකොට දැක්විය හැකිවේ.

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 160,356 (US$ 976 Mn)	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ, නුවර, කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීව්‍රතාවය**	උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය ඝන මීටර මිලියන 191 වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - හෙක්ටයාර් 13,000 උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - හෙක්ටයාර් - 12,300 මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - හෙක්ටයාර් 7,500
ව්‍යාපෘති කාලය	2015 - 2024	**ප්‍රතිලාභීන්**	<u>අදියර 1</u> වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය – 300,000 උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 700,000 මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 62,000
ප්‍රතිපාදන 2021	රු.මි. 14,098	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 20,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36,270	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	29% (දැනට ක්‍රියාත්මක වන උප ව්‍යාපෘති 12ක් පදනම් කරගෙන ව්‍යාපෘති ප්‍රගතිය ගණනය කර ඇත)
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 12,280.00		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	➢ මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් පැකේජයන් වන MLBCR – NCB - 1 (ප්‍රධාන ඇළේ කි.මී 0.0 සිට කි.මී 30 +140 දක්වා), NCB - 2 (ප්‍රධාන ඇළේ කි.මී. 30+140 සිට කි.මී. 49+820 දක්වා) සහ NCB - 3 (ප්‍රධාන ඇළේ කි.මී. 49+820 සිට කි.මී. 63+650 දක්වා) කොන්ත්‍රාත් පැකේජයන්හි වැඩ අවසන් කර ඇත. ➢ වෑමැඩිල්ල වම් ඉවුරු ඇළ නැබඩගහවත්ත දක්වා වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 සිට කි.මී. 5+250) සහ නව වාන් ඇළ ඉදිකිරීම (කි.මී. 0+000 සිට කි.මී. 0+600) NWPC-NCB-1 භෞතිකව නිමකිරීමට ආසන්න මට්ටමේ පවතී (සමුච්චිත භෞතික ප්‍රගතිය 98%). ➢ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත් පැකේජවල 2021 දෙසැම්බර් 31 වන විට භෞතික ප්‍රගතිය පහත පරිදි වේ, - MLBCR - ICB 1 - වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ එසවීම - 22% - වෑමැඩිල්ල වම් ඉවුරු ඇළ නැබඩගහවත්ත දක්වා වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 සිට කි.මී. 5+250) සහ නව වාන් ඇළ ඉදිකිරීම (කි.මී. 0+000 සිට කි.මී. 0+600) – 6%		

	- වයඹ පළාත් ඇළෙහි NWPCP-ICB-2 නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම (කි.මී. 5+250 සිට කි.මී. 22+300) -21% - NWPCP-ICB-1 මහකිතුල පිවිසුම් උමඟ, මහකිතුල, මහකිරුළ ජලාශ හා මහකිතුල, මහකිරුළ යා කෙරෙන පෝෂක ඇළ මාර්ගය ඉදිකිරීම. - 3.1% - ICB/01 - මොරගහකන්ද ජලාශයේ සිට කි.මී. 6.225 ඇළ කොටස ඉදිකිරීම (කි.මී. 0+100 සිට 03+980) -1% - ICB/2B - කළු ගඟ / මොරගහකන්ද යා කරන කි.මී. 8.8 උමඟ ඉදිකිරීම (කි.මී 0+100 සිට 08+830 km) -19% - ICB/2A- ඇළෙහි කි.මී. 27+509 සිට කි.මී. 55+600 දක්වා උමඟ ඉදිකිරීම - 5.2 %
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	➢ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ අදියර 1 අවසන් වීමෙන් පසු ආසන්න වශයෙන් ප්‍රතිලාභී පවුල් 265,500ක ගේ පමණ පානීය ජල අවශ්‍යතාවයන් සපුරාලීමට හැකි වනු ඇත.(NWPCP - ප්‍රතිලාභී පවුල් 75,000, MLBCRP ප්‍රතිලාභී පවුල් 15,500 සහ NCPCP- ප්‍රතිලාභී පවුල් 175,000කි.) ➢ ඉහත ආකාරයට පානීය ජලය සපයා වත්මන් වකුගඩු රෝගය පිළිබඳ ගැටලුවට පිළියම් යෙදීම ➢ මීටර් 3.5කින් මිණිපේ අමුණ එසවීම තුළින් එහි ඉහළ කොටසෙහි ජලය රඳවා ගැනීමට හැකි වීමෙන් වාර්ෂිකව ගිගාවොට් පැය 9ක ධාරිතාවයකින් යුත් අමතර විදුලිබල උත්පාදනය කිරීමට හැකිවීම. ➢ ව්‍යාපෘති ප්‍රදේශයට අයත් ගම්මානයන්හි අත්පත් කරගත් ඉඩම් සඳහා රජය විසින් අනුමත කරන ලද ඉතා ආකර්ශනීය සහ සාධාරණ වන්දි පැකේජ මගින් ප්‍රජාවට ප්‍රතිලාභ ලබා දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මේ දක්වා ව්‍යාපෘති හේතුවෙන් විපතට පත් පුද්ගලයින් 580 දෙනෙකුට රුපියල් මිලියන 600ක වන්දි මුදලක් හිමි විය. මෙම වසර තුළ නව කොන්ත්‍රාත් පැකේජ 9ක් ආරම්භ කිරීමට පෙර ඉඩම් කැබලි 3,000කට වැඩි ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට ඇස්තමේන්තු කර ඇත. ➢ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන හානිය අවම කර ගැනීම සඳහා හෙක්ටයාර් 600ක භූමි ප්‍රමාණයක් නැවත වන වගාව යටතට ගැනෙන අතර මේ වන විට හෙක්ටයාර් 70ක ප්‍රමාණයක නැවත වන වගාව අවසන් කර ඇත. ➢ වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන වැව් හතකට සහ කුඩා වැව් 350කට ජලය සැපයීම. ➢ අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනයට දායක වීම ➢ දේශගුණික විපර්යාස නිසා ඇතිවන සංකූලතා අවම කිරීම ➢ ව්‍යාපෘති අයත් ප්‍රදේශයන්ගේ භූගත ජලය වැඩිදියුණු කිරීම සහ ගෙවතු වගාව වැඩිදියුණු කිරීම. ➢ මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම.

2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 98,361.7	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල, මොණරාගල සහ හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව (EDBI)	**ජලාශ ධාරිතාව**	• පුහුල්පොල වේල්ල - ඝන මීටර මිලියන 0.6 • ඩයරබා ජලාශය - ඝන මීටර මිලියන 0.9 • අලිකොට ආර ජලාශය - ඝන මීටර මිලියන 6.5 • කුඩාඔය ජලාශය - ඝන මීටර මිලියන 29.0 • හඳපානාගල ජලාශයේ ධාරිතාව ඝන මීටර මිලියන 6.5 සිට ඝන මීටර මිලියන 14 දක්වා වැඩි කිරීම දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1,500ක් සහ අලුතින් සංවර්ධනය කළ ඉඩම් හෙක්ටයාර 4,500ක් සමඟ මුළු හෙක්ටයාර් 6,000ක වගා ඉඩම්
ව්‍යාපෘති කාලය	**මූලස්ථායී වැඩ** - 2010 මාර්තු – 2022 මැයි **පහළ නිම්න සංවර්ධන** - 2013 සැප්තැම්බර් - 2022 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	ව්‍යාපෘතියේ පහළ නිම්න සංවර්ධනය මඟින් සෘජුව පවුල් 6,000කට ප්‍රතිලාභ අත්වෙන අතර, විදුලි බල උත්පාදනය මඟින් ගි.වො.පැය 290ක වාර්ෂිකව ජාතික විදුලි බල පද්ධතියට එක්වෙන බැවින් සමස්ථ ජනතාවටම සෙත සැලසේ.
ප්‍රතිපාදන 2021	රු.මි. 6,000	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 5,100 (මූලස්ථායී වැඩ)
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 84,068.87	**සමස්ථ භෞතික ප්‍රගතිය**	93.82%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 5,392.85		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	මූලස්ථායී වැඩ • පුහුල්පොල වේල්ල - 99.09% • ඩයරබා ජලාශය - 94.57% • සම්බන්ධිත උමඟ - 99.16% • පෙරආර උමඟ - 98.59% • කැලඹුම් කුළුණ සහ කැලඹුම් ලිඳ - 95.48% • තිරස් පීඩන කුළුණ - 98.27%		

	• බලාගාරය - 95.86% • ප්‍රධාන පිවිසුම් උමඟ සහ අනෙකුත් පිවිසුම් උමං - 97.78% • ස්විච් අංගනය - 89.41% • ප්‍රවේශ මාර්ගය සහ විකල්ප මාර්ග - 88.94% • විදුලි සම්ප්‍රේෂණ මග - 94.98% • පසු ආර උමඟ - 99.39%
	පහළ නිම්න සංවර්ධන පහළ නිම්න සංවර්ධන කටයුතුවලට අදාල විෂය පථය සහ පිරිවැය පහත පරිදි වෙනස් වී ඇත. ඒ අනුව භෞතික ප්‍රගතිය ද සංශෝධනය කර ඇත. 1. අලිකොට ආර ජලාශයේ පහල පිටවාන යෝජනා කර ඇත. 2. හඳපානාගල වැව ආශ්‍රිතව මාර්ග පද්ධති ඉදිකිරීම් සහ වනජීවී ඒකක කාර්යාලයක් ඉදිකිරීමට නියමිතය. 3. වාරි ජලය සැපයිය හැකි නව ප්‍රදේශ හඳනාගැනීමෙන් පසු හඳපානාගල ජලාශය ආශ්‍රිතව අමතර D ඇළ මාර්ග ඉදිකිරීම ඇතුලත් කර ඇත. 4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු අලිකොට ආර - කුඩාඔය හැරවුම් ඇළ මාර්ග වල දිග වැඩි කරන ලදී. 5. වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය ලද පසු කුඩාඔය - සිංහලයාගම හැරවුම් ඇළ මාර්ග පද්ධතියේ දිග වැඩි වී ඇත. 6. ග්‍රාමීය වැව් සංවර්ධන සංරචකය සඳහා කුඩා වැව් 25ක් අලුතින් එක් වී ඇත. ඒ අනුව කරගෙන යන ලද පහළ නිම්න සංවර්ධන කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මෙම වසර තුළ ක්‍රියාත්මක කරගෙන යනු ලබයි.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගිනිකොන දිග වියළි කලාපයේ ජල හිඟය සමනය කිරීම සඳහා උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව අතිරික්ත ජලය ඝන මීටර මිලියන 145ක් උමාඔය ද්‍රෝණියේ ජල පරිහරණය කරන්නන් හා පරිසරයට බලපෑම් නොකර හරවා යැවීමයි. • මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටයාර 4,500කට ආසන්න ප්‍රමාණයක් සහ දැනට පවතින කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 1,500කට පමණ වාරි ජලය සැපයීම. • මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය හා කාර්මික ජල අවශ්‍යතා සඳහා ඝන මීටර මිලියන 30ක් ලබාදීම. • මෙගාවොට් 120ක ධාරිතාවයකින් යුත් භූගත විදුලි බලාගාරය මගින් වාර්ෂිකව ජාතික විදුලිබල පද්ධතියට ගිගාවොට් පැය 290ක විදුලි බලයක් එක් කරයි. • බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රදේශයට ඩයරබා ජලාශයෙන් සහ ඇටම්පිටිය ප්‍රදේශයට පුහුල්පොල ජලාශයෙන් පානීය ජලය ලබාදීම. • මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවලට පානීය ජලය අලිකොටආර ජලාශයෙන් ලබාදීම.

3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 117,700	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මාතලේ සහ කුරුණෑගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය, සංවර්ධනය සඳහා සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල, අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල	**ජලාශ ධාරිතාව**	මොරගහකන්ද - ඝන මීටර මිලියන 570 කළුගඟ - ඝන මීටර මිලියන 250
ව්‍යාපෘති කාලය	2007 – 2022	**ප්‍රතිලාභීන්**	කළුගඟ - 3,419 මැදිරිගිරිය - 650
2021 සඳහා ප්‍රතිපාදන	රු.මි. 8,455.00	**2022 සඳහා ප්‍රතිපාදන**	රු.මි. 3,600.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 113,448.68	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	98.34%
මූල්‍ය ප්‍රගතිය 2021	රු.මි. 4,668.00		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් අවසන්ව ඇත. • විදුලි බලාගාරය ක්‍රියාත්මක වෙමින් පවතී. • කළු ගහ ජලාශයේ ඉදිකිරීම් අවසන් කර ඇත. • ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු 98.5%ක ප්‍රගතියක් අත්පත් කර ඇත. • පහළ නිම්න සංවර්ධන කටයුතු 94.25%ක ප්‍රගතියක් අත්පත් කර ඇත. • පාරිසරික බලපෑම් අවම කිරීමේ කටයුතුවල ප්‍රගතිය 98.5 % • සංචාරක බංගලාව සහ තොරතුරු කේන්ද්‍රය වැඩ කටයුතු සම්පූර්ණ කර ඇත.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඝන මීටර මිලියන 557ක ධාරිතාවයෙන් යුතු මොරගහකන්ද ජලාශය • ඝන මීටර මිලියන 248ක ධාරිතාවයෙන් යුතු කළුගඟ ජලාශය • **විදුලි උත්පාදනය** - වසරකට ගිගාවොට් පැය 114.5ක ජල විදුලි නිෂ්පාදනයක් සිදු කිරීමට අපේක්ෂිතය. එමඟින් වාර්ෂිකව ඉන්ධන සඳහා පිරිවැය රු.මි. 1,545 ඉතිරිවේ.		

- පොදු පරිහරණය සඳහා ගොඩනැගිලි 465
- කි.මී. 276කින් යුත් මාර්ග පද්ධතිය
- කි.මී. 330කින් යුත් ඇළ මාර්ග පද්ධතිය
- කුඩා වැව් 11ක් ස්ථාපිත කිරීම
- සුළු වැව් 20ක් ස්ථාපිත කිරීම

- **කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 5,000ක අමතර බිම් ප්‍රමාණයක් එක්වීම**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ දැනට 100% සිට 154% පමණ වන වගා තීව්‍රතාව 181% දක්වා ඉහළ යනු ඇත. හෙක්ටයාරයකට වී අස්වැන්න වැඩි කිරීම ඇතුළු සෘජු ප්‍රතිලාභ මඟින් වාර්ෂිකව ටොන් 123,000ක අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබා දෙනු ඇත. එමඟින් ලැබෙන වාර්ෂික ශුද්ධ කෘෂිකාර්මික ප්‍රතිලාභ රු.මී. 4,000ක් ලෙස ගණනය කර ඇත.

- මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවලට පානීය හා කාර්මික ජල පහසුකම් සැපයීම.

- **මිරිදිය ධීවර කර්මාන්තය -** සාමාන්‍ය මත්ස්‍ය නිෂ්පාදන විභවය වසරකට ටොන් 4,700ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර වාර්ෂික ශුද්ධ ප්‍රතිලාභය රු.මී. 940කි.

- **රැකියා අවස්ථා වැඩි කිරීම -** පුද්ගලයින් 650ක් සෘජුවම ව්‍යාපෘතියට බඳවා ගනු ලැබේ. මැණික් හා ස්වර්ණාභරණ, හෝටල් කළමනාකරණ හා ස්වයං රැකියා පුහුණු ආදිය පැවැත්වීමෙන්/ සංවිධානය කිරීමෙන් වැඩි තරුණ තරුණියන් පුහුණු කරනු ලැබේ.

- **පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම -** වස්ගමුව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය සහ රිවර්ස්ටන් ආදිය සංවර්ධනය කිරීමෙන් පරිසර සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම.

- **ගංවතුර පාලනය -** සෝමාවතිය සහ මනම්පිටිය ප්‍රදේශවල ඇති වූ ගංවතුර හානි පාලනය කිරීම

4. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP)

ව්‍යාපෘතියේ මුළු ආයෝජනය	ඇ.ඩො.මි. 152 = රු.මි. 24,547	**ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක**	ගම්පහ, කොළඹ, කළුතර, කෑගල්ල, රත්නපුර, අනුරාධපුර, පුත්තලම, පොළොන්නරුව, කුරුණෑගල, ත්‍රිකුණාමලය, අම්පාර, මඩකළපුව, මොණරාගල, බදුල්ල, නුවර, නුවරඑළිය, මාතලේ, වව්නියා, මුලතිව්, මන්නාරම, හම්බන්තොට, ගාල්ල සහ මාතර
මුල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකුව - ජාත්‍යන්තර සහයෝගිතාවය	**ප්‍රතිලාභ ලබන ප්‍රදේශ/ ප්‍රතිලාභීන්**	• ඇළ මාර්ග වැඩිදියුණු කිරීම - පුද්ගලයින් 1,784,543 • ගංවතුර සහ නියඟයෙන් ආරක්ෂා වූ ප්‍රදේශය - වගාබිම් හෙක්ටයාර 134,543 • කාලගුණික තත්ත්ව නිසා ගමනාගමන බාධාවීම් වලින් ආරක්ෂා වූ පුද්ගලයින් 1,650,000 • නායයාම් වලින් ආරක්ෂා වූ පාසල් - 18, පාසල් ළමුන් - 29,000 • මාර්ගවල අඛණ්ඩ ප්‍රවාහනය තහවුරු කිරීම - ප්‍රතිලාභීන් 72,000
ව්‍යාපෘති කාලය	2014 අගෝස්තු 05 - 2021 අප්‍රේල් 30	**2022 සඳහා ප්‍රතිපාදන**	ව්‍යාපෘතිය 2021 අප්‍රේල් 30වන දිනෙන් අවසන්ව ඇත.
2021 සඳහා ප්‍රතිපාදන (රු.මි.)	මූලික ව්‍යාපෘතිය : 2385.00 අතිරේක මුල්‍ය : 1645.00	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100%
සමුච්චිත මුල්‍ය ප්‍රගතිය	මූලික ව්‍යාපෘතිය : රු.මි. 16,715.67 අතිරේක මුල්‍ය : රු.මි. 6,946.31		
2021 මුල්‍ය ප්‍රගතිය	මූලික ව්‍යාපෘතිය : රු.මි. 2, 349.67 අතිරේක මුල්‍ය : රු.මි. 1,294.69		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ගංගා ද්‍රෝණි 4ක් සඳහා ගංගා ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කිරීම • පහත ශක්‍යතා අධ්‍යන කටයුතු අවසන් කර ඇත. අ) ගම්පහ සහ ජාඇල නගර වල ගංවතුර පාලනය ආ) අනුරාධපුර නගරයේ ගංවතුර පාලනය පිළිබඳ ශක්‍යතා අධ්‍යනය ඇ) කන්දේකඩුව අමුණ ඉදිකිරීම පිළිබඳව ශක්‍යතා අධ්‍යනයය ඈ) වී ඔය බහුකාර්ය ජලාශය ඉදිකිරීමේ ශක්‍යතා අධ්‍යනය ඉ) අඹතලේ - salinity barrier සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම ඊ) මුන්දෙනිආරු ගංවතුර පාලනය සඳහා ශක්‍යතා අධ්‍යනය		

	• වාරිමාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම - වාරිමාර්ග දෙපාර්තුමේන්තුව මඟින් ඉදිකිරීම් පැකේජ 54ක් සම්පූර්ණ කිරීම - මහවැලි අධිකාරිය මඟින් ඉදිකිරීම් පැකේජ 4ක් සම්පුර්ණ කිරීම • අඛණ්ඩ ප්‍රවාහන සේවාවන් තහවුරු කිරීම: 1) සපත්තු පාලම් සහ කුඩා පාලම් වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නව පාලම් 11ක් ඉදිකිරීම සම්පුර්ණ කිරීම. 2) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පැකේජ 3ක් සම්පුර්ණ කරමින් අනාරක්ෂිත බෑවුම් පිහිටි ස්ථාන ස්ථායි කිරීම මඟින් නායයාම් වලක්වාලීම (නුවර - මහියංගනය මාර්ගය, හක්ගල). 3) උඟව මාර්ග සංවර්ධන අධිකාරිය පැකේජ 4ක් ක්‍රියාත්මක කරමින් අනාරක්ෂිත බෑවුම් ස්ථායි කිරීම. 4) අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර සංරචකය යටතේ පැකේජ 6ක් සම්පූර්ණ කරන ලදී.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කැළණි, අත්තනගලු, ගිං, නිල්වලා, මල්වතු ඔය, මහවැලි, කලා ඔය, දැදුරු ඔය, මහා ඔය සහ ගල් ඔය ගංගා ද්‍රෝණි 10 සඳහා ආයෝජන සැලසුම් සංවර්ධනය කිරීම. • ශක්‍යතා අධ්‍යන 4 ක්‍රියාත්මක කිරීම (අ) ජා ඇළ සහ ගම්පහ නගර ගංවතුරෙන් ආරක්ෂා කිරීම, (ආ) වී ඔය බහුකාර්ය ජලාශය ඉදිකිරීම, (ඇ) අනුරාධපුර ගංවතුර පාලනය, (ඈ) කන්දේකඩුව හැරවුම් ව්‍යුහය • ගංවතුර සහ නියං තත්ත්වයන් නිසා වාර්ෂික බෝග හානිවීම් වලින් හෙක්ටයාර 134,543 භූමි ප්‍රමාණයක් ආරක්ෂා වීම. • කි.මී 1,079ක දිගින් යුතු වාරි බෙදාහැරුම් ඇළ මාර්ග වැඩිදියුණු වීම. • කි.මී 101 කාණු ඇළ මාර්ග වැඩිදියුණු වීම. • කි.මී 66ක් වාන් ඇළ මාර්ග වැඩිදියුණු වීම. • කි.මී 32ක් දිග ගංවතුර පාලන බැම්ම ඉදිවීම. • කුඩා පාලම් සහ බෝක්කු 618ක් සහ ව්‍යුහ (ගේට්ටු, වාන් දොරටු, ජල පාලක ආදි) 1,055ක් ඉදිවීම. • මාර්ග කි.මී. 1,169ක ප්‍රවාහන අඛණ්ඩතාව සුරක්ෂිතවීම මඟින් මිනිසුන් 1,650,000 ආරක්ෂා වීම. • ස්ථාන 22ක් නායයාම් වලින් ආරක්ෂාවීම. • සපත්තු පාලම් සහ කුඩා පාලම් වෙනුවට නව පාලම් 39ක් ඉදිකිරීම තුළින් ගංවතුර නිසා ප්‍රවාහනයට ඇතිවන බාධා අවම කිරීම.

5. ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP)

ඇස්තමේන්තුගත පිරිවැය	රු.මි. 18,500	**ප්‍රතිලාභී දිස්ත්‍රික්ක**	අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, මහනුවර, කුරුණෑගල, මන්නාරම, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වව්නියාව
අරමුදල් ප්‍රභවය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව**	ව්‍යාපෘතියේ විෂය පථය : ව්‍යාපෘතියේ සංරචකයන් 04 වන 1.වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපන සංරචකය (IIRC) 2.ගොවිපල සංවර්ධන සංරචකය (OFDC) 3.කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමේ සංරචකය (APIC) 4.වාරි කළමනාකරණ සඳහා හැකියාවන් හා ධාරිතාවන් වැඩි කිරීමේ සංරචකය (ICTMC) යනාදිය මඟින් ඇති කරනු ලබන භූමියේ ඵලදායිතාව, ජලයේ ඵලදායිතාව හා බෝග ඵලදායිතාව ඉහළ නැංවීමයි. මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 40ක හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර 40ක වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම මඟින් ගොවි ප්‍රජාවේ ආදායම ඉහළ නැංවීමත් එමගින් ව්‍යාපෘති ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමත් මෙම ව්‍යාපාරයේ අරමුණයි.
ව්‍යාපෘති කාලය	2017 - 2021*	**ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව**	98,000
ප්‍රතිපාදන 2021	රු.මි. 300.00	**ප්‍රතිපාදන 2022**	රු.මි. 450.00 (150.00 + 300.00)
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,628.13	**සමස්ථ භෞතික (%)**	12.16%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	163.59		

2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	වාරි යටිතල පහසුකම් පුනරුත්ථාපනය අඛණ්ඩව සිදුකිරීම, කමත් ඉදිකිරීම අඛණ්ඩව සිදුකිරීම, ගොවි ආර්ථිකය ඉහළනැංවීම, ඉහළ ගුණාත්මයෙන් යුතු වී බීජ නිෂ්පාදනය සහ කාබනික පොහොර නිෂ්පාදනය අම්පාර, අනුරාධපුර, බදුල්ල, කොළඹ, මඩකළපුව, නුවර, පුත්තලම, ත්‍රිකුණාමලය, ගාල්ල, හම්බන්තොට, කුරුණෑගල, මොණරාගල, පොළොන්නරුව සහ මන්නාරම වාරිමාර්ග අධ්‍යක්ෂ කලාප.
ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රතිලාභ	1. හෙක්ටයාර් 72,882 අයත් යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම මගින් ගොවිපවුල් 97,832ට සහන සැලසීම. 2. ප්‍රධාන ඇළ කි.මී. 110, බෙදුම් ඇළ කි.මී. 280, ක්ෂේත්‍ර ඇළ කි.මී. 480 ඇතුළත් ඇළ පද්ධති පුනරුත්ථාපනය. 3. කුඩා පාලම් සහ බෝක්කු ඇතුළත්ව ගොවිපල මාර්ග කි.මී. 320 සංවර්ධනය. 4. තෝරාගත් ව්‍යාපෘති 80ක වගා තීව්‍රතාවය 1.5 සිට 2.0 දක්වා ඉහළ නැංවීම. 5. තෝරාගත් ව්‍යාපෘති 80ක ජලමිනුම් පද්ධතියක්, මිනුම් උපකරණ, සන්නිවේදන උපකරණ සහ දත්ත සකසන උපකරණ සහිතව ස්ථාපනය කිරීම. 6. වාරි පද්ධති 25ක GIS සිතියම් ගත කිරීම, ගොවි වෙළඳපොල 2ක්, සහ වැඩිදියුණු කළ කමත් 50ක් සංවර්ධනය.
*වසර 2024 දක්වා දීර්ඝ කිරීමට ඉල්ලීම් කර ඇත.	

6. දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

ඇස්තමේන්තුගත මුදල	9,114.00 (රු. 175 = ඇ. ඩො.)	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය - සම මූල්‍ය දායකත්වය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	සුළු වාරි පද්ධති 325 හෙක්ටයාර 5,000
ව්‍යාපෘති කාලය	අවුරුදු 07 (2017 ජූනි - 2024 ජූනි)	**ප්‍රතිලාභීන්**	1,950,374
ප්‍රතිපාදන 2021	රු.මි. 1,500	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	2,100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	2,218.04 (MOI) 2,171.69 (UNDP) 4,389.73	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	49%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 908		

2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ග්‍රාමීය වාරි පද්ධති 83ක් ප්‍රතිසංස්කරණය කිරීම (සුළු වැව්/අමුණු) • දේශගුණික සුහුරු කෘෂිකාර්මික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම (අරමුදල් සම්පාදනයක් සිදු කරනු නොලැබුණි) • 2019 වසරේ අරම්භ කරන ලද පානීය ජල සම්පාදන පද්ධති 07ක (02ක් නිම කර බාර දීම) සහ උසස් තාක්ෂණයෙන් යුත් ජල පිරිපහදු පද්ධති 41ක (08ක් නිම කර බාර දීම) ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 325ක් වැඩි දියුණු කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් මඟින් සුළු වාරි පද්ධති වල වගා තීව්‍රතාවය වැඩි කිරීම (0.8 සිට 1.6 දක්වා) • දේශගුණයට ඔරොත්තු දෙන, විමධ්‍යගත ජල කළමනාකරණ විසඳුම් වන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම 11ක් පිහිටුවීම, වැඩි දියුණු කළ ජල පිරිපහදු පද්ධති 125ක් ස්ථාපනය සහ වැසි ජල රැස්කිරීමේ ටැංකි පද්ධති 4,000ක් ස්ථාපනය හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාවට වසර පුරා සුරක්ෂිත පානීය ජලය සැපයීම • ඵලදායි කාලගුණික තත්ත්ව අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම, කෘෂි කාලගුණ උපදේශන බෙදා හැරීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම මගින් ගංවතුර සහ නියඟයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ ඒ සඳහා අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම

7. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 32,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්කය**	බදුල්ල, මහනුවර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාවය/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 15.6 පවතින හෙක්ටයාර 810 නව හෙක්ටයාර 400 රන්ටැඹේට වර්ෂිකව ඝන මීටර මිලියන 40ක් මුදාහැරීම
ව්‍යාපෘති කාලය	අවුරුදු 04	**ප්‍රතිලාභීන්**	පවුල් 10,000
මූල්‍ය ප්‍රතිපාදන 2021	රු.මි. 400	**2022 වසර සඳහා මූල්‍ය ප්‍රතිපාදන**	රු.මි. 1,800
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 527.50	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	4%

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 377.50
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්	යටිතල පහසුකම් සංවර්ධනය, මැනුම් හා විමර්ශන, ඉඩම් අත්පත් කරගැනීම, ව්‍යාපෘති සැලසුම්
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• අඛණ්ඩ ජල සැපයුම - බත්මැඩිල්ල ව්‍යාපාරය හෙක්ටයාර 810ක්, නව ඉඩම් හෙක්ටයාර 400ක් සහ මිනිපේ වම් ඉවුරෙහි පවතින හෙක්ටයාර 800ක්. • විදුලි බල උත්පාදනය - තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව ගිගාවොට් පැය 52.6 සහ රන්ටැඹේ ආශ්‍රිතව ද අමතර විදුලි උත්පාදනයක් සිදුකළ හැක. • පවුල් 10,000කට පානීය ජලය සැපයීම • පාරිසරික සංවර්ධනය සහ සංචාරක කර්මාන්තය නංවාලීම • මිරිදිය මත්ස්‍ය කර්මාන්තය නංවාලීම • මහවැලි පද්ධතියට රොන්මඩ එකතුවීම පාලනය කිරීම • රන්ටැඹේට වාර්ෂිකව ඝන මීටර මිලියන 40ක් මුදාහැරීම • කන්දකැටිය හා ඌවපරණගම යාකරන මාර්ගයක් ඉදිකිරීම

8. පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 22,900.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, මන්නාරම හා වව්නියාව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව**	ඝන මීටර මිලියන 209
ව්‍යාපෘති කාලය	2016 - 2024	**ප්‍රතිලාභීන්**	අනුරාධපුර, මන්නාරම සහ වව්නියා දිස්ත්‍රික්ක වල ජීවත්වන ජනතාව
ප්‍රතිපාදන 2021	රු.මි. 325	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 3,700
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 446.7	**සමස්ථ භෞතික ප්‍රගතිය**	2.31 %
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 248.5		

2022 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ජලාශ බැම්මෙහි ඉදිකිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කැණීම් කටයුතු සිදුකිරීම (කි.මී. 3.6 ක ප්‍රමාණයෙන් කි.මී. 2.7ක්). • කැණීම් කළ ස්ථානයන්හි අවශ්‍ය භූ තාක්ෂණිකමය ප්‍රතිකර්මයන් සිදුකිරීම. (කි.මී. 3.6 ක ප්‍රමාණයෙන් කි.මී. 2.2ක්). • කැණීම් කරනු ලැබූ නියමිත මාර්ගය ප්‍රමිතියෙන් යුතු පස් යොදා නැවත පිරවීම. • ප්‍රධාන බැම්ම ඉදිකිරීම සඳහා භූමිය සකස් කිරීම (ගස්, පිහිටි පස සහ මඩ සහිත පස් ඉවත් කිරීම). • ඉංජිනේරුමය නිර්මාණ හා සැලසුම් කාර්යයන් සහ සැලසුම් පත්‍ර පිළියෙල කිරීම. • වැඩබිම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. • පස් ලබා ගන්නා භූමිය පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම. • තාවකාලික හා ස්ථිර කාර්මික වැඩපළ ඉදිකිරීම ආරම්භ කිරීම. • වම් ඉවුරු ඇළ මාර්ගයේ (6 Km) සහ දකුණු ඉවුරු ඇළ මාර්ගයේ (2Km) මැනුම් කටයුතු සිදුකිරීම • වම් ඉවුරු සහ දකුණු ඉවුරු සොරොව්ව සහ ඇළ මාර්ග සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකිරීම.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• අක්කර 1,052ක නව වගා බිම් සඳහා ජලය සැපයීම. • යෝධ වැව සහ අගතමුරිප්පු යන වැව් ආශ්‍රිතව වගා කරනු ලබන අක්කර 12,420ක ප්‍රදේශයකට ජලය සැපයීම . • වව්නියා, අනුරාධපුර සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වල ගෘහස්ථ හා පානීය ජල පහසුකම් සඳහා ඝනමීටර් මිලියන 27ක ධාරිතාවක් ලබාදීම. • වාර්ෂිකව ගිගාවොට් 4.68ක ධාරිතාවකින් යුතු විදුලි බලශක්තිය ජාතික විදුලි බල සැපයුමට ලබාදීම. • නව නගර සංවර්ධන යටතේ තන්තිරිමලේ ප්‍රදේශය සංවර්ධනය කිරීම. • වව්නියා සහ මන්නාරම දිස්ත්‍රික්කයන් හි ගංවතුර පාලනය. • සූර්යය බලශක්ති ව්‍යාපෘති හඳුන්වාදීම. • උස්සාන වාරිමාර්ග ව්‍යාපෘති හඳුන්වාදීම. • ව්‍යාපෘති කාලසීමාව තුළ නව රැකියා අවස්ථා උත්පාදනය. • මිරිදිය මත්ස්‍ය සහ ධීවර කටයුතු සංවර්ධනය. • ප්‍රතිවනරෝපණය. • වනාන්තර සහ වනජීවීන් සුරක්ෂිත කිරීම සහ වනජීවීන්ගේ සංචරණය සඳහා අවශ්‍ය භූමිය වෙන් කර දීම. • අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම. • ගොවිජන සේවා කටයුතු සහ ආයතනික සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීම.

9. ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 138,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගාල්ල, මාතර, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව**	ඝන මිලී මීටර් 0.3/0.16/11
ව්‍යාපෘති කාලය	අවුරුදු 06	**ප්‍රතිලාභීන්**	පවුල් 75,000 පමණ
ප්‍රතිපාදන 2021	රු.මි. 20	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 250
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 4,070	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	64.67% (අදියර 01)
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 15.95		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• ශක්‍යතා අධ්‍යයනය යාවත්කාලීන කිරීම • පාරිසරික බලපෑම් අධ්‍යයනය ආරම්භ කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාරි වපසරිය හෙක් 5,000 පවුල් 50,000 • පානීය/ කර්මාන්ත ජලය සැපයීම ඝන මිලී මීටර 122 • වාර්ෂිකව ගිගාවොට් පැය 65ක ජල විදුලි උත්පාදනය		

10. මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 5,613.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, මඩකලපුව, මන්නාරම, මොණරාගල, අම්පාර, යාපනය හම්බන්තොට, බදුල්ල සහ පුත්තලම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	නෙදර්ලන්තයේ රාබෝ බැංකුව සහ ශ්‍රී ලංකා රජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රිව්‍රතාවය**	මල්වතු ඔය, කුඹුක්කන් ඔය සහ මාදුරු ඔය ගංගා ද්‍රෝණි ප්‍රදේශ
ව්‍යාපෘති කාලය	2018 - 2022	**ප්‍රතිලාභීන්**	පොදු ජනතාව, තීරණ ගන්නා නිලධාරීන්, පර්යේෂකයින් සහ භූගත ජලය සම්බන්ධ පාර්ශවකරුවන්
ප්‍රතිපාදන 2021	රු.මි. 750	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 350 (ඉල්ලුම් කළ)
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	92%	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	92%

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	70.8%
2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	1. මූලික ක්ෂේත්‍ර පරීක්ෂණ 65ක් සිදු කිරීම. 2. පර්යේෂණ නල ළිං 12ක් ඉදිකිරීම. 3. පර්යේෂණ නල ළිං 19ක් සඳහා ආවරණ (well heads) ඉදිකිරීම. 4. පර්යේෂණ නල ළිං 103ක් සඳහා පර්යේෂණ උපකරණ සවි කිරීම. 5. අන්තර්ජාල දත්ත පද්ධතිය (web portal) වැඩිදියුණු කිරීම සහ පර්යේෂණ නල ළිං සඳහා නිමාන උපකරණ (monitoring equipment) සවි කිරීම පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන් පැවැත්වීම.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	තෝරාගත් ගංගා ද්‍රෝණි 03හි භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීම තුළින් එම ගංගා ද්‍රෝණිවල භූගත ජල කළමනාකරණය සිදු කිරීමේ ඉදිරි කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන භූගත ජලයේ ප්‍රමාණාත්මකතාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ තත්කාලීන දත්ත ලබාගැනීම.

11. නුවරඑළියේ බැරැක්තැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 230	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	නුවරඑළිය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 3,000 හෙක්ටයාර 800
ව්‍යාපෘති කාලය	2021 - 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 3,000
ප්‍රතිපාදන 2021	රු. මි. 100	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 45	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	26%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 45		
2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	1. අධික මුල් සහිත ජලජ වල් පැලෑටි උදුරා දැමීම සහ ඉවත් කිරීම 2. වැවේ ඇති රොන් මඩ කැණීම සහ ඉවත් කිරීම 3. පෝෂක ඇළෙහි රොන්මඩ ඉවත් කිරීම 4. රොන්මඩ උගුලක් (Silt trap) ඉදිකිරීම 5. වැව ආසන්නයේ තාවකාලික ප්‍රවේශ මාර්ග සකස් කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	1. හෙක්ටයාර 800කට සහ ගොවි පවුල් 3,500 වාරි ජලය සැපයීම 2. පවුල් 3,000කට පානීය ජලය සැපයීම		

12. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 14,199.43	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මුළු දිවයිනටම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකුව, ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 3,667 හෙක්ටයාර 159,571
ව්‍යාපෘති කාලය	වසර 05	**ප්‍රතිලාභීන්**	පවුල් 466,404
ප්‍රතිපාදන 2021	රු. මි. 651.38	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 3,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 2.170	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	0.5%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	47.29%		
2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	ප්‍රතිසංස්කරණ වැඩසටහන් පැකේජ 23කට අදාළ දැන්වීම් පලකර ඇත. මෙහි මූළික කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 3,148කි.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	ව්‍යාපෘතිය මගින් පහත පරිදි සෘජු ප්‍රතිලාභ ජනිතවනු ඇත. 1. වගා බිම් තුළ හා වගා බිම්වලින් බැහැරව සිදුකරන පාංශු හා ජල සංරක්ෂණ වැඩසටහන් මගින් ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයේ වෙසෙන පවුල් ආසන්න වශයෙන් 110,000 පමණ ප්‍රතිලාභ ලබයි. 2. තෝරාගත් වේලි 36කට අදාළව වේලි ආපදාවට ලක්වීමේ අවදානම අඩුවීම සහ ජල සම්පත් කළමනාකරණය හා ජල භාවිතයේ මෙහෙයුම් කාර්යක්මතාවය ඉහළ නැංවීම. 3. හානියට පත් ඇළ මාර්ග මගින් ජලය නාස්තිවීම අවම කිරීම හා වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව වැඩිදියණු කිරීම. 4. ප්‍රධාන ව්‍යාපෘති කාර්යන් තුළින් ප්‍රතිලාභ ලැබෙන බව තහවුරු කිරීම මගින් ව්‍යාපෘති කාර්යන් සඳහා තරුණ ප්‍රජාවගේ හා කාන්තාවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.		

13. කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 8,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	වව්නියාව, අනුරාධපුර සහ මුලතිව්
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව**	ඝන මීටර මිලියන 53.9 හෙක්ටයාර 2,400
ව්‍යාපෘති කාලය	වසර 04	**ප්‍රතිලාභීන්**	පවුල් 6,000
ප්‍රතිපාදන 2021	රු. මි. 250.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 2,500
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 28.00	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.7%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 28.00		
2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	මුලික භූ විද්‍යා අධ්‍යනය (95%), වේල්ල සඳහා මුලික අධ්‍යනය (90%), වේල්ල සැලසුම් කිරීම (100%), වේල්ලේ වාන නිර්මාණය (50%), සොරොව්ව සැලසුම් කිරීම (50%), ඉංජිනේරු කට්ටි ගැසීමේ සැලැස්ම (100%), පහළ නිමින ඇළ මාර්ග වල මිනුම් ගැනීම (50%)		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	වාරි ජල පහසුකම් නව ඉඩම් හෙක්ටෙයාර් 1,700ට ලබාදීම (වී වගාව සහ අතිරේක බෝග), පවුල් 10,000ක් සඳහා පානිය ජලය සැපයීම, භූගත ජල මට්ටම වර්ධනය කිරීම, ධීවර කර්මාන්තය, ගොවිපල් ආශ්‍රිත සත්ව නිෂ්පාදන සහ රැකියා අවස්ථා ඇති කිරීම.		

14. මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 38,500	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මඩකලපුව සහ අම්පාර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව**	ඝන මීටර මිලියන 18.4 හෙක්ටයාර 10,000
ව්‍යාපෘති කාලය	අවු. 10	**ප්‍රතිලාභීන්**	ගොවීන් - 4,500 ගොවීන් නොවන -1,000
ප්‍රතිපාදන 2021	රු. මි. 539.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 1,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 334	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	1.4%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 334		

2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	• ප්‍රධාන ඇලෙහි කි.මී 5.5ක් ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර, කි.මී 1.5ක පමණ වැඩ කටයුතු නිම කර ඇත. • ව්‍යාපෘතියට ඇතලු වන දම්මින්න මාර්ගයේ කි.මී 5.5ක් ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් කි.මී 2.5ක් ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත. • ගොඩනැගිලි 07ක් පමණ පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇති අතර කාර්යාලීය ගොඩනැගිල්ලෙහි 50%ක කටයුතු අවසන් කර ඇත.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාරිමාර්ග පහසුකම් සහ පානීය ජල පහසුකම් (අවශ්‍ය නිර්මිත ඉදිකිරීම මගින්) වැඩි දියුණු කිරීම • පාරිසරික සංවර්ධන කටයුතු හා යටිතල පහසුකම් සංවර්ධනය • පාරිසරික සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම • සත්ව පාලන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන කටයුතු

15. පැලවත්ත ලංකා සීනි සමාගමේ පර්යන්ත ප්‍රදේශ ජනාවාස භූමියෙහි වාරි සංවර්ධන සැලැස්ම

ඇස්තමේන්තුගත මුදල	රු. මි. 143.5	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය සහ පැල්වත්ත ලංකා සීනි සමාගම	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	මාන්කඩ වැව - අක්කර අඩි 80 තුන්මුල්ල වැව - අක්කර අඩි 250 මීපල වැව - අක්කර අඩි 150 වෙල්ලස්ස වැව - අක්කර අඩි 175
ව්‍යාපෘති කාලය	වසර 2 2021 - 2022	**ප්‍රතිලාභීන්**	පැලවත්ත වැවිලි කර්මාන්තය
ප්‍රතිපාදන 2021	රු. මි. 58	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු. මි. 75
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු. මි. 32	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	31 %
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු. මි. 32		
2021 වසර තුල ක්‍රියාත්මක කළ වැඩසටහන	මාන්කඩ වැව 100%, තුන්මුල්ල වැව 30%, මීපල වැව 30%		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	පැලවත්ත සීනී වගාව අශ්‍රිතව, ජල ධාරිතාව වැඩි කරගැනීම මඟින් උක් ඵලදාව වැඩි කරගැනීම.		

16. "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන

ව්‍යාපෘතිය	මුළු ඇස්තමේන්තුව (රු.මී.)	ව්‍යාපෘති කාලය	2021 වසර සඳහා ප්‍රතිපාදන	2021.12.31 දිනට ප්‍රගතිය	
				මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	භෞතික ප්‍රගතිය
මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වත්තේගෙදර වැව හා හිඹිලියාකඩ වැව ඉදි කිරීම	7,155	2021 - 2025	200	159.20	1.75%
අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ ගොවි ව්‍යාපාරවල ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම	630	2021 - 2023	100	57	72%
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෙඩිකච්චිය ප්‍රදේශයේ කිරිමැටිපිටිය හා රඹවැව දක්වා මින්නේරිය වැවේ සිට පෝෂක ඇළ ඉදිකිරීම	155	2021 – 2023	100	77.87	77%
අම්පාර දිස්ත්‍රික්කයේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්ගේකණ්ඩිය වැව ඉදි කිරීම	953.75	2021 - 2024	100	0.65	ප්‍රවේශ මාර්ග ඉදිකිරීම 5%
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පේරමඩු වැව වැඩි දියුණු කිරීම	118	2021 - 2023	100	19.53	68%
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාරඇල්ල ප්‍රදේශයේ කුමාර ඇළ අමුණ ඉදිකිරීම	23.05	2021	20	14.68	85%
පාන් ඔය හරහා (ත්‍රිකුණාමලය) අමුණක් සෑදීම	60	2021.09.01-2021.11.30	60	18.92	45%

වාරිමාර්ග කළමනාකරණ අංශය (IMD)

ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන (INMAS) ක්‍රියාත්මක කිරීම සඳහා 1984 වර්ෂයේ දී ආරම්භ කරන ලද වාරිමාර්ග කළමනාකරණ අංශය විසින් හෙක්ටයාර් 400ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54ක සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ දැක්ම වනුයේ ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම හා ස්වයං කළමනාකරණය සඳහා, ආත්ම විශ්වාසය පදනම් කරගත් වාරිමාර්ග ජනාවාස ආශ්‍රිත ශක්තිමත් ගොවි ප්‍රජාවක් බිහි කිරීමයි. ගොවි සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන ආයතන යන පාර්ශවයන්ගේ සහභාගිත්වය සහ දායකත්වය තුළින් මහා වාරිමාර්ග ව්‍යාපාර වල ජල ඒකකයක හා ඉඩම් ඒකකයක ඵලදායීතාවය ඉහළ නංවමින් ඒකාබද්ධ ජල කළමනාකරණය තුළින් ගොවි ජනතාවගේ තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

මහා වාරිමාර්ග බල ප්‍රදේශවල විධිමත් කළමනාකරණයක් හරහා නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීමේ අරමුණෙන් ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම හා සක්‍රීයව පවත්වාගෙන යාම, වාරිමාර්ග උප පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීම, කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකරණය, වාතාවරණය සැකසීම හා සම්බන්ධීකරණය තුළින් ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම මෙම අංශයේ වගකීම වේ.

1. දැක්ම
   ‘‘මහා වාරිමාර්ග ආශ්‍රිතව සෞභාග්‍යමත් ගොවි ප්‍රජවක් බිහි කිරීම’’

2. මෙහෙවර
   ‘‘සංවිධිත ගොවි ප්‍රජාවක් තුළින් සහ යෙදවුම් හා සේවා සැපයුම් ආයතන සම්බන්ධීකරණයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය හා වාරි ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නැංවීම’’

3. අරමුණු

   - වාරිමාර්ග ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් ලබන ආර්ථික වාසි උපරිම කිරීම
   - වාරිමාර්ග ජලය සාධාරණව හා සමානාත්මකව ගොවීන් අතර බෙදා ගැනීම සඳහා පහසුකරණය
   - වාරිමාර්ග ආශ්‍රිත සම්පත් කළමනාකරණයට ගොවීන් සහභාගී කර ගැනීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය සකස් කිරීම/ ශක්තිමත් කිරීම/ පවත්වාගෙන යාම
   - වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා පසුබිම සැකසීම හා පහසුකරණය
   - ප්‍රතිලාභීන් හා රජය මෙන්ම පෞද්ගලික ආයතන අතර මනා සම්බන්ධීකරණය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම
   - ගොවි ප්‍රජාවගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම තුළින් සුභවාදී ආකල්ප ඇති කිරීම
   - කෘෂිකාර්මික සහාය සේවාවන් ශක්තිමත් කිරීම
   - ගොවි පවුල්වල ආර්ථික හා සමාජ සංවර්ධනය

ප්‍රගතිය

ඉඩම් හා ඉඩම් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රගතිය

- ❖ ඉල්ලුම් කළ ප්‍රතිපාදන - රු. මිලියන 44.5
- ❖ ලැබුණු ප්‍රතිපාදන - රු. මිලියන 23.7
- ❖ වියදම - රු. මිලියන 13.917

මේ යටතේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා බල ගැන්වීම
- සහභාගීත්ව නඩත්තුව හා ජල කළමනාකරණ වැඩසටහන
- කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය කොත්මලේ (KITI)

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ 2012 වර්ෂයේදී ස්ථාපනය කරන ලද අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන ඉංජිනේරු සහකාරවරුන් සඳහා තුන් අවුරුදු වාරි තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබයි.

මීට අමතරව දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ නේවාසික පුහුණු පාඨමාලා පැවැත්වීමට ද මෙමඟින් සිදු කරයි.

මේ වන විට වාරිමාර්ග අමාත්‍යාංශය යටතට අයත් මෙම ආයතනය තෘතිය හා චතුර්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමන්ට අනුව NVQ 06 මට්ටමේ පූර්ණ කාලීන හා සේවාස්ථ පුහුණු පාඨමාලාවන් ද පවත්වමින් රටතුළ ඉහළ කීර්තිනාමයක් ගොඩනඟා ගෙන ඇත

1. දැක්ම
   ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය හා කුසලතා සංවර්ධනය සිදුකරන ආයතන අතර ප්‍රමුඛයා වීම

2. මෙහෙවර
   රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා වෙනස්වන තාක්ෂණික හා සමාජීය අවශ්‍යතාවයන්ට සරිලන ලෙස තරුණ ප්‍රජාවගේ දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම

3. ප්‍රධාන කාර්යයන්

i. තෘතිය හා චෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමයන්ට අනුව නිතිපතා පුහුණු පාඨමාලා පැවැත්වීම.
ii. වාර්ෂිකව ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම.
iii. විවිධත්වයෙන් යුතුව රටේ පවතින අවශ්‍යතාවයන් සපිරෙන පරිදි සේවාස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම.
iv. ඉදිරි වසර දෙක තුළ ISO 14001:2015ට අනුව පරිසර තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම.
v. සෑම වසරකම ඉදිකිරීම් හා ඉංජිනේරුමය කුසලතාවන් සංවර්ධනය වන පරිදි සේවාස්ථ පුහුණු පාඨමාලාවන් පැවැත්වීම.
vi. ඉදිරි වර්ෂ 03 තුළ ජල සම්පත් කළමනාකරණයට සමගාමී ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු, සමුළු පැවැත්වීම.
vii. පවතින අවශ්‍යතාවයන් සපුරාලීමට රාජ්‍ය හා පෞද්ගලික දෙපාර්ශවයේම සහභාගීත්වය යොදා ගැනීම.
viii. පුහුණුලාභීන් තුළ වෙළඳපොල හා සාමාජීය වශයෙන් සුදුසු විනය ගොඩනැගීම.

පුහුණු පාඨමාලා ප්‍රගතිය

2021 වර්ෂය

පවත්වන ලද වැඩසටහන් ගණන	-	35
පුහුණුලාභීන් ගණන	-	885

2022 වර්ෂය (අපේක්ෂිත)

පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් ගණන	-	56
අපේක්ෂිත පුහුණුලාභීන් ගණන	-	5,064

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL)

ක්‍රියාකාරකම්

(i) ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්ත්වය පවත්වාගෙන යාම සහ මෙහෙය වීම.

(ii) ඉංජිනේරු වෘත්තිකයන් එක් එක් කාණ්ඩ වල ලියාපදිංචි කිරීම.

(iii) ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය ඉහළ නැංවීමට අදාලව කටයුතු කිරීම.

ප්‍රගතිය

(i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව බඳවා ගැනීම.

(ii) 2021 වර්ෂය සඳහා ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කර ගැනීම.

- වරලත් ඉංජිනේරු
- ආශ්‍රිත ඉංජිනේරු
- අනුබද්ධ ඉංජිනේරු
- සංස්ථාගත ඉංජිනේරු
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරී

(iii) ඉංජිනේරු කාර්මිකයන් ලියාපදිංචි කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.

(iv) පනතට අනුව සුදුසු නීති සකස් කිරීම.

- ඉංජිනේරු වෘත්තිකයන් (විදේශ ඉංජිනේරුවන් ඇතුලුව) ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවේදයන් සකස් කිරීම.
- ඉංජිනේරු වෘත්තිකයන් සඳහා චර්යා ධර්ම පද්ධතියක් සකස් කිරීම.

(v) ඉහත (iv) සඳහා නීති ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙන අතර, මේ වන විට දෙවන සෝදුපත් පරීක්ෂාකර ඇත.

(vi) ඉංජිනේරුවන් රාජ්‍ය අංශයට බඳවා ගැනීමේ පටිපාටිය සඳහා ඉංජිනේරු සභාව පනතට අනුව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ඇත.

යෝජිත වැඩසටහන්

(i) ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම තවදුරටත් කරගෙන යෑම.

(ii) ඉංජිනේරු කාර්මිකයන් ලියාපදිංචි කර ගැනීම.

(iii) ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශික ඉංජිනේරුවන් ලියාපදිංචි කර ගැනීම.

(iv) ඉංජිනේරු සභාව පනතේ අනෙකුත් කරුණු තෘප්ත කිරීම සඳහා අවශ්‍ය නීති සහ රෙගුලාසි සකස් කිරීම.

(v) රාජ්‍ය සේවා අංශයේ ඉංජිනේරුවන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය චක්‍රලේඛන සැකසීම.

(vi) ඉංජිනේරු වෘත්තිකයන්ගේ කාර්යභාරය, වගකීම් සහ දක්ෂතාවන් අර්ථ දක්වා ප්‍රසිද්ධ කිරීම.

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (MCB)

මහවැලි උපදේශක සේවා කාර්යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් වසර 23ක පළපුරුද්දක් ඇති අතර, ශක්‍යතා අධ්‍යයන, සවිස්තරාත්මක සැලසුම්, පාරිසරික බලපෑම් තක්සේරු කිරීම්, සමාජ ආර්ථික සමීක්ෂණ සහ උපදේශන කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කරයි.

උපදේශන කටයුතු වලට අමතරව, වාරිමාර්ග අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය යනාදිය යටතේ මහවැලි උපදේශක කාර්යාංශය විශාල ඉදිකිරීම් ව්‍යාපෘති සිදුකර ඇත.

උපදේශන සේවා

ව්‍යාපෘතිය	ප්‍රගතිය
මාවනැල්ල යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව	60%
යෝජිත ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව	20%
මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල මුන්දෙනි ගංඟා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමාජ බලපෑම් ඇගයීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම	95%
තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සඳහා සමාජ ආර්ථික සමීක්ධණ සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම	90%
පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව	100%
කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව	100%

ඉදිකිරීම් අවසන් කර ඇති ව්‍යාපෘති

- හිඟුරක්ගොඩ සමෘද්ධි බැංකුව ඉදිකිරීම
- මැදිරිගිරිය වැව ඉදිකිරීම

මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

සුවිශේෂී ප්‍රමුඛතා

මහවැලි ගොවි කලාප වල වී, ධාන්‍ය, පලතුරු, එලවළු වගාවන් මිරිදිය මත්ස්‍ය කටයුතු හා කර්මාන්තය හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු.

මහවැලි කලාප ජනාවාස වල අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන වෙළඳපොළ හා ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය.

මහවැලි කලාප වල උපරිම කෘෂි නිෂ්පාදන කටයුතු සඳහා ඉඩම් උපයෝගීකරණය හා ආයෝජන පුළුල් කිරීම.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL)

1. දැක්ම

   තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය, පරිසර සංරක්ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිත කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම

2. මෙහෙවර

   මහවැලි ප්‍රජාව හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය දායක කර ගනිමින් නවීන තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදක හා තිරසාර කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා මෙහෙයවීම

3. අරමුණු

   i. ඒකාබද්ධ ජලය හා ඉඩම් සංවර්ධනය තුළින් අදායම් උත්පාදනය කිරීම.
   ii. ආහාර සුරක්ෂිතතාව සහ සමාජ සමෘද්ධිය සඳහා තිරසාර කෘෂිකාර්මික පද්ධතියක් ඇති කිරීම.
   iii. ව්‍යවසායකත්වය සහ ආර්ථික සංවර්ධනය තිරසාර කිරීම.
   iv. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ආර්ථික තත්ත්වයන් සහතික කරමින් ප්‍රජාවේ ජීවන ප්‍රමිතීන් සවිබල ගැන්වීම.
   v. මහවැලි ගංඟා ද්‍රෝණියේ සහ ඊට අනුබද්ධ ද්‍රෝණි සංරක්ෂණය හා කළමනාකරණය.

4. ප්‍රධාන කාර්යයන්

   i. ප්‍රධාන ජලාශ මෙහෙයුම් මධ්‍යස්ථානය මඟින් ජලාශයන්හි ජල මට්ටම් නියාමනය කිරීම හා ජලය බෙදා හැරීම, ගංවතුර පාලන කටයුතු සිදු කිරීම හා ගංගාධාර ප්‍රදේශ කළමනාකරණය ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම හා ජල සම්පත් කළමනාකරණය.
   ii. මතුපිට ජල ධාරිතාවය ඉහළ නැංවීම හරහා විදුලි බල නිෂ්පාදන, කෘෂි කර්මාන්ත, කර්මාන්ත, පානීය හා ගෘහස්ථ ජල අවශ්‍යතා සපුරාලීම.
   iii. ජාතික ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම (වී, අතිරේක බෝග, එළවළු, පලතුරු සහ කාලීන බෝග).
   iv. අපනයනාභිමුඛ ආනයන ආදේශන නිෂ්පාදන ප්‍රවර්ධනය තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම.
   v. දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ධීවර සහ සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය (දියර කිරි, බිත්තර, මිරිදිය හා විසිතුරු මත්ස්‍යයන්).
   vi. ඉඩම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා පුද්ගලික ආයෝජකයන් දිරිමත් කර නිෂ්පාදන කාර්යයට දායක කර ගැනීම හා භූ සම්පත් කළමනාකරණය තුළින් ආදායම් ඉපයීම.
   vii. මහවැලි ගොවි ජනතාවගේ බිමෙහි උරුමය තහවුරු කිරීම උදෙසා ඉඩම් ඔප්පු ලබා දීම.

viii. මහවැලි ගංගා ද්‍රෝණිය ඇතුළු මහවැලි සංවර්ධන බල ප්‍රදේශයේ ජෛව විවිධත්වය ආරක්ෂා කරමින් තිරසර පරිසර සංරක්ෂණය.

ix. මහවැලි කලාප තුළ භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා නැංවීම.

x. ඉහළ නිම්න ප්‍රධාන ජලාශ හා පහළ නිම්නයේ වාරි පද්ධතිය නඩත්තු හා මෙහෙයුම්.

xi. ප්‍රධාන මාර්ග, ග්‍රාමීය ප්‍රවේශ මාර්ග ඇතුළු කලාපීය මාර්ග පද්ධතිය නඩත්තු කිරීම.

xii. පුනර්ජනනීය බල ශක්ති ප්‍රභවයන් මඟින් විදුලි බලය ජනනය කොට ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීම.

xiii. දෙස් විදෙස් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා පහසුකම් සැපයීම (සංචාරක බංගලා, හෙළ බොජුන් හල්, බෝට්ටු සේවා, ජලය මත ගොඩ බස්සන ගුවන් යානා, සෆාරි ජීප් රථ).

xiv. මහවැලි බල ප්‍රදේශ වල ක්‍රියාත්මක ගොවි සංවිධාන හා කාන්තා කුඩා කණ්ඩායම් සවි බල ගැන්වීම, මහවැලි තාරුණ්‍ය පුහුණු කොට රැකියා ගත කිරීම.

xv. මහවැලි ගොවි දුවා දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය ජාතික මට්ටමට රැගෙන ඒම, කලා හා සංස්කෘතික හැකියාවන් ඔප නැංවීම.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදුකරන සංවර්ධන කටයුතු

අංක	ප්‍රධාන සංචාරකය	ඉලක්කය (මෙ.ටො./කන්නය)	ප්‍රගතිය (මෙ.ටො)	%
1	**කෘෂිකර්ම නිෂ්පාදනය (2020/21 මහ+2021 යල 3 වන කන්නය)**			
1.1	**බීජ - මහවැලි ගොවිපල**			
	බීජ වී	1,805	1,353	75%
	වෙනත් ක්ෂේත්‍ර බෝග	108	15.71	15%
1.2	**බීජ - ගොවින්**			
	බීජ වී	**6,503.7**	**6,972.7**	**107%**
	අනෙකුත් ක්ෂේත්‍ර බෝග බීජ (මිරිස්, බඩ ඉරිඟු, උඳු, මුං ඇට, කව්පි, සෝයා, කුරක්කන්)	851.0	981.8	115%
1.3	**ආහාර බෝග නිෂ්පාදනය**			
	වී	980,653	1,078,828	110%
	අනෙකුත් ක්ෂේත්‍ර බෝග			
	ලොකු ලූනු	31,640	18,880	60%
	සෝයා	13,361.9	7,501	56%
	උඳු	3,276.3	3,221.4	98%
	කවුපි	1,345.6	1,141.5	85%
	කුරක්කන්	1,193.3	1,395.8	117%
	මුං ඇට	8,804	7,535	86%
	බඩ ඉරිඟු	46,556	36,981	79%
	රට කජු	4,392	3,022	69%
	මිරිස්	11,349	10,529	93%
	තල	312	755	242%
	කහ	876	1,478	169%
	ඉඟුරු	1,100	1,466	133%

1.4	**පළතුරු**			
	කෙසෙල්	149,592	166,733.7	111%
	පැපොල්	28,710.6	28,929.3	101%
	පේර	9,967.8	10,155.5	102%
	අනෙකුත් පලතුරු (අඹ, ඩ්‍රැගන් ෆෘට්, අන්නාසි, පැෂන්, තැඹිලි)	11,598.9	13,141.3	113%
1.5	**එළවළු**	157,449.9	171,805.2	109%
2	**කාබනික කලාපය - වී (මෙ.ටො)**	9,275.0	9,740.0	105%
2.1	මහවැලි කලාප වල කාබනික පොහොර නිෂ්පාදනය - කොම්පෝස්ට් (මෙ.ටො)	244,300	153,240	63%
3.	**සත්වපාලනය**			
	මිරිදිය මත්ස්‍ය (මෙ.ටො)	11,000	12052.1	110%
	කිරි (ලිටර් මිලියන)	40	42.02	105%
	බිත්තර (මිලියන)	60	62.35	104%
	විසිතුරු මසුන් (යුගල මිලියන)	37	39.98	108%
		ඉලක්කය (වාර්ෂික)	**ප්‍රගතිය**	**%**
4	**ඉඩම් සංවර්ධන (ඔප්පු ලබාදීම)**			
	ඔප්පු ලබාදීමේ වැඩසටහන	100,000	35,000	35%
		ඒකකය	**ඉලක්කය 2021**	**ප්‍රගතිය 2021**
5	**ව්‍යාපාර සංවර්ධනය**			
	ආයෝජන ප්‍රවර්ධනය	වැඩසටහන්/ ව්‍යාපෘති	26	31
	සංචාරක ප්‍රවර්ධන වැඩසටහන	ව්‍යාපෘති	9	5
	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්	වැඩසටහන්	20	15
	ව්‍යාවසායකයින් සඳහා උපකරණ බෙදාදීම	ව්‍යවසායකයින්	200	383
	කුඩා හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය (මහවැලි සවිය/ මොරගහකන්ද අත්වැල)	ව්‍යවසායකයින්	115	63
6	**පරිසර සංරක්ෂණය**			
	ජලජ ශාක බහුලව පවතින වැව් පිරිසිදු කිරීම මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම	ටොන්	160	148.5
	හරිත මාර්ග සංකල්පය ප්‍රවර්ධනය කිරීම	කි.මී.	14	9
	පැල නිෂ්පාදනය (මහවැලි තවාන්, පාසල් දරුවන් සහ ගොවීන් විසින්)	පැල	819,284	508,124
	ඉහළ ජල පෝෂක ප්‍රදේශවල සහ පහළ ගංගාවල සිටුවීම	පැල	431,450	385,720
	හරිත උද්‍යාන පිහිටුවීම	උද්‍යාන	5	3
	පාරිසරික අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය	වැඩසටහන්	80	71
	විදුලි වැට නඩත්තු කිරීම	කි.මී.	විවෘත	116
	පටක රෝපණ පැල නිෂ්පාදනය	පැල	200,000	66,285

1. මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 4,910.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොලොන්නරුව සහ මඩකලපුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීව්‍රරතාවය**	
ව්‍යාපෘති කාලය	2007 ජනවාරි - 2021 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 20,000
ප්‍රතිපාදන 2021	රු.මි. 217.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 4,749.55	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.5%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 194.00		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	1. D ඇල ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම - 17.7 km 2. ක්ෂේත්‍ර ඇල ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම - කි.මී. 24.3 3. ගොඩනැගිලි 16ක් ප්‍රතිසංස්කරණය කිරීම 4. නඩත්තු කර ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග කිලෝමීටර 36කි 5. කුඩා වැව් 05ක් ප්‍රතිසංස්කරණය කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	1. බෙදාහැරීමේ ඇළ, ජලාපවහන ඇළ සහ ක්ෂේත්‍ර ඇළ ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය කිරීම. 2. ගොඩනැගිලි 45ක් ප්‍රතිසංස්කරණය. 3. ප්‍රධාන වැව් 74ක් සහ කුඩා වැව් 20ක් ප්‍රතිසංස්කරණය කිරීම. 4. මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය 5. විදුලි වැට (කි.මී. 15) ඉදිකිරීම. 6. ජල සම්පාදන යෝජනා ක්‍රම 30ක් ප්‍රතිසංස්කරණය කිරීම.		

2. වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 3,957.10	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, වවුනියා, මුලතිවු
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීව්‍රරතාවය**	හෙක්ටයාර 6,258
ව්‍යාපෘති කාලය	2012 ජනවාරි - 2023 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 6,788
ප්‍රතිපාදන 2021	රු.මි. 233.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,496.72	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	86%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 207.97		

2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	1. කිලෝමීටර් 90ක මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සම්පූර්ණ කර ඇත. 2. ව්‍යුහයන්13ක් ඉදි කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සම්පූර්ණ කර ඇත. 3. කිලෝමීටර් 2.6ක ඇළ පද්ධති පුනරුත්ථාපනය කර ඇත. 4. ගොඩනැගිලි 9ක් නිම කර, බිම් කොටස් 2,000ක් මැන ඇත. 5. ඔප්පු ප්‍රදානය යටතේ ඔප්පු 850ක් නිකුත් කර ඇත. 6. ආයතනික සංවර්ධනය යටතේ ඉදිකිරීම් 275ක් සම්පූර්ණ කර ඇත.
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	1. වැඩිදියුණු කළ වෙළඳපොළ මාර්ග (කි.මී. 150) සහ ගම්මාන මාර්ග (කි.මී.250) ජාලය 2. නල බෝක්කු, ඇළ මාර්ග සහ ව්‍යුහ ප්‍රතිසංස්කරණය 3. ගොඩනැගිලි ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය. 4. ළිං 2,000ක් ඉදිකිරීම. 5. වැඩිදියුණු කළ වාරි කෘෂිකර්මය (හෙක්ටයාර 6,258) සහිත ගම්මාන 11ක් තුළ ගොවි පවුල් 6,788ක් නැවත පදිංචි කිරීම. 6. ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. 7. ගොවීන් 6,000ක් සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් ව්‍යාප්ති සේවා

3. රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1,100	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල (රිදීමාලියද්ද)
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීව්‍රතාවය**	
ව්‍යාපෘති කාලය	2012 ජනවාරි - 2022 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 14,782
ප්‍රතිපාදන 2021	රු.මි. 165.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 75
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 836.58	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	92.5%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 137.45		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	1. වැව් 11ක් ප්‍රතිසංස්කරණය කිරීම. 2. එක් අමුණක් පුනරුත්ථාපනය කරන ලදී. 3. මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - කි.මී. 50.4ක් සම්පූර්ණ කර ඇත. 4. පොදු ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තු කිරීම - සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි 12ක් 5. ආනයනික භෝග වගාව - හෙක්. 1,014 6. ගෙවතු සංවර්ධනය - උද්‍යාන 240ක් 7. නිලධාරීන් පුහුණු වැඩසටහන් - 28 8. ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති 20ක් ස්ථාපනය කිරීම. 9. පාරිසරික අධ්‍යාපන වැඩසටහන් 4ක් සහ රුක් රෝපණ වැඩසටහන් 4ක් පවත්වන ලදී.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	1. වැව් 14ක් ප්‍රතිසංස්කරණය කිරීම. 2. ඇළ සහ ව්‍යුහ ප්‍රතිසංස්කරණය 3. ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය, පොදු ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තු කිරීම. 4. කෘෂිකර්මය සහ පශු සම්පත් සංවර්ධනය 5. සනීපාරක්ෂක පහසුකම් 2,310ක් වැඩිදියුණු කිරීම. 6. ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. 7. පරිසර සංරක්ෂණය

4. රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 1,086.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර (මහඔය/ පදියතලාව)
මුල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීව්‍රතාවය**	
ව්‍යාපෘති කාලය	2012 දෙසැම්බර් - 2023 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	පවුල් 3,550
ප්‍රතිපාදන 2021	රු.මි.192.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මුල්‍ය ප්‍රගතිය	රු.මි.660.01	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	73%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි.172.60		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	1. හෙක්. 986ක සහ ආනයනික සීමා සහිත බෝග වගා කිරීම සහ ගෙවතු 360ක් සංවර්ධනය 2. ගොවීන්/ නිලධාරීන් පුහුණු වැඩසටහන් 38ක් පැවැත්වීම. 3. පශු සම්පත් සංවර්ධනය, මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම. 4. වැව් 2ක් ප්‍රතිසංස්කරණය කර ඇත. 5. පොදු ගොඩනැගිලි 6ක් නිම කර ඇත. 6. ඉඩම් මැනීම් සහ කැබලි කිරීම - කැබලි 1,455 ක් සම්පූර්ණ කර ඇත. 7. කැබලි 73ක් සඳහා වන්දි ගෙවා ඇත. 8. ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, 50% දායකත්වය යටතේ යන්ත්‍රෝපකරණ ලබාදීම, ළිං 43ක් ඉදිකිරීම සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම. 9. විදුලි වැට නඩත්තු කිරීම. 10. පැල 5,000ක් නිෂ්පාදනය කරන ලද අතර, රුක් රෝපණ වැඩසටහන් 04ක් පවත්වන ලදී.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	1. ගොවීන් 3,550ක් සඳහා ව්‍යාප්ති සේවාවන් සැපයීම. 2. මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම. 3. කුඩා හා මධ්‍යම වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම. 4. මහඔය සහ පදියතලාව කුට්ටිවල පොදු ගොඩනැගිලි ඉදිකිරීම. 5. ඉඩම් මැනුම් සහ කැබලි අක්ෂර 6,300ක් කැබලි කිරීම, ඉඩම් බලපත්‍ර 6,400ක් නිකුත් කිරීම, වන්දි ගෙවීම. 6. ආයතනික සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. 7. ව්‍යාපාර සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 8. ළිං ඉදිකිරීම හරහා පානීය ජලය සැපයීම. 9. සනීපාරක්ෂක හා සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම 10. පරිසර සංරක්ෂණය

5. මහවැලි කෘෂිකර්ම හා පශු සම්පත් වැඩසටහන

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 500.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	නුවරඑළිය, අනුරාධපුර, පොලොන්නරුව
මුල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා ත්‍රීව්‍රතාවය**	
ව්‍යාපෘති කාලය	2021 ජනවාරි - 2021 දෙසැම්බර්	**ප්‍රතිලාභීන්**	මහවැලි කලාප වල පදිංචි සියළු ගොවීන්
ප්‍රතිපාදන 2021	රු.මි.500.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 293
සමුච්චිත මුල්‍ය ප්‍රගතිය	රු.මි. 418.95	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 500.00		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	1. බෝග වගා වැඩසටහන, බීජ නිෂ්පාදන වැඩසටහන, කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	1. ජාතික වී නිෂ්පාදනය සහ අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා දායකත්වය 2. පශු සම්පත් සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම		

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අනුග්‍රාහක ආයතන
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව

සුවිශේෂී ප්‍රමුඛතා

කුඹුරු ඉඩම් පෝෂ්‍ය ලෙස පිළිසකර කිරීම හා කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය කුඩා වැව් ප්‍රජා පාදක වැඩසටහන් මඟින් ප්‍රතිසංස්කරණ කිරීම.

වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශ වල ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය හා අනෙකුත් වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම.

ගංඟා ද්‍රෝණි, ඇළ ඉවුරු, වැව් තාවුළු පිරිසිදු කොට වැව් ජලය සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙල ආරම්භ කිරීම.

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව්/අමුණු සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩපිළිවෙල

අතිගරු ජනාධිපතිතුමා විසින් ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, අමුණු හා වාරි පද්ධති යථාවත් කරමින් ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය වැඩිදියුණු කිරීම හා වර්ෂා ජලය උපරිම ලෙස රඳවා ගනිමින් නිසි පරිදි කළමනාකරණය කිරීම තුළින් පානීය, කර්මාන්ත, කෘෂිකාර්මික, සංචාරක හා අනෙකුත් ආදායම් උත්පාදක ක්‍රියාවලීන් සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම ඉලක්ක කර ගනිමින් රට පුරා විහිදී ඇති ග්‍රාමීය වැව්, අමුණු හා ඇළ මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය තුළ ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත.

ඉහත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ‘‘වාරි සෞභාග්‍යා ’’ වැඩසටහන ආරම්භ කර ඇති අතර, ඒ යටතේ ග්‍රාමීය වැව් හා අමුණු 5,000ක් ප්‍රතිසංස්කරණය කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා මහවැලි කලාප ආශ්‍රිත ඇල මාර්ග හා පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරේ.

මෙම ව්‍යාපෘතිය මහවැලි කලාප ආශ්‍රිතව ඇති කුඩා වැව් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මැදිහත් වීමෙන්ද අනෙකුත් සියලු ප්‍රදේශවල වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ගොවි සංවිධාන හා පොදුජන සංවිධාන වල සහභාගීත්වයෙන්ද ක්‍රියාත්මක කරනු ලබන අතර, ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉංජිනේරු අංශය, සිවිල් ආරක්ෂක බලකාය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව යන ආයතනවල සහභාගීත්වය ලබා ගැනේ.

අදාළ වාරි පද්ධති තෝරා ගැනීම හා ක්‍රියාත්මක කිරීමේ ආයතන හා ප්‍රදේශවාසීන් සමඟ සම්බන්ධීකරණ කාර්යයන් දිස්ත්‍රික් මට්ටමේදී ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ.

දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිසංස්කරණය සඳහා තෝරා ගෙන ඇති වැව්/ අමුණු - (2021.12.31 වනවිට)

දිස්ත්‍රික්කය	සැලසුම් කර ඇති ව්‍යාපෘති ගණන	ආරම්භ කර ඇති ව්‍යාපෘති ගණන
කොළඹ	27	25
ගම්පහ	38	37
කළුතර	47	43
ගාල්ල	102	88
හම්බන්තොට	63	63
මාතර	103	100
කෑගල්ල	11	11
රත්නපුර	31	30
මහනුවර	132	115
මාතලේ	40	40
නුවරඑළිය	42	42
කුරුණෑගල	130	118
පුත්තලම	62	54
මුළු ව්‍යාපෘති ගණන	**1,423**	**1,303**

දිස්ත්‍රික්කය	සැලසුම් කර ඇති ව්‍යාපෘති ගණන	ආරම්භ කර ඇති ව්‍යාපෘති ගණන
මඩකලපුව	47	44
ත්‍රිකුණාමලය	54	54
යාපනය	56	41
මුලතිව්	18	17
කිලිනොච්චිය	14	12
වව්නියාව	26	25
මන්නාරම	44	44
අනුරාධපුර	103	83
පොළොන්නරුව	36	36
බදුල්ල	80	70
මොණරාගල	49	45
අම්පාර	68	66

වාරි සෞභග්‍ය වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය - 2021 වර්ෂය

ආයතනය	2021 වර්ෂය සඳහා තෝරාගෙන ඇති වැව්/ අමුණු/ ඇළවේලි සංඛ්‍යාව (2021.12.31)	ආරම්භ කර ඇති වැව්/ අමුණු/ ඇළවේලි සංඛ්‍යාව	ප්‍රතිපාදන 2021	2021.12.31 දක්වා වියදම (රු.මි.)
වාරිමාර්ග දෙපාර්තමේන්තුව	816	755	1,708.5	1,651.66
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	302	284	750	501.54
පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	144	143	261.72	261.72ක අග්‍රිමය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව I	23	16	128.77	76.47
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව II (අලංකරණය)	12	12	-	-
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර	73	56	73.95	39.04
සමීක්ෂණ කටයුතු	209	209	රජයේ වියදමකින් තොරව කෙරෙන ව්‍යාපෘති	
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය/ රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව/ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	53	37		
වෙනත්			77.38	39.26
එකතුව	**1,423**	**1,303**	**3,000**	**2,569.69**
රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය 2021.12.31 – 86%				

2.1.3. අභියෝග

- 2021 වර්ෂය තුළ ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම හේතුවෙන් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් වලට අදාළව මූල්‍ය ප්‍රගතිය, අනුමත ප්‍රතිපාදන සමග සංසන්දනයේ දී, සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති බව පෙනී යන අතර, මූල්‍ය ප්‍රවාහයේ අර්බුදය හේතුවෙන් වැඩ කටයුතු සුමටව සිදු කිරීමට නොහැකි විය.

- කොවිඩ්-19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකාවට සිදුකළ බලපෑම හේතුවෙන්, අදාළ වර්ෂය තුළ සැලසුම් කළ පරිදි සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ලඟා කර ගත නොහැකි විය. ගෝලීයව ව්‍යාප්ත වූ වසංගත තත්ත්වය හේතුවෙන් පුද්ගල සහ ඉදිකිරීම් ද්‍රව්‍යයන්ගේ සංචරණය සීමා වීමත්, උපකරණ, ද්‍රව්‍ය සහ අමතර කොටස් වල මිළ සීග්‍රයෙන් ඉහළයාමත් හේතුවෙන් සංවර්ධන කටයුතු වල ප්‍රගතිය අත් කර ගැනීම සිදු වූයේ දැඩි අසීරුතා මධ්‍යයේය.

- මෙම තත්ත්ව මත ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සිදු වූ සමස්ථ කඩා වැටීම හේතු කොටගෙන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වැනි වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නොලැබීම 2021 වර්ෂය තුළ මුහුණ දුන් කැපී පෙනෙන අභියෝගයක් විය.

ඉදිරි ඉලක්ක

	වැඩසටහන / ව්‍යාපෘතිය	**2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මී.)**	**2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය**	**2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය**	**2022 ඉලක්ක**
01	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)	20,000.00	29%		1. පහත සඳහන් ඉදිකිරීම් පැකේජ තුන සම්පූර්ණ කර ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ මහවැලි අධිකාරිය වෙත පැවරීමට සැලසුම් කර ඇත. - MLBCRP-ICB 1 - වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ එසවීම - ICB/2B - කළු ගඟ / මොරගහකන්ද යා කරන කි. මී. 8.8 උමඟ ඉදිකිරීම (කි.මී 0+100 සිට 08+830 km) - NWPCP-ICB-2 - නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම (කි.මී. 5+250 සිට කි.මී. 22+300) 2. වැඩසටහනේ පාරිසරික, සන්නිවේදන හා පුහුණු යන ඉදිකිරීම් නොවන ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාම. 3. සියලුම ඉදිකිරීම් පැකේජ සඳහා නැවත පදිංචි කිරීම් සහ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීම.
i.	මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය	369	87%	98%	• දැනට ඉදිකිරීම් අදියරයේ පවතින වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ මීටර් 3.5 කින් එසවීම සඳහා වූ කොන්ත්‍රාත් පැකේජයේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ අවසන් කිරීම. • ස්වයංක්‍රියකරණ සහිතව මිණිපේ දකුණු ඉවුරු ඇළෙහි ප්‍රධාන නිර්මිත වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත් පැකේජයෙහි (MLBCRP-NCB6) ප්‍රසම්පාදන කටයුතු අවසන් කර, කොන්ත්‍රාත් පැකේජය ප්‍රදානය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2022 ඉලක්ක
ii.	වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය	6,467	30%	40%	• දැනට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින කොන්ත්‍රාත් පැකේජ වන NWPCP-ICB-2 හා NWPCP-ICB-1 හි ඉදිකිරීම් කටයුතු වල 2022 වසර සඳහා වූ ඉලක්කගත මූල්‍ය හා භෞතික ප්‍රගතිය ලඟා කර ගැනීම. • වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියෙහි NWPCP-3, 4, 5 සහ 6 යන කොන්ත්‍රාත් පැකේජ වල ප්‍රසම්පාදන කටයුතු අවසන් කර, කොන්ත්‍රාත් පැකේජ 4 ප්‍රදානය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
iii.	උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය	13,263	19%	44%	• දැනට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින කොන්ත්‍රාත් පැකේජ වන UEC-ICB-2A හා UEC-ICB-2B හි ඉදිකිරීම් කටයුතු වල 2022 වසර සඳහා වූ ඉලක්කගත මූල්‍ය හා භෞතික ප්‍රගතිය ලඟා කර ගැනීම. • උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතියෙහි NCPCP-3, 4, 5 සහ 6 යන කොන්ත්‍රාත් පැකේජ වල ප්‍රසම්පාදන කටයුතු අවසන් කර, කොන්ත්‍රාත් පැකේජ 4 ප්‍රදානය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
02.	උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	750 + අතිරේක 4,350	93.82%	100%	**මූලස්ථායී වැඩ** 2022 මැයි වන විට ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ වල ඉතිරි වැඩ කටයුතු අවසන් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඉන් පසුව, දෝෂ නිවැරදි කිරීමේ කාලය (Defect Notification Period) ක්‍රියාත්මක වේ. මූලස්ථායී වැඩ කටයුතු වලට අදාල පහත සඳහන් වැඩ 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරේ. • දෝෂ නිවැරදි කිරීමේ කාලය තුළදී අඩුපාඩු අනාවරණය වුවහොත්, කොන්ත්‍රාත්කරු විසින් නිවැරදි කිරීමේ කටයුතු සිදු කිරීම • කාර්යසාධන සහතිකය නිකුත් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුට රඳවා ගැනීමේ මුදල් ගෙවීම. • ව්‍යාපෘතිය අවසන් කිරීම සම්බන්ධ අනෙකුත් වැඩ.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2022 ඉලක්ක
					පහළ නිම්න සංවර්ධනය **පහළ නිම්න සංවර්ධන කටයුතු වල ව්‍යාපෘති විෂය පථය පහත පරිදි වෙනස් වී ඇත.** 1. අලිකොට ආර ජලාශයේ පහළ පිටමං ව්‍යුහය යෝජනා කර ඇත. 2. හඳපානාගල වැව ආශ්‍රිතව මාර්ග පද්ධති ඉදිකිරීම් සහ වනජීවී ඒකක කාර්යාලයක් ඉදිකිරීමට නියමිතය 3. වාරි ජලය සැපයිය හැකි නව ප්‍රදේශ හඳනාගැනීමෙන් පසු හඳපානාගල ජලාශය ආශ්‍රිතව අමතර D ඇළ මාර්ග ඉදිකිරීම ඇතුළත් කර ඇත 4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු අලිකොට ආර - කුඩාඔය හැරවුම් ඇළ මාර්ග වල දිග වැඩි කරන ලදී. 5. වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අනුමැතිය ලද පසු කුඩාඔය - සිංහලයාගම හැරවුම් ඇළ මාර්ග පද්ධතියේ දිග වැඩි වී ඇත. 6. ග්‍රාමීය වැව් සංවර්ධන සංරචකය සඳහා කුඩා වැව් 25ක් අලුතින් එක් වී ඇත. ඒ අනුව සිදුකර ගෙන යන ලද පහළ නිම්න සංවර්ධන කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් 2022 වසර තුළ ක්‍රියාත්මක කරගෙන යනු ලබයි.
03.	මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය	3,600.00	98.2%	100%	• ගොඩනැගිලි, මාර්ග, ඇළ මාර්ග ඉදිකිරීම් සහ ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2022 ඉලක්ක
04.	ඵලදායිතාව ඉහළ නැංවීම සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP)	150 + අතිරේක 300	48%	100%	1. වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපන සංරචකය (IIRC) - අවිච්ඡේද උප ව්‍යාපෘති 84ක් සහ නව උප ව්‍යාපෘති 25 2. ගොවිපල සංවර්ධන සංරචකය (OFDC) - අවිච්ඡේද උප ව්‍යාපෘති 06ක් සහ නව උප ව්‍යාපෘති 50 3. කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමේ සංරචකය (APIC) - අවිච්ඡේද උප ව්‍යාපෘති 05ක් සහ නව උප ව්‍යාපෘති 50 4. වාරි කළමනාකරණ සඳහා හැකියාවන් හා ධාරිතාවන් වැඩි කිරීමේ සංරචකය (ICTMC) - අවිච්ඡේද උප ව්‍යාපෘති 04ක් සහ නව උප ව්‍යාපෘති 65 5. තොරතුරු තාක්ෂණ සහාය සැපයීම සඳහා අවශ්‍ය මෙවලම් සහ උපකරණ මිළ දි ගැනීම ද ඇතුළුව GIS සිතියම් සහ දත්ත සමුදාය සකස් කිරීම 6. ප්‍රවාහ මිනුම් ජාල පිහිටුවීම සහ ජල බෙදා හැරීමේ කාලසටහන සකස් කිරීම 7. ඇසුරුම් නිවාස 01ක් ඉදිකිරීම 8. මෙහෙයුම් සහ කළමනාකරණ අත්පොත් සකස් කිරීම
05.	භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය	350	93.7%	100%	1. පර්යේෂණ නල ළිං 25ක් ඉදිකර අවසන් කිරීම. 2. පර්යේෂණ නල ළිං 65ක නිමාන උපකරණ සවිකිරීම. 3. පර්යේෂණ නල ළිං 65ක මූලික ජල විශ්ලේෂණ කටයුතු සිදු කිරීම. 4. දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම. 5. අන්තර්ජාල දත්ත පද්ධතිය (web portal) ස්ථාපිත කිරීම.

	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2022 ඉලක්ක
06.	ජල කළමනාකරණයට ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් දේශගුණික විචල්‍යතා සහ අතිශයින්ම අන්තගාමී සිදුවීම් කළමනාකරණය කිරීම (වැව් ගම් පුබුදුව - CRIWMP)	2,050.00	49%	65%	ග්‍රාමීය වාරි පද්ධති 76ක් ප්‍රතිසංස්කරණය කිරීම (සුළු වැව්/අමුණු)
07.	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය	800 + අතිරේක 1,000	3.6%	5%	ප්‍රධාන වැඩ ආරම්භ කිරීම සහ උමං ඉදිකිරීම.
08.	පහළ මල්වතු ඔය බහුකාර්ය ජලාශ ව්‍යාපෘතිය	2,000 + අතිරේක 1,700	2.3%	3%	• ජලාශ බැම්මෙහි ඉදිකිරීම් කටයුතු • නිල නිවාස ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම • ඉංජිනේරුමය නිර්මාණ සහ සැලසුම් කාර්යයන් සහ සැලසුම් පත්‍ර පිළියෙල කිරීම. • වැඩබිම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. • වැඩබිම සඳහා අවශ්‍ය තාවකාලික මාර්ග, ස්ථිර හා තාවකාලික කාර්මික වැඩපළ ඉදිකිරීම. • සොරොව්ව වම් ඉවුර හා දකුණු ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය සහ ජලය බෙදාහැරීමේ ඇළ මාර්ග, වාන් දොරටු, වාන් මාර්ගය දෙපසින් ආධාරක බැම්මි (Abutments), සහ පිටවාන ඉදිකිරීම. • කුඹුරු බිම් සඳහා ජලය සපයනු ලබන ඇළ මාර්ග ඉදිකිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ජලය සපයන භූමිය සකස් කිරීම. • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයන්හි භෞතික සම්පත් සංවර්ධනය කිරීම

	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2022 ඉලක්ක
					• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ සහ නව වගා බිම් වටා ආරක්ෂිත අලිවැට ඉදිකිරීම. • ප්‍රතිවනරෝපණය • පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථාන සංරක්ෂණය කිරීම. • ගොවිජන සේවා සහ ආයතනික සංවර්ධනය. • ඉඩම් අත්පත් කර ගැනීම. • බලපෑමට ලක්වූවන්ට වන්දි ලබාදීම. • නැවත පදිංචි කිරීමේ සහ වගා කිරීම සඳහා ලබා දෙන ඉඩම් කට්ටි කිරීමේ කටයුතු අවසන් කිරීම. • තන්තිරිමලේ නගර සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් කටයුතු අවසන් කිරීම සහ ඊට අනුකූලව භෞතික සම්පත් සංවර්ධනය කිරීම
09.	ගිං - නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය - අදියර 1 (පූර්ණ ශක්‍යතා අධ්‍යයනය හා පරිසර බලපෑම ඇගයීම)	250.00	65%	100%	• පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය සම්පූර්ණ කිරීම. • සමාජ බලපෑම් ඇගයීම් අධ්‍යයනය හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කිරීම. • ඉඩම් පවරා ගැනීමේ කටයුතු ආරම්භ කිරීම. • ඉදිකිරීමේ කටයුතු බලමුළු ගැන්වීම (Mobilization).
10.	මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධනය	1,000 + අතිරේක 200	1.4%	3%	• ප්‍රධාන ඇළෙහි කි.මී. 6+500 සිට 18+450 දක්වා ඉදිකිරීම. • කීනානි, මීමින්නාගොල්ල, ආරංගොඩ වැව් ඇතුළුමං හා පිටමං ව්‍යුහ, පිටවාන ඉදිකිරීම. • ඒකක 01ට අදාල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

	වැඩසටහන / ව්‍යාපෘතිය	2022 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	2021 වර්ෂයේ සමස්ථ ප්‍රගතිය	2022 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය	2022 ඉලක්ක
11.	කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය	500 + අතිරේක 475	2.7%	7%	මාර්ග ඉදිකිරීම - කි. මී. 4, වේල්ල ඉදිකිරීම (25%), පිටවාන ඉදිකිරීම (10%), සොරොව්ව ඉදිකිරීම (10%), ගොඩනැගිලි ඉදිකිරීම - 2, පහළ නිම්න ප්‍රධාන ඇළ ඉදිකිරීම - කි.මී. 6, බෙදුම් ඇළ ඉදිකිරීම - කි.මී. 10, කෙත් ඇළ ඉදිකිරීම - කි.මී. 30, පශු සම්පත් සංවර්ධන වැඩසටහන් - 5, නැවත වන වගාව - හෙක්ටයාර් 10, අලිවැට ඉදිකිරීම - කි.මී. 10 සහ නැවත පදිංචිකිරීම් -පවුල් 10ක්.
12.	ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	3,000.00	0.5%	26.15%	1. ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ සැලසුම සකස්කිරීම සඳහා උපදේශක සේවා කොන්ත්‍රාත්තුව පිරිනැමීම සහ ප්‍රමුඛතාගත ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ වැඩසටහන් දියත් කිරීම. 2. HMIS ජාලකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ ජල සම්පත් මණ්ඩලය සවිබලගැන්වීමේ කාර්යන් සිදුකිරීම. 3. වේලි 27ක සහ ඇළ මාර්ග 10ක ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13.	බැරක්ප්ලේන් වැව සංවර්ධන ව්‍යාපෘතිය	100	26%	100%	1. වැව අවට පාංශු සංරක්ෂණ පිළිවෙත් හඳුන්වා දීම 2. වැවට රොන් මඩ ගලා ඒම වැළැක්වීම සඳහා නව රොන්මඩ උගුල් හඳුන්වාදීම 3. ජලාපවහන ඇතුල්වීම් (Drainage inlet) ඉදිකිරීම 4. වළලු බැම්ම (Ringbund) ඉදිකර වැවට අප ජලය මුදා හැරීම නැවැත්වීම සහ වේල්ලෙහි සුළු අලුත්වැඩියාවන් කිරීම 5. වැව අවට පාංශු ඛාදනය අවම කිරීම සඳහා භූමි අලංකරණය 6. මායිම් ගල් යොදා සීමා නිර්ණය කිරීම
14.	පැලවත්ත ලංකා සීනි සමාගමේ පර්යන්ත ප්‍රදේශ ජනාවාස භූමියෙහි වාරි සංවර්ධන සැලැස්ම	50 + අතිරේක 25	42%	50%	2021 වසරට නියමිත වැඩවලින් ඉතිරිය සහ වෙල්ලස්ස වැව ඉදිකිරීම.

- 2022 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කොට, කෘෂිකර්ම, විදුලිබල සහ පානීය ජල සම්පාදනය යන ක්ෂේත්‍ර ඔස්සේ එහි ප්‍රතිලාභ ජාතියට දායාද කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධානතම ඉලක්කයකි.

- මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමත්, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය වැනි වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති රැසක ප්‍රතිලාභ ලබා දීමටත් 2022 වර්ෂය තුළ අපේක්ෂා කෙරේ.

- මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින්, වියලි කලාපීය ජනතාවට අවශ්‍ය පානීය සහ කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය සපයා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමත්, ජාතික ආර්ථිකයට දායක වීමත් අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ දෙවන පියවර ද ක්‍රියාත්මක කොට ගබඩා ධාරිතාවයන් ඉහළ නැංවීම සහ අදාළ ජල හැරවුම් මගින් දේශගුණික විපර්යාසයන්හි බලපෑම් සඳහා මුහුණදීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉදිරි ඉලක්කයක් වේ.

- රටේ කෘෂිකාර්මික ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා "වාරි සෞභාග්‍යා" ජාතික වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් හා අඩුණු 5,000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය, ආයතන රැසක දායකත්වයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- දැනට පවතින වගාබිම් හෙක්ටයාර 5,810ක් සහ නව වගා බිම් හෙක්ටයාර 400ක් සඳහා අවශ්‍ය ජලය ලබාදීම හා මෙගාවොට් 15ක විදුලිය ජනනය කිරීමේ අරමුණින් සැලසුම් කළ තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය 2022 වර්ෂයේ ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

- මිලියන 11.2 ජනතාවකට සෙත සැලසීමේ අරමුණින් සැලසුම් කළ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA) 2022 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සැකසුණු "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන මගින් හඳුනාගත් ව්‍යාපෘති 2022 වසර තුළ ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- යාපනය ප්‍රදේශයේ ජල ගැටළුවට විසඳුම් ලෙස පොකුණු සංවර්ධනය කිරීමත්, ඉදිකිරීමත් තුළින් පානීය ජල අවශ්‍යතා සැපිරීමට අපේක්ෂිතය.

- ගංවතුර අවදානමට ලක්වන ගම්පහ, පුත්තලම, ගාල්ල, මාතර, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක වල ගංවතුර පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද අමාත්‍යාංශයේ ඉලක්කයකි.

.....
අතිරේක ලේකම් (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ)
ජල සම්පත් සැලසුම් හා සංවර්ධන අංශය

ඉංජි. ඩබ්. බී. පලුගස්වැව
අතිරේක ලේකම්
(වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන)
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක. 11, ජාවත්ත පාර,
කොළඹ 05.

.....
ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය

ඉංජි. කේ. ඩබ්. අයිවන් ද සිල්වා
ලේකම්
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක. 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්ඒඒ - එල්

2021.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය (2021)		සටහන	තත්‍ය (2021)	2020	
-	**ආදායම් ලැබීම්**		-	-	
	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**එස්ඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		12,257,331,000	6,383,928,021	**එස්ඒ-3**
-	තැන්පතු		34,385,133	1,405,847	**එස්ඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		15,535,771	10,938,794	**එස්ඒ-5/5(අ)**
-	වෙනත් ලැබීම්		-	11,913,756	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**12,307,251,904**	**6,408,186,418**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**12,307,251,904**	**6,408,186,418**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		276,616,354		
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)		**12,030,635,549**	**6,408,186,418**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
	වැටුප්, වේතන සහ අනෙකුත්				
-	සේවක ප්‍රතිලාභ	**5**	243,448,427	217,828,321	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	79,624,757	56,783,897	**එස්ඒ-2(ii)**
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	33,909,228	30,646,548	
-	පොළී ගෙවීම්	**8**			
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	253,267	209,768	
-	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**357,235,679**	**305,468,534**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය				
-	හා වැඩිදියුණු කිරීම්	**10**	16,958,410	6,962,659	
-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	22,912,888	45,663,276	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	1,242,090,000	293,000,000	**එස්ඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**			
-	හැකියා වර්ධනය	**14**	6,504,544	3,250,183	
-	වෙනත් මූලධන වියදම්	**15**	29,792,674,096	28,800,060,787	
-	**මුළු මූලධන වියදම් (උ)**		**31,081,139,938**	**29,148,936,905**	
	තැන්පතු ගෙවීම්		20,584,268	7,126,877	**එස්ඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		13,803,302	12,130,935	**එස්ඒ-5/5(අ)**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		34,387,570	19,257,812	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**31,472,763,187**	**29,473,663,251**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)**		**(19,442,127,637)**	**(23,065,476,833)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(19,442,127,637)**	**(23,065,476,833)**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඒසීඒ - පී

	සටහන	කළය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියන හා උපකරණ	ඒසීඒ-6	18,223,625,532	470,485,984
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	38,505,023	40,237,493
මුදල් හා මුදල් සමාන ද	ඒසීඒ-3		387,000
මුළු වත්කම්		18,262,130,555	511,110,477
ඉද්ධ වත්කම් / ණකන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		14,369,242	30,289,576
දේපළ පිරියන හා උපකරණ සංචිතය		18,223,625,532	470,485,984
කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	24,135,782	10,334,917
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	
මුළු වගකීම්		18,262,130,555	511,110,477

පිටු අංක 01 සිට 57 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 58 සිට 149 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්වලින් අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. එබැවින් ඉහත අවසන් ගිණුම්වලින් සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පෙත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමෙන් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමේ වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි නම : තනතුර : දිනය : 28/02/2022	ගණන්දීමේ නිලධාරි නම : තනතුර : දිනය : 28/02/2022	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්) නම : දිනය : 28/02/2022
ඉංජි. කේ. ඩබ්. අසිරිවන් ද සිල්වා ලේකම් වාර්මාර්ග අමාත්‍යාංශය අංක. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.	වයි. එම්. එස්. ගුණසේකර ප්‍රධාන මූල්‍ය නිලධාරි වාර්මාර්ග අමාත්‍යාංශය අංක: 11, ජාවත්ත පාර කොළඹ 05	පී. ඒ. ඩී. එම්. ඩී. පොන්සේර ප්‍රධාන ගණකාධිකාරි වාර්මාර්ග අමාත්‍යාංශය අංක: 11, ජාවත්ත පාර කොළඹ 05

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - සී

2021.12.31 දිනෙන් අවසන් කල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		තක්‍ය
	2021 (රු.)	**2020 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	53,189,037	11,913,756
අග්‍රිම ලැබීම්	12,257,331,000	6,383,928,021
අත්තිකාරම් අයකර ගැනීම්	12,378,464	2,870,037
තැන්පතු ලැබීම්	34,385,133	7,126,877
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	12,357,283,633	6,405,838,691
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	319,548,812	111,478,208
සහනාධාර සහ මාරුකිරීම්	30,414,228	10,423,489
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම	5,889,786	21,063,619
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	276,616,354	387,000
අත්තිකාරම් ගෙවීම්	13,803,302	4,062,178
තැන්පතු ගෙවීම්	20,584,268	1,405,847
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	666,856,750	148,820,341
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	11,690,426,884	6,257,018,350
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		
ලාභාංශ		
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		
උපණය අයකර ගැනීම්		
අත්තිකාරම් අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	11,690,426,884	6,257,018,350
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	11,690,426,884	6,257,018,350
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(11,690,426,884)	(6,257,018,350)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්		
විදේශීය ණය ආපසු ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		
මුදල් වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) - (ඒ)		
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	381,000	381,100	357,235.68	93.76%
ප්‍රාග්ධන	31,328,100	36,239,980	31,081,139.94	85.76%

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
130	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	අභ්‍යාසලාභී උපාධිදාරීන්ගේ වැටුප් ගෙවීම	1,257.33	1,257.33	1,257.33	100%
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම යන නිළධාරීන්ගේ ණය ශේෂ පියවීම	768.10	768.10	768.10	100%
282	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	කොත්මලේ පුහුණු ආයතනයේ වියදම් සඳහා	1,024.07	1,024.07	650.24	63.49%
428	මහවැලි රාජ්‍ය අමාත්‍යාංශය	වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය හිඟ ප්‍රතිපාදන	3,052.08	3,052.08	3,052.08	100%
429	වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය	වරිපනම් ගාස්තු ගෙවීම සඳහා	162.02	162.02	162.02	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**2020.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2020.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	57,751,290.80	57,751,290.80		
9152	යන්ත්‍රෝපකරණ	319,109,842.84	319,109,842.84		
9153	ඉඩම්	93,624,850.20	93,624,850.20		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම III ලෙස අමුණා ඇත.

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	90% - 100%	75% - 89%	50% - 74%	05% - 49%
මොරගහකන්ද සිට හුරුළුවැව, මාන්නක්කට්ටිය, ඒරුවැව සහ මහකනදරාව දක්වා උතුරු මැද පළාත් ඇළ (ඉහළ ඇළහැර ඇළ) නිම කිරීම				✓
වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය නිම කිරීම				✓
මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය නිම කිරීම		✓		
උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය නිම කිරීම	✓			
මොරගහකන්ද සහ කලුගඟ ජලාශ ව්‍යාපෘතිය නිම කිරීම	✓			
දේශගුණික බලපෑම අවම කිරීමේ ව්‍යාපෘතිය නිම කිරීම	✓			
භූගත ජල විමංසන ජාලයක් ස්ථාපනය කිරීමේ නියමු ව්‍යාපෘතිය නිමකිරීම	✓			
දේශගුණික ප්‍රතිවිරෝධී ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය නිම කිරීම				✓
තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය නිම කිරීම				✓
පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය නිම කිරීම				✓
ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය නිම කිරීම				✓

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50 - 74	75 - 100
අරමුණු: මතුපිට ජලය හා භූගත ජලය සංවර්ධනය සංරක්ෂණය සහ කළමනාකරණය	**ඉලක්ක 01:** වසර 2030 වන විට කෘෂිකාර්මික ඉඩම් සඳහා ජල භාවිතයේ කාර්යක්ෂමතාවය 47% සිට 52% දක්වා වැඩිකිරීම.	**දර්ශක 01**: වාරිමාර්ග පද්ධති වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, නව තාක්ෂණය භාවිතයෙන් කෘෂිකාර්මාන්තය සඳහා භාවිතා වන ජල පරිභෝජනය අවම කිරීම.	✓		
	ඉලක්ක 02: වසර 2030 වන විට ප්‍රධාන සහ මධ්‍යම ප්‍රමාණයේ ජලාශ වල ධාරිතාවය ඝන මීටර් මිලියන 6,645 සිට ඝන මීටර් මිලියන 7,245 දක්වා වැඩි කිරීම.	**දර්ශක 02**: ඵලදායී භාවිතයකින් තොරව ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යන ජල ප්‍රමාණය අඩු කිරීම.		✓	
	ඉලක්ක 03: වසර 2030 වන විට ප්‍රධාන හා මධ්‍යම ජලාශ යටතේ වගා කරන භූමියේ වගා තීව්‍රතාවය දැනට පවතින 1.6 සිට 1.65 දක්වා වැඩි කිරීම.	**දර්ශක 03**: ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය සහ වගා පාලනය සඳහා ඒකාබද්ධ ජල කලමනාකරණ ප්‍රවේශය මඟින් ගොවි ජනතාව බල ගැන්වීම.		✓	
	ඉලක්ක 04: වසර 2030 වන විට ගංවතුර මඟින් වන බෝග හානිය 50% කින් අඩු කිරීම.	**දර්ශක 04**: ජලාධාර කළමනාකරණය සහ ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා ආයතනික ව්‍යුහයන් ස්ථාපිත කිරීම.	✓		
	ඉලක්ක 05: ශ්‍රී ලංකාවේ පානීය, කෘෂිකාර්මික, කාර්මික හා වෙනත් කාර්යයන් සඳහා ව්‍යතිරේකයක් ලෙස භූගත ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පැවැත්ම තහවුරු කිරීම.	**දර්ශක 05**: ජල සම්පත් වඩාත් හොඳින් කළමනාකරණය මඟින් වාරි, පානීය හා ගෘහස්ථ ජල ඉල්ලුමට ව්‍යතිරේකයක් සැපයීම.	✓		

	ඉලක්ක 06: පූර්ව ජල කළමනාකරණය උදෙසා භූගත ජල කළමනාකරණ යාන්ත්‍රණයක් සකස් කිරීම.	**දර්ශක 06**: ශ්‍රී ලංකාව තුළ භූගත ජල සංචිත වැඩි දියුණු කිරීම, ගණනය, සංරක්ෂණය හා සංවර්ධනය.	✓		
	ඉලක්ක 07: ගොවි ප්‍රජාව සංවිධානය හා සම්බන්ධීකරණය මඟින් ඒකක ජල ප්‍රමාණයකින් කරනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන වල ඵලදායීතාවය වැඩිදියුණු කිරීම.	**දර්ශක 07**: වර්ෂා ජලය භාවිතයෙන් බිම් සකස් කිරීම හා වාරි ජලය භාවිතය අවම කිරීම මඟින් යල කන්නයට අක්කරයකට අක්කර අඩි 4.4 හා මහ කන්නයට අක්කරයකට අක්කර අඩි 3.9 දක්වා අඩුකර ගැනීම.	✓		

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

- පහළ මල්වතුඔය ජලාශය, තල්පිටිගල ජලාශය, කුඹුක්කන්ඔය ජලාශය වැනි ජලාශ ඉදිකිරීමේ මූලික කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර, ඉදිරි වසර පහ (05) ඇතුළත එම කටයුතු නිම කිරීම වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉලක්කය වෙයි.

- වාරි පද්ධතියේ ඵලදායීතාවය ඉහළ නැංවීම උදෙසා ඒකාබද්ධ ජල ඵලදායීතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ඉදිරියේදී අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- වාරිමාර්ග පද්ධති සහ ගංහාවල රක්ෂිත විධිමත් පරිදි නිර්ණය කොට ගැසට් කිරීමේ වැඩපිළිවෙලක් වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ආරම්භ කර ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග කළමනාකරණ අංශය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතන නිරන්තරයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුව ද, ජලයේ වටිනාකම පිළිබඳ ජනතාව තුළ ඇති නොදැනුවත්භාවය සහ සෘණාත්මක ආකල්ප හේතුවෙන්, මනා ජල කළමනාකරණයක් සිදු කිරීම දුෂ්කර වී ඇත.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	41	21	20
තෘතීයික	03	02	01
ද්විතීයික	86	64	22
ප්‍රාථමික	49	38	11

6.2. ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බෙහෙවින් බලපාන අතර, මානව සම්පත් හිඟය ආයතනයේ කටයුතු විධිමත්ව හා ඵලදායීව සිදු කිරීම සඳහා ගැටළුවක්ව පවතී.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
සංවර්ධන සහකාර හා කළමනාකරණ සහකාර නිලධාරින්ගේ වෘත්තිය සංවර්ධනය	02	පැය 07	14,000.00		දේශීය	හොඳයි

*ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

එමගින් ආයතනයේ ඵලදායීතාව වැඩි දියුණු කර ගත හැක.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල වේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.6	වෙනත්			
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල නොවේ		ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ		2021 දෙසැම්බර් මස අවසානයේ ලැබූ විගණන විමසුම් ඇත. පිළිතුරු සකස් කරමින් පවති.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිලිතුරු සැපයීමට මසකට වඩා වැඩිකාලයක් ගෙන තිබීම	- සිහි කැඳවීම් ලිපි යැවීම - විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී අවධානයට ලක්කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	Covid-19 තත්වය පැවති නිසා වර්ෂය තුල විගණන හා කළමනාකරණ රැස්වීම් 03ක් පවත්වා ඇත	2022 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම් 04 ක් පැවැත්වීමට වාර්ෂික විගණන සැලැස්මට ඇතුලත් කර ඇත
8	**වත්කම් කළමනාකරණ කමිටු**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සාමාන්‍ය පරිදි නොකැඳවීම	පූර්ණ සේවාවකින් පසු විධිමත් පරිදි ඉන්ධන පරීක්ෂා කිරීම
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල නොවේ	පෙර වර්ෂයේ නිරවුල් නොවූ බැරකම් මේ වර්ෂයේදි ගෙවීමට සිදුවීම	ඉදිරියේදි ප්‍රතිපාදන සීමා නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීමට කටයුතු සිදු කිරීම
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ		මෙම වර්ෂය තුලදි කල්ඉකුත් වූ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කිරීම
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	ප්‍රඥප්තිය සකස් කිරීමට අවශ්‍ය මූලික පියවර සඳහා කටයුතු කරමින් පවතී	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල නොවේ		ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

වැය ශීර්ෂ - 282

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සඳහා වගකිව යුතු ප්‍රධාන ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. විදේශීය හෝ වෙනත් බාහිර උපදේශන නොමැතිව ජල සම්පත් සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය, විමර්ශන, ක්‍රම සැලසුම්, සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු සිදු කරන එකම ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි.

මේ වන විට වගා ඉඩම් හෙක්ටයාර 321,724කට වාරිමාර්ග පහසුකම් සපයන අතර 2030 වර්ෂය වන විට එම ප්‍රමාණය හෙක්ටයාර 350,000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එසේම ජලය හා සම්බන්ධව කටයුතු අනිකුත් රේඛීය ආයතන වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන ආදී වූ පාර්ශවකරුවන් සඳහා තාක්ෂණික සේවා සැපයීම ද සිදු කරනු ලබයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව වසර 100කට වැඩි කාලයක් පුරා නඩත්තු කර ඇති විශාල දත්ත ප්‍රමාණයක් ද පවතී.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1. දැක්ම

"අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු" යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

1.2.2. මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

1.2.3. අරමුණු

i. වාරි කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව ආදිය සඳහා පරිසරයට හිතකාමී ලෙස ජල සම්පත් සහ ඉඩම් සංවර්ධනය.

ii. වාරි හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.

iii. පානීය ජලය සැපයීම, ගංවතුර අවදානම ඇති ඉඩම්වලට ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පද්ධතීන් සැපයීම.

iv. ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.

v. තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය ආර්ථික වශයෙන් කළමනාකරණය කිරීම.

vi. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.

vii. විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

1.3. ප්‍රධාන කාර්යයන්

i. පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංගා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

ii. ජල සම්පත් හා ගංවතුර කළමනාකරණය සඳහා අතීත දත්ත එක්රැස් කිරීම, සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.

iii. වාරිමාර්ග, ජල විදුලිය සහ ගංවතුර පාලනය සඳහා වන නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

iv. නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම

v. ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීමේ ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අනතුරකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම.

vi. ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම.

vii. මධ්‍යම හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම, මෙහෙයුම්, නඩත්තු, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපන හා ජල කළමනාකරණය, සහ ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ප්‍රශස්ත ඵලදායීතාව සඳහා අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ, කාර්මික භාවිතය සහ පාරිසරික අවශ්‍යතා සඳහා ජලය සැපයීම.

viii. කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වේලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

ix. ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

x. මානව සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

xi. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

xii. ජල සම්පත් වැඩි දියුණු කිරීම, ඉංජිනේරුමය මූලික දැනුම, පස් වැඩ සහ කොන්ක්‍රීට් වැඩ වල ගුණාත්මකභාවය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම සහ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා සහ පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබා දීම.

xiii. මහාමාර්ග, කුඩා ජල විදුලිය, කාර්මික හා ඉඩම් පිරවීම, හෝටල්, නිවාඩු නිකේතන සහ පානීය ජල ව්‍යාපෘති යනාදී අනෙකුත් රජයේ ආයතන සහ පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘති සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවසරය නිකුත් කිරීම.

1.4. සංවිධාන සටහන



* තනතුරු දෙකම එකම පුද්ගලයා විසින් දරනු ලැබේ.

** තනතුරු දෙකම එකම පුද්ගලයා විසින් දරනු ලැබේ.

සංවිධාන සටහන සඳහා සංක්ෂිප්තයන්

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා. අ. ජ.	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්	
අති. වා. අ. ජ. (වී, සැ. හා නි.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන, ක්‍රම සැලසුම් හා නිර්මාණ)	වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විමර්ශන සිදු කිරීම, ක්‍රම සැලසුම් සකස් කිරීම සහ සැලසුම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය සිදු කිරීම.
අති. වා. අ. ජ. (ක්‍රම. කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම කළමනාකරණ)	ගුරුත්ව වාරිමාර්ග ව්‍යාපාරවල පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම, ජල කළමනාකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති. වා. අ. ජ. (ඉදි හා සං)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් හා සංවර්ධන)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති. වා. අ. ජ. (ගංගා කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ගංගාධාර කළමනාකරණ)	ජලාපවහනය, ගංවතුර පාලනය සහ ගංගාධාර කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති. අ. ජ. (පාලන)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)	ප්‍රධාන කාර්යාලයට සහ දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
ප්‍ර. මූ. නි.	ප්‍රධාන මුල්‍ය නිලධාරී	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් අදාළ නීතිරීති සහ රෙගුලාසි වලින් පැවරී ඇති බලතල අනුව ගණන්දීමේ නිලධාරියා ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා සහය වීම.
වා. අ. (භෞ. ස. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ)	දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන නිසි පරිදි යොදා ගනිමින් යන්ත්‍රෝපකරණ සහ වාහන හැර අනෙකුත් සියලුම වත්කම් කළමනාකරණය කිරීම සහ සියලුම ගුරුත්ව වාරිමාර්ග ව්‍යාපාර නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.
වා. අ. (වා. ඵ. ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග ඵලදායිතා ප්‍රවර්ධන)	WAPHAULA ක්‍රියාත්මක වාරිමාර්ග ව්‍යාපාරවල සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය සමඟින් වාරි කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ WAPHAULA වැඩසටහන කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
වා. අ. (ප. ස. සහ ක්‍ර. ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන)	දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළව සහ අනෙකුත් විශේෂ ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රවේශය තුළින් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම.

වා. අ. (ජල. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල කළමනාකරණ)	ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට සහ ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවීන්ගේ සහභාගීත්වයෙන් වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාවයට, ඵලදායීතාවයට සහ තිරසාර කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සැලසීම.
වා. අ. (ග‍ං. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ගංගාධාර කළමනාකරණ)	භෞතික හා පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය සහ සහභාගීත්වය ඇතිව ගංගාධාර සංරක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම.
වා. අ. (ජල ග‍ං. වැ. හා ආ. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල ග‍ං වතුර වැළක්වීම සහ ආපදා කළමනාකරණ)	පහත් බිම්වල ජලාපවහන සහ ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් කුඹුරු වග කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම, ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මිනිස් ජීවිත, පොදු සහ පෞද්ගලික දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දීම.
වා. අ. (ජල. ස. සැ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල සම්පත් සැලසුම්)	සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධන ඉලක්ක දිගුකාලීනව සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන ජාතික ජල සම්පත් සැලැස්ම සකස් කිරීම, වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.
වා. අ. (ව්‍යා. සැ. හා නි.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ව්‍යාපෘති සැලසුම් සහ නිර්මාණ)	නව ජල සම්පත් සංවර්ධන යෝජනා හඳුනා ගැනීම, බහු විධ භාවිතයේ ශක්‍යතා පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම, විස්තරත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් සැපයීම.
වා. අ. (ඉ‍ං. වී. තා.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු විද්‍යා සහ තාක්ෂණික සේවා)	ඉංජිනේරු, විද්‍යාත්මක, ගණකාධිකාරී, පරිපාලන සහ ඉංජිනේරු සහකාර සේවයේ පරිපාලන කටයුතු සිදු කිරීම සහ අධීක්ෂණය.
වා. අ. (ඉ‍ං. භූ. වී.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු භූ විද්‍යා)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කරණය සඳහා අවශ්‍ය භූගත පරීක්ෂණ සහ අත්තිවාරම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික උපක්‍රම යෙදීම. ගොඩබිම සහ වෙරළ ආශ්‍රිතව විමර්ශන සඳහා උපදේශන සේවා සැපයීම., දැනට භාවිතයේ පවතින නිර්මිත වල කාන්දුවීම් සහ ස්ථායීතාවය ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
වා. අ. (ඉ‍ං. ද්‍රව්‍ය)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු ද්‍රව්‍ය)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, පස් වලින් ඉදි කරන වේලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ස්ථානවල තත්ත්ව විමර්ශනය සහතික කිරීම. විමර්ශනය කිරීම, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙන්ම අනෙකුත් අවශ්‍ය ආයතනවලට සේවා සැපයීම.

වා. අ. (තො. ස./ භූ. තො. තා.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන / භූගෝලීය තොරතුරු තාක්ෂණ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුව සියලුම අංශ , ශාඛා, කලාප සහ කොට්ඨාශ සඳහා පරිගණක සහ තොරතුරු තාක්ෂනය සම්බන්ධ සේවාවන් සැපයීම සහ අවශ්‍ය අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික සේවා,සහාය සහ පුහුණුව ලබා දීම.
වා. අ. (ජල වී සහ අපදා කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල විද්‍යා සහ අපදා කළමනාකරන)	ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකථනය සඳහා ජල විද්‍යාත්මක සහ කාලගුණික දත්ත රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම, ප්‍රධාන ගංගා සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම.
වා. අ. (ජල ශක්ති)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල ශක්ති)	වාරිමාර්ග ව්‍යාපෘතිවල ආදර්ශ අධ්‍යයනයන් සිදු කිරීම, විෂයය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනවලට උපදේශන සේවා සැපයීම සහ උපකරණ ඒකකය පවත්වාගෙන යාම.
වා. අ. (ක්‍ර. සැ. සහ සැ - මධ්‍යම)	වාරිමාර්ග අධ්‍යක්ෂ- (ක්‍රම සැලසුම් සහ සැලසුම් - මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අම්පාර යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රම සැලසුම් සහ සැලසුම් කටයුතු සිදු කිරීම.
වා. අ. (ක්‍ර. සැ. සහ සැ උෆ. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - උෆව කලාපය)	බදුල්ල, මොණරාගල, මඩකලපුව සහ හම්බන්තොට කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රමසැලසුම් සහ සැලසුම් කටයුතු.
වා. අ. (ක්‍ර. සැ. සහ සැ - උ. හා උ. මැද)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් -උතුරු හා උතුරු මැද කලාපය)	අනුරාධපුර, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රමසැලසුම් සහ සැලසුම් කටයුතු.
වා. අ. (වී. ඉදි)	වාරිමාර්ග අධ්‍යක්ෂ (විශාල ඉදි කිරීම්)	මහා පරිමාණ වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා. අ. (ප්‍රා. සං.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ප්‍රදේශීය සංවර්ධන)	මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා. අ. (වැ. කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩසටහන් කළමනාකරණ)	ප්‍රාග්ධන අයවැය සැලසුම් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම, වැඩසටහන සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සහාය වීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ අනෙකුත් වාර්ෂික හා කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම.
වා. අ. (කො. හා ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන)	වැඩ, භාණ්ඩ හා සේවා සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙපාර්තමේන්තුව තුල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීම.

වා. අ. (පුහුණු)	වාරිමාර්ග අධ්‍යක්ෂ (පුහුණු)	දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, ප්‍රධාන කාර්යාලය, කලාප සහ ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය, සියලුම කාණ්ඩවල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව බඳවා ගැනීමේ විභාග සහ කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සහ පැවැත්වීම.
වා. අ. (වැපො.හා ගොඩ)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩ පොදු හා ගොඩනැගිලි සේවා)	පාර්ලිමේන්තු උපදේශන කමිටු කටයුතු, මහජන පෙත්සම් යනාදී විවිධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම, රත්මලානේ පිහිටි නිල නිවාස,ප්‍රධාන කාර්යාලයය , අංක 34 පරිශය පරිපාලනය, නඩත්තු කිරීම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් සහ සම්පත් වෙන් කිරීමේ කටයුතු සිදු කිරීම.
වා. අ. (වා. අ. ආ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග අභ්‍යාස ආයතනය)	ඉංජිනේරු සහකාරවරුන් සඳහා වාරි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම, පුහුණු අංශයේ ඉල්ලීම මත සියලුම සේවා කාණ්ඩ සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවා පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම.
ක. වා. අධ්‍ය	කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ	කලාපයට අයත් සියලුම ප්‍රධාන, මධ්‍යම සහ අන්තර් පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපන කටයුතු, මෙහෙයුම් හා නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.
ප්‍රා. වා. ඉංජී.	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු	කලාපයට අයත් සියලුම ප්‍රධාන, මධ්‍යම සහ අන්තර් පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රම පුනරුත්ථාපන කටයුතු, මෙහෙයුම් හා නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම, කලාපයට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු කර්යාල අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අධ්‍ය (ඉ. පරි)	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ)	වාරිමාර්ග සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති වල ඉඩම් පරිහරණය තීරණය කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක විද්‍යාත්මක තොරතුරු සැපයීම.
අධ්‍යක්ෂ (පරිපාලන)	අධ්‍යක්ෂ (පරිපාලන)	පරිපාලන කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් (පරිපාලක) ට සහාය වීම.
යා. අධ්‍ය. (ප්‍ර. කා. සහ ද.)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (ප්‍රධාන කාර්යාලය සහ දකුණ)	ප්‍රධාන කාර්යාලය, කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ මොණරාගල යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ද යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (මධ්‍යම)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම, බදුල්ල, අම්පාර සහ මඩකලපුව යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.

යා. අධ්‍ය. (උතුරු මැද)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (උතුරු මැද)	අනුරාධපුර, පොළොන්නරුව, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
ප්‍ර. ග. (මූල්‍ය)	ප්‍රධාන ගණකාධිකාරී (මූල්‍ය)	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරීට සහාය වීම.
ප්‍ර. ග. (ගිණුම් හා ඇස්.)	ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ඇස්තමේන්තු)	වාර්ෂික ඇස්තමේන්තු, ගිණුම්, වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා සකස් කිරීම, දෙපාර්තමේන්තු සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ යටතේ ලැබෙන ප්‍රතිපාදන පාලනය සහ අධීක්ෂණය, මාසික වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

1.5. දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ

1. විමර්ශන, සැලසුම් සහ නිර්මාණ අංශය
2. ඉදිකිරීම් සහ සංවර්ධන අංශය
3. ක්‍රම සැලසුම් අංශය
4. ගංගාධාර කළමනාකරණ අංශය
5. පාලන අංශය
6. මූල්‍ය අංශය

මීට අමතරව පහත සඳහන් අංශයන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

1. වැඩසටහන් කළමනාකරණ අංශය
2. කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන අංශය
3. අභ්‍යන්තර විගණන අංශය
4. පුහුණු හා හැකියා ප්‍රවර්ධන අංශය
5. වැඩ පොදු හා ගොඩනැගිලි අංශය
6. යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය
7. වාරිමාර්ග අභ්‍යාස ආයතනය - ගල්ගමුව

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහයට කුඩා කාර්ය මණ්ඩලයක් සිටින අතර, ඔවුන් වැඩකටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙයට අමතරව අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නිල බලයෙන් සහභාගි විය යුතු රැස්වීම් වලට අදාළ ලියකියවිලි පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය

- 2020 යල කන්නය අවසානයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල ජල ධාරිතාවය 40%ක් විය. 2020/21 මහ කන්නය සඳහා වගා කිරීම ආරම්භ කළ අතර මුළු බිම් ප්‍රමාණයෙන් 94%ක් සාර්ථකව වගා කරන ලදී. 2021 යල කන්නය ආරම්භයේදී ජලාශවල ධාරිතාවය 70%ක් වූ අතර නිසි ජල කළමනාකරණය හේතුවෙන් 84%ක භූමි ප්‍රමාණයක් සාර්ථකව වගා කිරීමට හැකි විය.

- 2021 යල කන්නයේ වගාවෙන් පසු ජලාශවල ඉතිරිව තිබූ ජලය භාවිතා කරමින් 3 වන කන්නය සඳහා අතිරේක භෝග අක්කර 72,800ක් වගා කිරීමට හැකි විය. 2020/21 වසර සඳහා වගා තීව්‍රතාවය 189% ලෙස වැඩි කිරීමට හැකි විය.

- වසර 40කට පසු මඩකලපුව දිස්ත්‍රික්කයේ රූගම් ජලාශය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස මාස දෙකේ වී වර්ගයක් හෙක්ටයාර 60කට අධික ප්‍රමාණයක වගා කරන ලදී. හෙක්ටයාරයකට මෙ.ටොන් 4.15ක සාමාන්‍ය අස්වැන්නක් ලබා ගනිමින් එය සාර්ථක විය. තව ද, රටේ පවතින අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 365කට අධික ප්‍රමාණයක කහ වගා කරන ලදී.

- වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන සඳහා 90%ක මූල්‍ය ප්‍රගතියක් රට පුරා පැවති වසංගත තත්ත්වය යටතේ අත්කර ගැනීමට හැකි විය.

- වාරිමාර්ග හා ජලාපවහන පිළිබඳ ජාත්‍යන්තර කොමිසම (ICID) විසින් පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම, සොරොව්ව සහ ඇතිමලේ වැව 2021 වර්ෂයේදී ICID ලෝක උරුම නිර්මිත ලෙස පිළිගෙන ඇත.

- ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල අතර සන්නිවේදනය සඳහා Zoom, Whatsapp, Viber, Microsoft teams වැනි මෙවලම් ඵලදායී ලෙස භාවිත කිරීමට හැකි විය.

- එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන් (UNV) ශ්‍රී ලංකා ආයතනය විසින් UNV 50 සම්මානය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පිරිනමන ලදී. ඉදිරිපත් කර තිබූ අති විශාල අයදුම්පත් සංඛ්‍යාවක් අතරින්, ස්වේච්ඡා සේවය තුළින් වසර ගණනාවක් සමාජයට කරන ලද දායකත්වය සඳහා රාජ්‍ය අංශයේ කාණ්ඩය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්මානය පිරිනැමීම සඳහා තෝරා ගෙන ඇත.

- දිවංගත වාරිමාර්ග අධ්‍යක්ෂ ඉංජිනේරු. ඒ.ජේ.පී. පොන්රාජා මහතාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ ක්‍රම සැලසුම්, සැලසුම් සහ ඉදිකිරීම් සඳහා වූ තාක්ෂණික මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීම අවසන් කරන ලදී. මෙතෙක් ක්‍රියාත්මක කරන ලද විවිධ නව ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ව්‍යාපෘති නිම කිරීමෙන් ලැබූ අත්දැකීම් නව තාක්ෂණික මාර්ගෝපදේශ සංග්‍රහයට ඇතුළත් කර ඇත. නව තාක්ෂණික මැදිහත්වීම් සහ ප්‍රවේශයන් හඳුන්වා දී ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2020-2030 කාලසීමාව සඳහා ජල සම්පත් සංවර්ධන හා කළමනාකරණය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇත. එය අදියර දෙකකින් සමන්විත වේ. පළමු අදියර දැනට පවතින ජල සම්පත් යටිතල පහසුකම් සහ ජාතික සංවර්ධන ඉලක්ක, ආංශික අවශ්‍යතා සහ දැනට ක්‍රියාත්මක සහ සැලසුම් කර ඇති ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති මත පදනම් වූ ප්‍රමුඛතා සහිත ගංගා ද්‍රෝණි සමූහයක් ඇතුළත් විස්තීර්ණ දත්ත සමුදායක් වන අතර දෙවැන්න 2021-2025 කාලය සඳහා ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය සඳහා මූලික වාර්තාවක් සහ උපායමාර්ගික සැලැස්ම වේ.

- අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගල් ඔය ජලාශයේ ඉදිකිරීම් අවසන් කර මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු වෙත භාර දෙන ලදී.

- වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් අවසන් කිරීමට හැකි විය. දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය, රඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මැණික් ගඟ හැරවීමේ ව්‍යාපෘතිය, යෝධ වැව යටතේ ඇති පෝෂක වැව් ප්‍රතිසංස්කරණය කිරීම, කවුඩුල්ල අදියර II දීර්ඝ කිරීම සහ ගිං ගඟ ගංවතුර නියාමන ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම එම ව්‍යාපෘති වේ.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව සෘජු ශ්‍රම දායකත්වයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නව ජලාශ ඉදිකිරීම ආරම්භ කර ඇත.

    - අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහළ මල්වතු ඔය ජලාශය
    - මාතලේ දිස්ත්‍රික්කයේ වත්තේගෙදර ජලාශය
    - රත්නපුර දිස්ත්‍රික්කයේ ඇල්ලේ වැව
    - අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඩාවිලච්චිය ජලාශය
    - මොණරාගල දිස්ත්‍රික්කයේ උරුළු ජලාශය

- ලෝක බැංකුව මගින් අරමුදල් සපයන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘති අම්පාර, අනුරාධපුර, මඩකලපුව, හම්බන්තොට, මහනුවර, කුරුණෑගල, මන්නාරම, මොණරාගල, පොළොන්නරුව, පුත්තලම සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල විසිරී ඇති කලාප 11ක ප්‍රධාන වාරි යෝජනා ක්‍රම 43ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජාතික තරඟකාරී ලංසු තැබීම්, වෙළඳපොළ සැදැහුම් (shopping) සහ ගොවි සංවිධාන කොන්ත්‍රාත්තු මගින් රුපියල් මිලියන 10,261.5ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ කොන්ත්‍රාත්තු පැකේජ 701ක් සම්පූර්ණ කරන ලද අතර, ඒ සඳහා වැය කළ මුදල රු.මි. 9,836.53 වේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2021 දී ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. කෙටි කාලීන ගංවතුර පාලනය අඛණ්ඩව සහතික කිරීමට සහ ගංවතුර හා නියඟයේ බලපෑම අවම කිරීමට අවශ්‍ය හදිසි දේශගුණික බලපෑම් අවම කිරීමේ ආයෝජන ක්‍රියාත්මක කිරීම මෙම සංරචකය යටතේ ක්‍රියාත්මක විය.

- ලවණතාවය කැලණි ගඟ දිගේ ඉහළට ඒම වැළැක්වීම සඳහා කැලණි ගඟ හරහා අඹතලේ දී ඉදිකිරීමට යෝජිත ලවණතා බාධකයේ සවිස්තරාත්මක සැලසුම් සම්පූර්ණ කර ඇත. යෝජිත ව්‍යුහය ගංවතුරේ බලපෑම අවම කිරීම සඳහා කඩා වැටෙන ආකාරයේ දොරටු (පහළට ඇරෙන ගේට්ටු) සහ බෝට්ටු පසුකර යාම සඳහා අගුළු දොරටුවකින් සමන්විත වේ.

- කළුගඟ ද්‍රෝණියේ මගුර ප්‍රදේශයේ නව ජලවිද්‍යාත්මක මිනුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. ගිරිඋල්ල, කිතුල්ගල සහ රත්නපුර යන ප්‍රදේශවල දැනට පවතින ජලවිද්‍යාත්මක මිනුම්වල වැඩිදියුණු කිරීම් සාර්ථකව නිම කරන ලදී.

- මුළු දිවයිනම ආවරණය වන පරිදි සම වර්ෂාපතන අස්වැන්න වක්‍ර සහ තිව්‍රතාවය, කාලය, සංඛ්‍යාත වක්‍ර සකස් කරන ලදී. වර්ෂාපතන සම්භාවිතය, මුළු දිවයින සඳහාම වාෂ්පීකරණ - උත්ස්වේදන සංගුණක (ET0) ගණනය කිරීම සම්පූර්ණ කරන ලදී.

- යන්ත්‍රෝපකරණ අංශය ශක්තිමත් කිරීම සඳහා නව යන්ත්‍රෝපකරණ සැපයීම.

    - රු.මි. 80ක් වටිනා දිය ගොඩ දෙකෙහිම ක්‍රියාකළ හැකි කැණීම් යන්ත්‍ර 02ක් මිල දී ගන්නා ලදී.
    - 200 පන්තියේ කැණීම් යන්ත්‍රය සඳහා ගල් කඩනඇමුණුම් 03ක් සැපයීම - පිරිවැය රු.මි. 7.5කි.
    - රෝද සහිත කැණීම් යන්ත්‍ර ඒකක 04ක් සැපයීම මගින් යන්ත්‍ර ප්‍රමාණය වැඩි කිරීම - පිරිවැය රු.මි. 112කි.
    - බැකෝ ලෝඩර් ඒකක 04ක් සැපයීම - පිරිවැය රු.මි. 64කි.
    - 200 පන්තියේ ගැඹුරු කැණීම් කළ හැකි උපාංග සහිත කැණීම් යන්ත්‍ර ඒකක 04ක් සැපයීම – පිරිවැය රු.මි. 72

- නව ද්විත්ව කැබ් රථ 05ක් සැපයීම මගින් වාහන අංශය ශක්තිමත් කිරීම.

- ජාතික ඵලදායිතා සම්මානය දෙවන ස්ථානය හල්පාතොට යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය කාර්යාලය විසින් දිනා ගන්නා ලදී.

- රඹෑව, කන්තලේ සහ මාපාකඩ වැඩමුළු සඳහා නව පට්ටල යන්ත්‍ර සැපයීම.

- හල්පාතොට සඳහා නව වාහන නීන්ත ආලේපන කුටීරයක් ස්ථාපනය කිරීම.

- අම්පාර යාන්ත්‍රික ඉංජිනේරු වැඩපොළ සඳහා නව කාර්යාලය සහ වැඩපොළ ගොඩනැගිල්ල ඉදිකිරීම.

- 2021/22 මහ කන්නයේ කාබනික පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2021 යල කන්නයේ වප් හවුල වැඩසටහන යටතේ ඇති සියලුම ව්‍යාපාර වල කාබනික පොහොර මෙට්‍රික් ටොන් 5ක් නිෂ්පාදනය කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇත. එයින් මෙට්‍රික් ටොන් 4ක් සාර්ථකව නිෂ්පාදනය කිරීමට හැකි විය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගතකොට දැක්විය හැකිවේ.

මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

01 දැදුරු ඔය ජලාශය

02 මැණික් ගඟ ජලාශය

03 රඹුක්කන් ඔය ජලාශය

04 යාන්ඔය ව්‍යාපෘතිය

05 පහළ උමව ව්‍යාපෘතිය

06 මහගෝන වැව ව්‍යාපෘතිය

07 මොරාණ ජලාශය

08 ඇල්ල වැව ජලාශය

09 කළුගල්ඔය ජලාශය

10 කුඹුක්කන්ඔය ජලාශය

11 රූගම් කිතුල් ජලාශය (මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය)

12 පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය

13 මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)

14 කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

15 ගොඩිගමුව වැව සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

16 කැළණි, මුන්දෙනි ආරු, කළුගඟ, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය

17 මන්නාරම දිස්ත්‍රික්කයේ යෝධ වැව යටතේ වන පෝෂිත වැව් ප්‍රතිසංස්කරණය කිරීම

18 වඩමාරච්චි කලපුවේ ජල සම්පත් සංවර්ධනය තුලින් යාපන අර්ධද්වීපයේ ජනතාවට පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය

19 කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම

20 දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම

21 විලකණ්ඩිය ජලාශය

22 කවුඩුල්ල දීර්ඝ කිරීම අදියර 11 - වම් ඉවුර ඇලෙහි දම්සෝපුර වැව දක්වා දීර්ඝ කිරීම

23 මහගල්ගමුව වැව වැඩිදියුණු කිරීම

24 ගිංගඟ ගං වතුර පාලන ව්‍යාපෘතිය පුනරුත්ථාපනය

25 බෙන්තර ගඟ දකුණු ඉවුර ජලාපවහන හා කරදිය වැළැක්වීමේ ව්‍යාපාරය

26 ග්‍රාමීය වැව් පුනරුත්ථාපනය කිරීම

1. දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 13,540	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කුරුණෑගල, පුත්තලම
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 75 හෙක්ටයාර 10,932
ව්‍යාපෘති කාලය	2005-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 12,500
ප්‍රතිපාදන 2021	රු.මි. 565	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 50
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 13,431.85	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.46%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 556.105		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• නිර්මිතද ඇතුළුව සෙංගල් ඔය ඇළ ඉදිකිරීම. • දැනට පවතින සෙංගල් ඔය අමුණ වැඩිදියුණු කිරීම. • දැදුරු ඔය ව්‍යාපෘතියේ වම් හා දකුණු ඉවුරු ඇළ පද්ධතියේ ඉතිරි වැඩ. • ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම අඛණ්ඩව සිදු කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවි පවුල් 12,500කට අයත් ඉඩම් හෙක්ටයාර 10,932 සඳහා දෙකන්නය වගා කිරීමට වාරි ජල පහසුකම් සැපයීම. • කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පවුල් 100,000ක් සඳහා පානීය ජලය සැපයීම. • මෙගා වොට් 1.5ක ජල විදුලි උත්පාදනය.		

2. මැණික් ගඟ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොනරාගල, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 75 හෙක්ටයාර 4,150
ව්‍යාපෘති කාලය	2006 - 2021	**ප්‍රතිලාභීන්**	පවුල් 11,000
ප්‍රතිපාදන 2021	රු.මි. 50.00	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,196.5	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 45.24		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දෙබරවැව ඇළ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම. • තිසාවැව ව්‍යාපාරයේ ඇළ පද්ධතියේ තෝරා ගත් ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම. • යෝධවැව ව්‍යාපාරයේ ඇළ පද්ධතියේ තෝරා ගත් ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම. • හඟුන් ආර පෝෂක ඇළෙහි කි.මී 4 සහ 5 ප්‍රතිසංස්කරණය කිරීම. • කරවිල වැව සහ මයිලගම වැව අතර ජල පාලන නිර්මිතයක් ඉදිකිරීම. • මයිලගම වැවේ 0+000 සිට 0+600 දක්වා රළපනාව ඉදිකිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ගොවි පවුල් 6,000කට අයත් හෙක්ටයාර 4,150ක් දෙකන්නය වගා කිරීම සඳහා වාරි ජලය ලබා දීම. • කතරගම ප්‍රදේශයේ පවුල් 5,000කට පානීය ජලය ලබා දීම.		

3. රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 3,970	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 56.1 හෙක්ටයාර 1,477
ව්‍යාපෘති කාලය	2006-2021	**ප්‍රතිලාභීන්**	පවුල් 1,000
ප්‍රතිපාදන 2021	රු.මි. 5	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	ව්‍යාපෘතිය අවසන් කොට ඇත.
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 3,964.796	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	100%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2.486		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	රඹකැන් ඔයේ රේඩියල් ගේට්ටු සවි කිරීම සඳහා වූ ඉතිරි ගෙවීම් සිදු කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඉඩම් හෙක්ටයාර 1,420 ක් සඳහා වී සහ අනෙකුත් බෝග සඳහා වාරි ජල පහසුකම් සැපයීම. • මහ ඔය ප්‍රදේශයේ ජනතාව ට පානීය ජලය සපයීම. • නගර හා සම්බන්ධ වන අභ්‍යන්තර මාර්ග සංවර්ධනය. • මිරිදිය ධීවර කර්මාන්තයේ සංවර්ධනය. • කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් සඳහා, නිසි ජල කළමනාකරණය, ප්‍රජාවන් සංවර්ධනය කිරීම වැනි පුහුණු වැඩසටහනක් පැවැත්වීම.		

4. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 48,355.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර සහ ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 169 පවතින ප්‍රදේශ - හෙක්ටයාර 8,700 නව ප්‍රදේශ - හෙක්ටයාර 345
ව්‍යාපෘති කාලය	2012-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 9,000
ප්‍රතිපාදන 2021	රු.මි. 4,231	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,800
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36,274.771	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	82.35 %
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,689.405		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දකුණු ඉවුරු ප්‍රධාන ඇළේ නිර්මිත ඉදිකිරීම. • කොහොඹගස් වැව, ඉස්සන් වැව සහ ඔමරකඩ වැව වැඩිදියුණු කිරීම සහ ඒ යටතේ වාරි පද්ධතිය වැඩි දියුණු කිරීම. • නව ඉඩම් සඳහා වාරි ජල පහසුකම් සැපයීම. • නැවත පදිංචි කිරීම් සහ ඉඩම් අත්පත් කර ගැනීම.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව ඉඩම් හෙක්ටයාර 345කට වාරි ජල පහසුකම් සපයා දීම. • වගා ඉඩම් හෙක්ටයාර 8,700ක වගා තීව්‍රතාවය වැඩි කිරීම සඳහා වාරි ජල පහසුකම් සැපයීම . • අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 8 කාපට් මාර්ගය සහ කිලෝමීටර 40 බොරළු මාර්ග සංවර්ධනය කිරීම. • නගර සංවර්ධනය යටතේ ගම්මාන 4ක් සංවර්ධනය කිරීම. (ප්‍රජා ශාලා, මොන්ටිසෝරි, සේවා පියස ආදී වූ යටිතල පහසුකම් සංවර්ධනය). • කිලෝමීටර 16ක දිගින් යුතු අලි වැට ඉදිකිරීම.

5. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1,250	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	වටගල ආර - අක්කර අඩි 200 මල්ලිපොත - අක්කර අඩි 745 දෙබර ආර - අක්කර අඩි 973
ව්‍යාපෘති කාලය	2007 - 2022	**ප්‍රතිලාභීන්**	වටගල ආර - පවුල් 32 මල්ලිපොත - පවුල් 250 දෙබර ආර - පවුල් 72
ප්‍රතිපාදන 2021	රු.මි. 300	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 150
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 686.692	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	77.51%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 44.853		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දෙබර ආර පෝෂිත ඇළ ඉදිකිරීම. • මල්ලිපොත ඇළ පද්ධතියේ සැලසුම් කටයුතු සිදුකිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	නව සහ පවත්නා ඉඩම් හෙක්ටයාර 310ක් සඳහා දෙකන්නය වගා කිරීමට වාරිමාර්ග පහසුකම් සැලසීම.		

6. මහගෝන වැව ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 235	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 0.78
ව්‍යාපෘති කාලය	2012 – 2022	**ප්‍රතිලාභීන්**	පවුල් 200
ප්‍රතිපාදන 2021	රු.මි. 50	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 15
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 221.867	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.03%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 36.193		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• දකුණු ඉවුරු ඇළ 0+165 සිට 2+495 දක්වා 99% දක්වා ඉදිකිරීම සහ දකුණු ඉවුර ඇළෙහි ව්‍යුහයන් ඉදිකිරීම අවසන් කර ඇත. • 77% දක්වා ක්ෂේත්‍ර ඇළවල් (FC03, FC04, FC05, FC06) ඉදිකිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	පවතින සහ නව ඉඩම් හෙක්ටයාර 82ක් සඳහා වාරි ජලය සැපයීම.		

7. මොරාණ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 16 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	2012-2022	**ප්‍රතිලාභීන්**	පවුල් 1,300
ප්‍රතිපාදන 2021	රු.මි. 400	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 270
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,572.843	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	95.1%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 209.62		
2021 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන	• වැව් බැම්මේ, ඇළ පද්ධතියේ, පිටවානේ, සොරොව්වේ අවසන් අදියරේ වැඩ. • ඉඩම් පවරා ගැනීම, නැවත පදිංචි කිරීම සහ සංවර්ධනය කිරීම විධිමත් කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඉඩම් හෙක්ටයාර 570කට සහ පවුල් 1300කට වාරි ජලය සැපයීම. • පවුල් 500කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 25ක මාර්ගයක් ඉදිකිරීම. • මීමැසි පාලනය හා මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම. • නිවාස නොමැති ආබාධිත පවුලක් සඳහා ව්‍යාපෘතිය හරහා නිවසක් ඉදිකිරීම. • ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමක් ලෙස ප්‍රජා ශාලා දෙකක් ඉදිකිරීම, තැපැල් කාර්යාල ඉදිකිරීම, යාල්වෙල සහ කුඩාලුණු විද්‍යාල වලට ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම. • නැවත වන වගා වැඩසටහන.		

8. ඇල්ල වැව ජලාශය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1,532.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	රත්නපුර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය**	ඝන මීටර මිලියන 1.91 පවතින ඉඩම් අක්කර 1,127ක් සහ නව ඉඩම් අක්කර 350ක්
ව්‍යාපෘති කාලය	අවුරුදු 03	**ප්‍රතිලාභීන්**	පවුල් 4,000
ප්‍රතිපාදන 2021	රු.මි. 250	**2022 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 200
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 168.652	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	8.42%
2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 168.652		
අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම			
1.6	වෙනත්			
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	සිගාස් වැඩසටහන යටතේ බැරකම් යාවත්කාලීන කරනු ලැබේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	කලාප කාර්යාල සහ අනෙකුත් අංශ මඟින් පිළිතුරු ගෙන්වා ගැනීමේ දී ප්‍රමාදයන් සිදුවේ	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අදාළ ආයතන කඩිනමින් පිළිතුරු ලබා නොදීම	සිහි කැඳවීම් නිකුත් කිරීම සහ විගණන කළමනාකරණ කමිටුවේ අවධානයට යොමු කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 වසංගතය හමුවේ තුන්වන විගණන කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි වීම	zoom තාක්ෂණය ඔස්සේ ඉදිරි රැස්වීම් පැවැත්වීම
8	**වත්කම් කළමනාකරණ කමිටු**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	වාහන ආනයන සීමා නිසා ගර්හිත වාහන උපරිම වශයෙන් අලුත්වැඩියා කිරීමට උත්සහ කිරීම	කාලය වසරක් දක්වා දීර්ඝ කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	වාහන භාවිතයේදී එන්ජින් ගෙවීම නිසා ඉන්ධන කාර්යක්ෂමතාව අඩුවන බැවින් නැවත නැවත ඉන්ධන පරීක්ෂාවෙන් රජයට අවාසියක් මිස වාසියක් සිදු නොවීම	ඉන්ධන දහන අසාමාන්‍ය වන අවස්ථාවේදී පරීක්ෂා කර නිවැරදි කිරීම
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල නොවේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම			ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම			මූ.රෙ.571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම		ක්‍රියාමාර්ග ගනිමින් පවතී	

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

நீர்ப்பாசன அமைச்சின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்

Projects Implemented under the Ministry of Irrigation

1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන/ மகாவலி நீர் பாதுகாப்பு முதலீட்டு நிகழ்ச்சித் திட்டம்/ Mahaweli Water Security Investment Program (MIWSIP)





වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட **மேல்** மாகாண கால்வாய் கருத்திட்டம்/ North Western Province Canal Project (NWPCP)





උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ **வட மத்திய மாகாண கால்வாய்** North Central Province Canal Project (NCPCP)






මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය/ மினிபே இடக் கரை கால்வாய் மறு சீரமைப்பு / Minipe Left Bank Canal Rehabilitation Project (MLBCRP)

2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය/ உமா ஓய பல் நோக்கு அபிவிருத்தி கருத்திட்டம்/ Uma Oya Multipurpose Development Project



පුහුල්පොල වේල්ල/ புஹுல்பொல அணைக்கட்டு/ Puhulpola Dam



ඩයරබා ජලාශය/ டயரபா அணைக்கட்டு/ Dyaraba Dam





ඉහළ පීඩන උමග/ **மேல் அழுத்த சுரங்கப்பாதை/** Upper Pressure Tunnel (UPT)

3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය/மொரகஹகந்த களு கங்கை நீர்த்தேக்க கருத்திட்டம்/ Moragahakanda Kaluganga Reservoir Project



මොරගහකන්ද ජලාශය/ மொரகஹகந்த நீர்த்தேக்கம்/ Moragahakanda Reservoir



කළුගඟ ජලාශය/ களு கங்கை நீர்த்தேக்கம்/ Kaluganga Reservoir




ගුරුවෙල නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය/ **குருவெல முள்குடியேற்ற பிரதேசம்/** Guruwela resettlement area

4. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය/ **கால நிலை தாக்கங்களை தணிக்கும் கருத்திட்டம் / Climate Resilience Improvement Project (CRIP)**




පේරාදෙණිය වෙන්කලාඩි මාර්ගයේ හග්ගල නාය යන ස්ථාන වැඩිදියුණු කිරීම/ பேராதனை செங்கலடி வீதியின் ஹக்கல மண்ணரிப்பு இடப் பகுதியை மறு சீரமைத்தல்/ Rectification of Land Slide along the Peradeniya Chenkaladdi Road in Haggala

බත්තුලුඔය - උඩප්පුව - ඇන්ඩිමුනෙයි පාරේ උදප්පුව නගරයේ නව පාලමක් ඉදිකිරීම/ பத்துலு ஓய - உடப்புவ - அண்டிமுனை பாதையிலுள்ள உதப்புவ நகரில் புதிதாகப் பாலமொன்றை நிர்மாணித்தல்/ Construction of new bridge at Udappuwa town on Baththuluoya – Udappuwa – Andimunai Road

5. ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය/ **வினைத் திறனை மேலுயர்த்தும் மற்றும் நீர்ப்பாசன தொகுதிகளின் திறனை மேம்படுத்தும் கருத்திட்டம்/ Productivity Enhancement and Irrigation System Efficiency Improvement Project (PEISEIP)**




පැරෂුට් තැටි බෙදා හැරීම සහ පිටියේ තැබීම - මහනුවර දිස්ත්‍රික්කය/ **பாராசூட் தட்டுக்களை விநியோகித்தல் மற்றும் களத்தில் வைப்பது - கண்டி மாவட்டம்/** Distributing Parachute Trays and Placing them on field – Kandy District

6. දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ජීකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය/ கால நிலை மாற்றங்களுக்கு இயைபாக்கமடைவதற்கான ஒருங்கிணைந்த நீர் முகாமைத்துவ கருத்திட்டம்/ **Climate Resilient Integrated Water Management Project (CRIWMP)**



ගලේගම වැව - අළුත්හල්මිල්ලෑව එල්ලංගා පද්ධතිය/ **கலேகம வெவ - கசிவு - அழுத்ஹல்மிலேவா அருவி அமைப்பு/** Galegama Wewa – Spill - Aluthhalmillewa Cascade System



ඇතබැඳිවැව කුඩා වැව - ඇතබැඳිවැව එල්ලංගා පද්ධතිය/ **அதபெந்திவெவ குடவெவ - அதபெந்திவெவ அருவி அமைப்பு/** Athabendiwewa Kudawewa - Athabendiwewa Cascade System

7. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය / தல்பிட்டிகல நீர்த்தேக்க கருத்திட்டம் / **Thalpitigala Reservoir Project**



භූවිද්‍යාත්මක පරීක්ෂණ/ புவிச் சரிதவியல் ஆராய்ச்சிகள்/ Geological Investigation



මාර්ග ඉදිකිරීම/ பாதைகளின் நிர்மாணிப்புப் பணிகள்/ Road Construction

8. මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය/ மல் வது ஓய, மாதுரு ஓய மற்றும் கும்புக்கன் ஓய ஆற்றுப் படுக்கையுடன் தொடர்புடையதாக நிலக் கீழ் நீர் கண்காணிப்பு வலையமைப்பொன்றை நிலை நாட்டும் முதல் நிலை கருத்திட்டம்/ **Pilot Project on Establishment of Groundwater Monitoring Network in Malwathu Oya, Maduru Oya & Kumbukkan Oya River Basins**



පරීක්ෂණ ළිං කැණීම/ **கண்காணிப்பு கிணறு தோண்டுதல்**/ Drilling of Monitoring well



සම්පූර්ණ කරන ලද වැසි මාපකය සමඟ පරීක්ෂණ ළිං අඩවිය / **மழை மானியுடன் கூடிய கண்காணிப்பு கிணறு தளம்**/ Completed Monitoring Well Site with Rain Gauge

9. නුවරඑළියේ බැරැක්කැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම/ **நுவரெலியா பெரெக்தென்ன குளத்தை மறு சீரமைத்தல்/ Restoration of Barrack Plain Tank in Nuwara Eliya**



වැවේ රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම/ **குளத்தில் உள்ள வண்டல் மண்ணை தோண்டி அகற்றுதல்**/ Excavation & removal of silt in tank



10. මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය/ **மாதுரு ஓய வலக் கரை அபிவிருத்திக் கருத்திட்டம் /Maduru Oya Right Bank Development**





ප්‍රධාන ඇල ඉදිකිරීම/ **பிரதான கால்வாய் கட்டுமானம்/** Construction of Main Canal

11. පැලවත්ත ලංකා සීනි සමාගමේ පර්යන්ත ප්‍රදේශ ජනාවාස භූමියෙහි වාරි සංවර්ධන සැලැස්ම/ **பெலவத்த லங்கா சீனி நிறுவனத்தின் தங்குமிடப் பிரதேசத்தின் குடியேற்ற நிலத்தின் பாசன செயற்பாடுகளை மேம்படுத்தும் திட்டம்/ Peripheral area of settlers in Pelawatta Sugar Plantation area**





මාන්කඩ වැව ඉදිකිරීම/ **மண்கட குளம் நிர்மாணிப்பு/** Construction of Mankada wewa

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

நீர்ப்பாசனத் திணைக்களத்தின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்

Projects Implemented under the Irrigation Department

1. දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය/ தெதுறு ஓயா நீர்த்தேக்கம்/ Deduru Oya Reservoir Project



දැදුරු ඔය ජලාශය/ தெதுறு ஓயா நீர்த்தேக்கம்/ Deduru Oya Reservoir



ප්‍රධාන ඇල මාර්ගය - වම් ඉවුර/ LB கால்வாய்/ Left bank main canal

2. මැණික් ගඟ ජලාශ ව්‍යාපෘතිය/ மாணிக்க கங்கை நீர்த்தேக்கம்/ Menik Ganga Reservoir



හඟුන් ආර පෝෂිත ඇල ඉදිකිරීම/ ஹங்குன் ஆர ஊட்டி கால்வாயை புனரமைத்தல்/ Construction of Hangunara feeder canal



3. රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය/ ரம்புக்கன் ஓயா நீர்த்தேக்கம்/ Rambukkan Oya Reservoir Project



රඹුක්කන් ඔය ජලාශයේ වේල්ල/ ரம்புக்கன் ஓயா அணை/ Rambukkan oya dam



රඹුක්කන් ඔය ජලාශයේ පිටවාන/ ரம்புக்கன் ஓயா ஸ்பில் வே/ Rambukkan oya Spill way

4. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය/ யான் ஓயா நீர்த்தேக்கத் திட்டம்/ Yan Oya Reservoir Project



ඉස්සන් වැව සොරොව්ව ඉදිකිරීම/ இஸ்ஸன் குளம் மதகு நிர்மாணிப்பு/ Construction of Issan Wewa Sluice



ඉස්සන් වැව වැව් බැම්ම ඉදිකිරීම/ இஸ்ஸன் குளக்கட்டு நிர்மாணிப்பு/ Construction of Issan Wewa tank bund





කොහොඹගස් වැව ඇළ පද්ධතිය ඉදිකිරීම සහ සංවර්ධිත කුඹුරු/ கொஹோம்பகஸ் வெவா கால்வாய் அமைப்பு மற்றும் அபிவிருத்தி செய்யப்பட்ட வயல் நிலங்களை நிர்மாணித்தல்/ Construction of Kohombagas Wewa canal system and the developed paddy lands

5. පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය/ கீழ் ஊவா திட்டம்/ Lower Uva Project





දෙබර ආර පෝෂිත ඇල ඉදි කිරීම/ டெபரா அரா ஊட்டி கால்வாய் அமைத்தல்/ Construction of Debara ara feeder canal

6. මහගෝන වැව ව්‍යාපෘතිය/ மஹாகோண வாவி திட்டம்/ Mahagona Wewa Project



ක්ෂේත්‍ර ඇල අංක 3 ඉදිකිරීම/ வயல் கால்வாய் கட்டமைப்பின் கட்டுமானம் FC03/ Construction of field canal structure FC03



ප්‍රධාන ඇල ඉදිකිරීම/ பிரதான கால்வாய் அமைத்தல்/ Construction of main canal

7. මොරාණ ජලාශ ව්‍යාපෘතිය/ மொறான நீர்த்தேக்கம்/ Morana Reservoir Project



තිස්සපුර වැව/ திஸ்ஸபுர குளம்/ Thissapura Tank



ප්‍රධාන ඇළ (10 වන කි.මී)/ பிரதான கால்வாய் 10வது கி.மீ/ Main Canal at 10th Km



තුන්වන බෙදුම් ඇලෙහි නිර්මාන/ டி3 கால்வாயில் புல்தரை/ Turfing in D3 Canal



නාගදීප ඇළ/ நாகதீப கால்வாயில் R/W மற்றும் குளிக்கும் படி/ R/W and Bathing step at Nagadeepa canal

8. ඇල්ල වැව ජලාශය/ எல்ல வாவி நீர்த்தேக்கம்/ Ella Wewa Reservoir



වේල්ලෙහි කැණීම් කටයුතු සහ සොරොව්වේ ඉදි කිරීම් කටයුතු/ அணை தோண்டுதல் மற்றும் மதகு கட்டுதல்/ Dam excavation and sluice construction



සොරොව්ව ඉදි කිරීම් කටයුතු/ மதகு கட்டுமானம்/ Sluice Construction

9. කළුගල්ඔය ජලාශ ව්‍යාපෘතිය/ களுகல் ஓயா நீர்த்தேக்கத் திட்டம்/ Kalugal Oya Reservoir Project



පිටවාන/ கசிவுபாதை/ Spill way



කළුගල්ඔය ජලාශය /அணைகட்டு/ Dam

10. කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය/ கும்புக்கன் ஓயா நீர்த்தேக்கம்/ Kumbukkan Oya Reservoir Project



මිනුම් කටයුතු/ கணக்கெடுப்பு பணி/ Surveying work



භූ විද්‍යා විමර්ශන/ புவியியல் ஆய்வுகள்/ Geological Investigations

11. මුන්දෙනි ආරු ගංඟාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල්)/ **முன்தெனி ஆறு ஆற்று வடிநீர் மேம்பாட்டுத் திட்டம் (ருகம் கிதுல்)/ Mundeni Aru River Basin Development Project (Rugam-Kithul)**





භූ විද්‍යා විමර්ශන / புவியியல் ஆய்வுகள்/ Geological Investigation

12. පොළොන්නරු දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය/ பொலன்னறுவை மாவட்ட நீர்ப்பாசன அபிவிருத்தித் திட்டம்/ **Polonnaruwa District Irrigation Development Project**



පරාක්‍රම සමුද්‍රයේ D1 උතුරු ඇළ කොන්ක්‍රීට් ආස්තරණය කිරීම/ PSS இல் D1 வடக்கு கால்வாயில் கால்வாய் வரிசை/ Canal lining in D1 North Canal in PSS



කවුඩුල්ල ව්‍යාපාරයේ වවුල්බෝක්කුව අපවහන ඇල හැරවුම් පද්ධති ඉදිකිරීම/ கவுடுள்ள திட்டத்தில் வவல்பொக்குவ வடிகால் கால்வாயில் 3 விரிகுடா ஒழுங்குபடுத்தல் நிர்மாணம்/ Construction of 3 bay regulator in Wavlbokkuwa Drainage canal in kawdulla scheme

13. මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)/ **மொனராகலை மாவட்டத்தில் துரிதப்படுத்தப்பட்ட நீர்ப்பாசன அபிவிருத்தி கருத்திட்டம் வெல்லஸ்ஸ நவோதயா/ Accelerated Irrigation Development Project in Monaragala District (Wellassa Navodaya)**



මඩිත්ත වැව/ **மடித்த குளம்/ Madiththa Wewa**



අමුණුමුල්ල තලගහ ගෙදර පාර/ **அமுனுமுல்ல தளகஹகேதர பாதை**/ Amunumulla Thalagaha Gedara Road

14. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය/ களனி நதி அணைக்கட்டு பாதுகாப்பு/Kelani River Bund Protection Project



කැළණි උතුරු වේල්ල වැඩිදියුණු කිරීම/ **களனி வடக்கு** மேட்டுக்கான மேம்பாடுகள்/ Improvements to Kelani North bund



උතුරු වේල්ල පුනරුත්ථාපනය/ வடக்கு கரை மேட்டு புனரமைப்பு/ Rehabilitation of North bund

15. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම/ கொடிகமுவ தொட்டியின் வளர்ச்சி மற்றும் மேம்பாடுகள்/ Development & Improvements to Godigamuwa Tank



අමුණ ඉදිකිරීම /**அணைக்கட்டு கட்டுமானம்**/ Anicut construction



වැව් බැම්ම ඉදිකිරීම/ **குளக்கட்டு நிர்மாணிப்பு**/ Bund construction

16. කැළණි, කළු, නිල්වලා හා ගිං ගංගා ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘතිය/ களனி, முண்டேனியாறு, களு, நில்வல மற்றும் ஜின் கங்கைப் படுகைகளில் வெள்ளத் தணிப்புத் திட்டங்கள்/ Flood Mitigtion Projects in Kelani , Mundeniaru, Kalu, Nilwala & Gin Ganga basin



කළුගොඩ ගංවතුර ආරක්ෂණ බැම්ම පුනරුත්ථාපනය කිරීම/ MFP கட்டமைப்புகளை மேம்படுத்தல் களுத்துறை/ Improvements to MFP Structures – Kalutara



කළුගොඩ ගංවතුර ආරක්ෂණ බැම්ම පුනරුත්ථාපනය කිරීම/ களுகொட வெள்ளக்கரை புனரமைப்பு- களு கங்கை வடிகால்/ Kalugoda Flood Bund Rehabilitation - Kalu Ganga Basin

17. මන්නාරම දිස්ත්‍රික්කයේ යෝධ වැව යටතේ වන පෝෂිත වැව් ප්‍රතිසංස්කරණය කිරීම/ ராட்சத தொட்டியின் கீழ் ஊட்டி தொட்டியை புனர் நிர்மாணம் செய்தல்/ Rehabilitation of Feeder tanks under Giants Tank in District Mannar



ඉදි කරන ලද මල්ලිගෙය්නාට්ටි හැරවුම් නිර්මිතය/ புதிதாக கட்டப்பட்ட மல்லிகைனட்டி FT/ Construction of New Malligainatti FT



ඉදි කරන ලද කොච්චිකුලම් හැරවුම් නිර්මිතය/ புதிதாக கட்டப்பட்ட கொச்சிகுளம் FT/ Construction of New Kochchikulam FT

18. වඩමාරච්චි කලපුවේ ජල සම්පත් සංවර්ධනය තුළින් යාපන අර්ධද්වීපයේ ජනතාවට පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය/ வடமராட்சி தடாகத்தில் நீர்வளங்களை அபிவிருத்தி செய்வதன் மூலம் யாழ்ப்பாண தீபகற்பத்தில் உள்ள மக்களுக்கு எளிதில் தூக்கிச் செல்லக்கூடிய தண்ணீரை வழங்குதல்/ Supply of Potable Water to the population in the Jaffna Peninsula through the Development of Water Resources in the Vadamarachchi Lagoon





ඉදිකිරීමේ වැඩ සඳහා ප්‍රාරම්භක කටයුතු සිදු කිරීම/ குளத்தின் கட்டுமான பணியின் ஆரம்ப வேலைகள்/ Initiation of construction work - pond

19. කුඩාවිලව්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම/ குடவிலச்சிய நீர்த்தேக்கத் திட்டம்/ Kudawilachchiya Reservoir Project





කිරලපටියාව බැම්ම/ கிரல்பதியாவ கட்டு පස් ඇල පූමි කාල්වාය්/ Earth Canal /Kiralpatiyawa Bund

20. දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීම/ தெமட்டகல நீர்த்தேக்கத் திட்டம்/ Dematagala Reservoir Project





දෙමටගල පිවිසුම් මාර්ගය ඉදිකිරීම/ தெமட்டகல அணுகல் வீதி/ Dematagala Access Road

21. විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය/ விலகண்டிய நீர்த்தேக்கம்/ Wilakandiya Reservoir





ප්‍රධාන ඇළෙහි ව්‍යූහයන් ඉදි කිරීම/ பிரதான கால்வாய் கட்டமைப்புகளை நிர்மாணித்தல்/ Construction of main canal structures

ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම/ அணுகல் சாலை அமைத்தல்/ Construction of access road

22. කවුඩුල්ල දීර්ඝ කිරීම අදියර 11 - වම් ඉවුර ඇළෙහි දම්සෝපුර වැව දක්වා දීර්ඝ කිරීම ව්‍යාපෘතිය/ **கௌடுல்ல நிலை 11 நீட்டிப்பு (தம்சோபுர வாவி வரை நீட்டிப்பு)/ Extension of Kaudulla Stage 11 (Extension up to Damsopura Wewa)**



විභේදන ව්‍යුහය ඉදිකිරීම/ பிரிப்பு க் கட்டமைப்பு நிர்மாணித்தல்/ Construction of Bifurcation Structure



මීටර් 700ක් දිග ගිනිපෙට්ටි පාලම සෑදීම/ 700 மீ நீள த் தொட்டி அமைப்பு அமைத்தல்/ of 700m long trough structure

20. මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය/ **மஹகல்கமுவ குளத்தை மேம்படுத்துதல்/ Augmentation of Mahagalgamuwa Tank**





පෝෂිත ඇලේ කළු ගල් කඩා ඉවත් කිරීම/ **பாறை அகழ்வு/ Rock blasting along the canal trace**

23. ගිංගඟ ගංවතුර පාලන පුනරුත්ථාපනය ව්‍යාපෘතිය/ **ஜின் கங்கை வெள்ளத்தை ஒழுங்குபடுத்தும் திட்டத்தின் மறுசீரமைப்பு/ Rehabilitation of Gin Ganga Flood Regulation Project**



පොම්ප සවි කිරීම/ பம்புகளை நிறுவுதல்/ Installation of pumps



යාන්ත්‍රික වැඩ/ இயந்திர வேலைகள்/ Mechanical Works

24. බෙන්තර ගඟ දකුණු ඉවුර ජලාපවහන හා කරදිය වැළැක්වීමේ ව්‍යාපාරය/ **பெந்தர கங்கை வலது கரை வடிகால் மற்றும் உப்பு நீர் வெளியேற்றும் திட்டம் கங்கை வலது கரை வடிகால் மற்றும் உப்பு நீர் வெளியேற்றும் திட்டம்/ Bentara Ganga Right Bank Drainage and Salt Water Extrusion Scheme**



කරදිය වැලැක්වීමේ බැම් ප්‍රතිසංස්කරණය කිරීම/ கரை மேட்டுக்கு உகந்ததாக இல்லை/ Impotent to SWE bunds



කරදිය වැලැක්වීමේ අමුන ප්‍රතිසංස්කරණය කිරීම/ SWE கட்டமைப்புகளுக்கு உகந்ததாக இல்லை/ Impotent to SWE Structures

25. “වාරි සෞභාග්‍ය” ග්‍රාමීය වැව් හා අමුණු පුනරුත්ථාපනය කිරීමේ ජාතික වැඩසටහන/ "நீர்ப்பாசன செழுமை" கிராமிய மற்றும் அணைக்கட்டு மறுசீரமைப்பு தேசிய திட்டம்/ **Rural Tank Development**





ඇමුණුම III
பின்னிணைப்பு III
Annexure III

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. IWR/A/MI/FA/2021

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූනි 15 දින

ගිණුම් අංශය
22 JUN 2022

වාරිමාර්ග අමාත්‍යාංශය
22 JUN 2022

ලේකම්,

වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩී.ඒ.වන්දුලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IWR/A/MI/FA/2021 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 ජූනි 15 දින

ප්‍රධාන ගණන්දීමේ නිළධාරි,
වාරිමාර්ග අමාත්‍යාංශය.

වාරිමාර්ග අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාංගණනය කළ මතය**

වාරිමාර්ග අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 මූලධන වියදම්

(අ) මූලධන වැය විෂයන් 3 කට වෙන්කර තිබූ ප්‍රතිපාදනය රු.4,911,880,000 ක් වූ අතර ඉන් වැයකර තිබුණේ රු.3,567,724,627 ක් පමණි. ඒ අනුව රු.1,344,155,373 ක ඉතිරියක් නිරීක්ෂණය විය. ඉතිරිවීම්වල ප්‍රතිශතය සියයට 27 ක් විය.

(ආ) පරිපූරක ප්‍රතිපාදන යටතේ බල අංක 136, 375 හා 820 යටතේ කෘෂිකර්ම ප්‍රදේශවල කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා අවස්ථා 3 කදී එකතුව රු.760,500,000 ක් ද, බල අංක 905 යටතේ ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කලමනාකරණ ව්‍යාපෘතිය සඳහා පරිපූරක ප්‍රතිපාදන යටතේ රු.651,380,000 ක් ද, සහ බල අංක 1090 යටතේ 2021 දෙසැම්බර් 31 දින පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය යටතේ රු.3,500,000,000 ක් ද ලබා දී තිබුණු අතර පිළිවෙලින් රු.392,485,503 ක්, රු.347,351,813 ක් හා රු.604,318,057 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්වල

ප්‍රතිශතය පිළිවෙලින් සියයට 52 ත් සියයට 53 ක් හා සියයට 17 ක් විය. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග සැළසුම් කර නොතිබීම නිසා එම ප්‍රතිපාදනයන් ඉතිරි වී ඇති බවද නිරීක්ෂණය විය.

(ඇ) මුදල් රෙගුලාසි 74 උපදෙස් ප්‍රකාරව වැඩ සටහනක / ව්‍යාපෘතියක විෂය සීමාවට ඇතුළත් වන නමුත් වීර මොං ක්‍රියාපටිපාටියෙන් උචිතාකාරයෙන් සහ සම්පූර්ණයෙන් ආවරණය කළ නොහැකි ලෙස එම වියදම ඉක්මවාලීමට සිදුවන කල්හි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සේවයේ ස්වභාවය හා ප්‍රමාණයත් එහි මුළු වියදමත් අතිරේක වශයෙන් ප්‍රතිපාදනය කළ යුතු ප්‍රමාණයත් දැක්වෙන වාර්තාවක් අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර අමාත්‍යාංශයේ ලේකම්වරයා තම අදහස් දැක්වීමෙන් පසු අමාත්‍යවරයා වෙත ඉහත ව්‍යාපෘති 3 සඳහා පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීමට ඉදිරිපත් කළ වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඈ) පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය මඟින් බල අංක 461 යටතේ 2021 මැයි 31 වන දින ලබා දී තිබූ රු.651,380,000 ක් පරපූරක ප්‍රතිපාදනය, අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව නිකුත් කළ 2021 ඔක්තෝබර් 04 දිනැති ලිපිය මඟින් අවලංගු කර තිබුණි. ඊට අදාල ලිපි ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. එම ව්‍යාපෘතිය සඳහා නැවත රු.651,380,000 ක පරිපූරක ප්‍රතිපාදන 2021 ඔක්තෝබර් 04 දින ලබා දී තිබුණි. ඒ අනුව කලින් ලබාදුන් ප්‍රතිපාදනය අවලංගුකර එදිනම නැවත එම ප්‍රතිපාදන මුදලම නිදහස් කිරීමට හේතු වූ කරුණු අනාවරණය නොවුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය සටහන් කිරීමේදී මූල්‍ය නොවන වත්කම් තුල ඇතුලත් යන්ත්‍රෝපකරණ හා උපකරණ ශේෂය රු. 1,544,530 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුමගත කිරීම සම්බන්ධව ලබාදී ඇති උපදෙස් අනුව මූල්‍ය වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් 2021 වර්ෂය තුල රු.31,037,018,021 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපල නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අතරින් රු. 19,370,038,036 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් ආයතන 03 ක් වෙත ප්‍රතිපාදන නිදහස් කර අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. එකී වත්කම් එම ආයතන වෙත පවරාගෙන ගිණුම් ගත කිරීම සම්බන්ධ උපදෙස් නිකුත් කර නොතිබුණි.

1.6.2.2 තැන්පත් ගිණුම

වෙලිඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ සහ රැස්වීම් ශාලාව ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී ආරම්භ කර ඉදිකිරීම් කටයුතු භෞතික ප්‍රගතිය සියයට 85 ක් ලගාකර ගැනිමෙන් පසු අතරමඟ නතර කර තිබුණි. ක්‍රොන්තාත් සමාගම වෙත ගෙවන ලද මුදලෙන් රඳවා ගත් මුදල වූ රු. 1,251,774 ක් වර්ෂ 5 ක් ගත වී තිබුණද එය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

මුල් ඇස්තමේන්තු රු.මිලියන.31.709 ක් වූ අතර ඉන් රු.මිලියන 20 ක් අමාත්‍යාංශය මඟින් සෘජුව වැය කිරීම සඳහාද අවස්තා 5 කදී පරිපූරක ඇස්තමේන්තු යටතේ රු.මිලියන.4.911 ක්ද වශයෙන් අග්‍රිම අවශ්‍යතාවය රු.මිලියන.25 ක් වුවත් රු.මිලියන.12 ක් පමණක් නිදහස් කර තිබුණි. ඒ අනුව මුදල් අමාත්‍යාංශය විසින් නිදහස් කල ප්‍රතිපාදනය ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීම සඳහා පුරෝකතනය කළ අග්‍රිම අවශ්‍යතාවයෙන් සියයට 48 ක් පමණ බව නිරීක්ෂණය විය.

2.2 වියදම් කළමනාකරණය

ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු කිරීම සහ සැළසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන හා සත්‍ය වියදම් සන්සන්දනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 10 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.81,090,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් එකතුව රු.45,379,375 ක් හෙවත් සියයට 56 ක් මු.රෙ.66 වධි විධාන යටතේ වැය විෂයන් අතර මාරු කිරීම් සිදුකර තිබුණි. එක් එක් වැය විෂයයන් යටතේ අයවැය මඟින් සළසා තිබූ අයවැය ගත ප්‍රතිපාදනෙයන් සියයට 41 ත් 100 ත් අතර පරාසයක වූ ප්‍රතිපාදන මු.රෙ.66 මඟින් මාරු කර තිබුණි.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම වැය විෂය සහ ප්‍රවාහන සේවා සඳහා වූ වැය විෂය සඳහා සලස්වා තිබූ ප්‍රතිපාදන මෙන් පිළිවෙලින් සියයට 105 ක් හා සියයට 56 ක් අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

(ඇ) වැය විෂයන් 23 ක් සඳහා වෙන් කර තිබූ එකතුව රු.132,147,800 ක් වූ ශුද්ධ වෙන් කිරීම්වලින් එකතුව රු.83,609,978 ක් හෙවත් සියයට 63 ක් ඉතිරි වී තිබුණි. එක් එක් වැය විෂය යටතේ වූ ඉතිරිය සියයට 41 ත් සියයට 100 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

(අ) වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ හඳුනානොගත් රු 434,066 ක ණය ශේෂ 2022 මැයි වන විටත් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 ඡේදය ප්‍රකාරව, ලබා ගත් ණය සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අය විය යුතුව තිබෙන සියළුම ණය මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට තිබෙන ඕනෑම මුදලකින් අය කර ගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු වේ. නමුත් නිලධාරීන් 04 කුගෙන් අයවිය යුතු එකතුව රු.295,075 ක් හිඟ හිටි ණය මුදලක් අය කර ගැනීම සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ඉන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.39,895 ක් වර්ෂ 05 කටත් වඩා පැරණි මුදලක් තිබුණි.

(ඇ) සේවය හැර ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් එකතුව රු.661,642 ක ණය මුදලක් අය විය යුතුව තිබුණු අතර ඉන් ඒක් නිලධාරියකුගෙන් අය විය යුතු රු.73,062 ක් වූ ණය මුදල වර්ෂ 05 කට ත් වඩා පැරණි විය. එම ණය මුදල ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් ආපසු අය කර ගත යුතු වුවත් අමාත්‍යාංශය ඒ පරිදි කටයුතු කර නොතිබුණි. එසේම, සේවය අතහැරයෑම මත ණය අය කර ගත නොහැකි නිලධාරීන් නැවත සේවය පිහිටුවා ඇතිද, යන්න ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසා තහවුරු කර ගැනීමෙන් පසු වර්තමාන සේවා ස්ථානයේ ප්‍රධානියා මඟින් එකි නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කිරීමටද , සේවය පිහිටුවා නොමැති අවස්ථාවලදී එම සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංක මැනිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මඟින් එම නිලධාරීන්ගේ වත්කම් පිලිබඳ තහවුරුවක් ලබාගැනිමෙන් අනතුරුව නීතිපති මඟින් ණය මුදල් අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉහත සියළු ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුවද තවදුරටත් අය කර ගත නොහැකි ණය ශේෂ වේ නම් අදාල ක්‍රියාමාර්ග ගත් බවට සහතික කල හැකි ලේඛනද සමඟ හිඟ ණය ශේෂ අත් හැරීම සඳහා මු.රෙ.113 යටතේ භාණ්ඩාගාර නියෝජ්‍ය

ලේකම් භාණ්ඩාගාරයේ ලේකම් වෙත /මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීම යන ක්‍රියාමාර්ග ගැනීමෙන් මෙම හිඟ හිටි ණය මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

2.4 බැරකම් හා බැඳීම් වලට එලබීම

(අ) රාජ්‍ය ගිනුම් චක්‍රලේඛ අංක 255/ 2017 හි ඡේද අංක 02 (d) ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලග වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවටත්, උපදෙස්වලට පටහැනිව ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී 2021 දෙසැම්බර් 31 දිනට රු.2,105,384,895 ක් වූ බැරකම්වලට එලබ තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැඳීමකට හෝ එළඹිය හැකි වුවද සමාලෝචික වර්ෂය වෙනුවෙන් මූලධන වියදම් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.9,821,811 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි.

2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.2 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12 වගන්තිය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 115 වගන්තිය	කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ ගණකාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ (111/11) පන්තියේ ගණකාධිකාරී තනතුරක් අනුමත කර තිබියදී ඉහත වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව ඊට ඉහල පළමු පන්තියේ තනතුරක් දරන නිළධාරියෙකු වැඩබැලීම සඳහා පත්කර රු.1,280,150 ක දීමනා ගෙවා තිබුණි.

2. 7 බැංකු ගිණුම් මෙහෙය වීම

වර්ෂය අවසාන දිනට මුදල් පොතේ පැවති ශේෂය මහා භාණ්ඩාගාරය වෙතට ප්‍රේෂණය කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති බැංකු ගිණුම් 5 ක එකතුව රු.316,156,487 ක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව රඳවාගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) ලෝක බැංකු ආධාර යටතේ 2014 සිට 2021 මේ දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ අවසන් කර තිබූ නමුත් එකී ප්‍රතිපාදන යටතේ 2015, 2019 වර්ෂයන් තුළ ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තු වටිනාකම් රු. මිලියන 230.5 ක් වූ කොන්ත්‍රාත් පැකේජයන් 15 ක් සඳහා රු. මිලියන 91 ක් වැය කර තිබුණද වැඩ අවසන් කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි. මෙම කොන්ත්‍රාත් පැකේජයන් 15 හි ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා වෙනත් අරමුදල් මූලාශ්‍රයන්ද හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි.

(ආ) ලෝක බැංකු ආධාර යටතේ 2016 සිට 2021 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ දේශගුණික අව බලපෑම් අවම කිරීමේ අතිරේක මූල්‍යායනය ව්‍යාපෘතියේ 2021 වර්ෂය තුළ අවසන් කර තිබූ නමුත් එකී ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන.182.2 ක් වූ කොන්ත්‍රාත් පැකේජයන් 3 ක් සඳහා රු.මිලියන.52.1 ක් වැයකර තිබියදී වැඩ අවසන් කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි. කොන්ත්‍රාත් පැකේජ 3හි ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා වෙනත් අරමුදල් මූලාශ්‍රයන්ද හඳුන්වා දී නොතිබුණි. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගත නොහැකි වී තිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 153,915.7 ක් වූ තල්පිටිගල ජලාශය, ඵලදායීතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය, ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය හා උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය සංවර්ධන ව්‍යාපෘති 4 ක් සැලසුම් කළ කාලයමෙන් දෙගුණයකටත් වැඩි කාලයක් ගත වී තිබුණද නිම කර නොතිබුණි. එම ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික වාසි සැළසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ පිළිබඳ විශ්ලේෂණය කර වගකිව යුතු පාර්ශව පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව එම ව්‍යාපෘති 4 සඳහා වර්ෂ 14 ක කාල සීමාවක් තුළ දරා ඇති රු. මිලියන 90,294.5 ක පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.

(ආ) ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය

(i) ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 නොවැම්බර් 05 දින වාරිමර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ චීනයේ CAMEC IUD සමග ඇ.ඩො.690,000,000 ක EPC කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා පූර්ව වැඩ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් 4.35% ක් වූ ඇ.ඩො. 29,989,000 ක් (රු.4,011,054,982) ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාල EPC ගිවිසුමේ පස්වන වගන්තිය පරිදි එම ගිවිසුම ක්‍රියාත්මක තත්ත්වයට පැමිණීමට නම් එකී වගන්තිය යටතේ ඇති කරුණු සියල්ල සම්පූර්ණ විය යුතු බව හා ගිවිසුම අත්සන් කල දින සිට වර්ෂයක් තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් නොවන අවස්ථාවකදී දෙපාර්ශවයේ එකඟතාවයකින් තොරව ගිවිසුම අවලංගු විය යුතු වන අතර ඒ අනුව 2015 නොවැම්බර් 05 දිනට ගිවිසුම අවලංගු බවට පත් ව තිබුණි.

(ii) ඒ අනුව අත්තිකාරම් ඇපකරය මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ තීරණය පරිදි අග්‍රාමාත්‍ය ලේකම් විසින් ලබා දුන් උපදෙස් පරිදි වහාම ව්‍යාපෘතියේ කටයුතු නතර කර නීතිපතිවරයාගෙන් අදහස් ලබා ගැනීමකින් තොරව හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අදාල අත්තිකාරම් මුදල ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස

නම් කරන ලද මූලික දත්ත රැස් කිරීම. මැනුම් කටයුතු. භූගෝලීය නිරීක්ෂණ කටයුතු ශක්‍යතා අධ්‍යන වාර්තාව යාවත්කාලීන කිරීම, හා මූලික සැළසුම් සකස් කිරීම යන කටයුතු සඳහා වූ පිරිවැය ලෙස හඳුනාගෙන ඒවා මාස.8 ක් තුළ නිම කිරීම සඳහා 2017 ජනවාරි 20 වන දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් අවබෝධතා ගිවිසුමක් සකස් කර තිබුණි. ඒ යටතේ හඳුනාගත් වැඩ කොටස්වලට අදාල සම්පූර්ණ මුදලම එකවර ගෙවා තිබියදී අවුරුදු 5 ක් ගත වී ඇතත් ව්‍යාපෘතියේ මූලික සැළසුම් සකස් කිරීම මේ දක්වා නිම කර නොතිබුණි. භෞතික කාර්ය සාධන වාර්තාව අනුව එකී කටයුතුවලින් 26% ක් තවදුරටත් නිම කළ යුතුව පැවතුණි.

(iii) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාවය හා අනුග්‍රහය ලබාගත යුතු බව සඳහන්කර වර්ෂ 4ක් ගත වී ඇතත් එය ලබාගෙන නොතිබියදී ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යමින් පැවතුණි. තවද ව්‍යාපෘතිය සඳහා බදවා ගත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප්, දීමනා හා අනෙකුත් වියම් වෙනුවෙන් වර්ෂ 5 ක කාලසීමාවක් තුළ රු.මිලියන.57 ක් දැරීමට සිදු වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු වර්ෂ 8 ක් අඛණ්ඩව ප්‍රමාද වීම තුළ එය අනාර්ථික හා අතිරේක වැය බරක් බවට පත්ව තිබුණි.

(iv) අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/01/ASP/2016/01(VolII) දරණ 2016.06.23 දිනැති ලිපිය මගින් ආර්ථික කළමනාකරණය පිළිබඳ අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගග ආශ්‍රිතව පමණක් සිදු කිරීමට නිර්දේශ කරන බවත්, ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දී තිබූ නමුත් එකී අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමකින් තොරව 2017.07.20 දින ගිවිසුමට එළඹ තිබුණි. එමගින් ගිං ගග හා නිල්වලා යන කොටස් 2 ම පිළිබඳ අධ්‍යනයන් කිරීමට පවරා තිබුණි. නිර්දේශ අනුව ආර්ථික කළමනාකරණ අනුකමිටුව මගින් ව්‍යාපෘතිය නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් සිදු කිරීමට තිබූ නිර්දේශය නොසලකා එළඹ තිබූ ගිවිසුම මගින් UNESCO සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගිං ගග ආශ්‍රිතව හා නිල්වලා ගඟ යන කොටස් 2 ක සඳහාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කාර ආයතනය යටතේ එකඟතාවයකට පැමිණීම තුළ මෙම ව්‍යාපෘතියට අදාළ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල අනුමැතීන් ලබා ගැනීමට නොහැකි වීම, මහජන විරෝධතා එල්ල වීම ආදී තත්වයන් නිර්මාණය වී තිබුණි. ඒ බව අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි ද අනාවරණය කර තිබුණි.

ඒ අනුව 2017 වර්ෂයේ අවසානයේ අවධිමත් ලෙස ඵළඹී අවබෝධතා ගිවිසුම යටතේ සිදු කරනු ලබන අධ්‍යයනයන් හා සැලසුම් ද නිෂ්ප්‍රයෝජන වන බව නිරීක්ෂණය විය.

(ඇ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව මුලස්ථායි වැඩ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක් හා සෙසු පිරිවැය හා යටිගං පෙදෙස සංවර්ධනය සඳහා රුපියල් මිලියන 15,474.25 ක් අරමුදල් මුල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂය අවසානය වනවට මුලස්ථායි වැඩ වෙනුවෙන් දේශීය අරමුදල් රුපියල් මිලියන 72,153.17 සහ විදේශීය අරමුදල් රුපියල් මිලියන 6,522.85 ක් ලෙස රුපියල් මිලියන 78,676.02 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 ක්න් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මුලිකව අපේක්ෂා කර තිබුණ ද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කොට 2021 දෙසැම්බර් 25 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මඟින් මුල්‍යනය කිරීමට යටත්ව තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2007 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹී තිබුණ ද, 2013 වර්ෂයේදී ඉරානය වෙත පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද විදේශීය ණය මුදල අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ඉන් පසුව මෙම ව්‍යාපෘතියේ පිරිවැය ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මුල්‍යකරණය කර තිබුණි. එම තත්වයන් අනුව දේශීය අරමුදල් මඟින් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරගකාරී මිල ගණන් කැඳවීම තුලින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරගකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභයක් වූ විදුලි බලය ජනන පද්ධතියට අමතරව මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම. ව්‍යාපෘති

ප්‍රදේශයේ පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම ඩයබරා හා පුහුල්පොල ඉදි කෙරෙන ජලාශ මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සැපයීම ජනන පද්ධතියට ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) මේ සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී EPC කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන අනුව අය කරන ලද ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීම තුලින් කාලය දීර්ඝ කිරීම අනුමත කල කාලසීමාවට අදාල කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට ඇතිවන බැදීමේ බලපෑම පිළිබඳ අදාල අමාත්‍යාංශ දැනුවත් කර නොතිබුණි.

(iv) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.1,931,346,396 ගෙවා තිබුණි.

(v) 2015 නොවැම්බර් 15 දින සිට 2021 දෙසැම්බර් 25 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම් සිදු කර තිබුණ අතර EPC කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් 0.01% වශයෙන් උපරිමය 5% ක් දක්වා, අයකල හැකිව තිබූ ප්‍රමාද ගාස්තුව ඇමරිකානු ඩොලර් මිලියන 26.453 ක් ලෙස ගණනය කල හැකි විය. එම ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි.

(vi) කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද ඇමරිකානු ඩොලර් 6,631,364 ක් මුදලින් අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ඉන් ඇමරිකානු ඩොලර් 5,305,091 ක් ආපසු ගෙවීම් කර තිබුණි.

(vii) වන්දි වශයෙන් ශ්‍රී ලංකා රජයෙන් ගෙවන ලද රු.889,789,252 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබූ අතර කොන්ත්‍රාත්තුවට අදාල රක්ෂණ සමාගමෙන් අයකරන ලද ඇමරිකානු ඩොලර් 8,155,981 න් වන්දි ලෙස ලබාගෙන තිබුණි.

(viii) කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් අතිරේක වියදම් හා බිල්පත් සඳහා ගෙවීම් ප්‍රමාද වීම වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක අමතර ගාස්තුවක් ඉල්ලා තිබුණි. EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එම ඉල්ලීම් විධිමත් ලෙස ප්‍රතික්ෂේප කර ඒ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදන අංශ දැනුවත් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතිය

තුලින් අපේක්ෂා කල ප්‍රතිලාභ 2022 මැයි වන විටත්ලබාගත නොහැකි වී තිබුණි.

(ඇ) භූගත ජල විමංඝන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම

වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය යුරෝ 20,629,921.18 හෙවත් රුපියල් මිලියන 3,628.39 ක් යටතේ විදේශීය සමාගමක් සමඟ ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදි කිරීම් (EPC) කොන්ත්‍රාත්තුවක් ලෙස ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ඔක්තෝම්බර් 03 වන දින ගිවිසුමකට එළඹ තිබුණි.

(i) මෙම ව්‍යාපෘතිය යටතේ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යූරෝ 1,473,462 ක් වෙන් කර තිබුණි. යෝජිත දත්ත මධ්‍යස්ථානයේ ඉදි කිරීමට අදාළ කටයුතු වර්ෂ 04 ක් ගතවී ඇතත් මෙතෙක් ආරම්භ කොට නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබූ මාස 18 ක දින දීර්ඝ කිරීම 2022 සැප්තැම්බර් මස 31 දිනෙන් අවසන් වීමට නියමිතව පවතින බැවින් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට සමගාමීව දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිනොකිරීම තුළ ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි.

(ii) ගිවිසුම් ප්‍රකාරව එසේ 03 ක කාල සීමාවන් තුල නිම කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී මෙය EPC/ Turnkey කොන්ත්‍රාත්තුවක් බවත් කොන්ත්‍රාත්කරුට මෙම කාලය දීර්ඝ කිරීමට අදාළ කිසිදු අතිරේක පිරිවැයක් සඳහා ඉඩ නොදෙන බව සඳහන් කර ඇතත් කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීම සඳහා 2021 මාර්තු 11 දිනැතිව ඉදිරිපත් කර තිබූ ලිපිය අනුව එසේ අතිරේක පිරිවැයක් අය නොකරන බව සඳහන් කර නොතිබුණි. ගිවිසුමේ 3.1.1 වගන්තිය අනුව (PCC 3.1.1) එවැනි එකඟතාවයක් ලබා ගැනීම ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ රාජකාරියක් බව සඳහන්ව ඇත. ඒ අනුව අනාගතයේදී කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව කාලය දීර්ඝ කළ කාල සීමාව වෙනුවෙන් වූ අතිරේක බිල්පත් ඉදිරිපත් කර බෙරුම්කරන මණ්ඩලය වෙත යොමු වුවහොත් ශ්‍රී ලංකා රජයට අවාසියක් සිදු වීමේ අවදානම පැවතුණි. ඒ අනුව රජයේ අයිතිවාසිකම්

ආරක්ෂාවන පරිදි ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

3.1.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 18.500 ක් ලබාදීමට අපේක්ෂා කර තිබුණු අතර 2017 සිට 2021 දක්වා රු. මිලියන 2.528.13 ක් වෙන්කර තිබුණි. ඉන් රු. මිලියන 1,595.46 ක් වැයකර තිබුණි. ඒ පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) ව්‍යාපෘතිය සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙතින් අරමුදල් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලන ලෙස උපදෙස් ලබා දී තිබුණද ඒ පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව නිසි සම්බන්ධීකරණයක් සිදු කර නොතිබුණි. දේශීය අරමුදල් වලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ කටයුතු 2017 සිට 2021 කාල සීමාව තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණද භෞතික ප්‍රගතිය සියයට 12 ක් විය. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 8.6 ක් විය.

3.1.4 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් අකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙළ කල යුතු වුවද,

සංවර්ධන ඝටහන් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබීම, 1.6 ඡේදය යටතේ මහවැලි අධිකාරිය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස හෙළිදරව් කර නොතිබීම, මහවැලි අධිකාරිය යටතේ සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබූ සීමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම. 2020 දෙසැම්බර් 30 දින සිට අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබීම ආදි කරුණු වාර්තාව මගින් අනාවරණය කර නොතිබුණි.

3.2 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම.

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 05 ක් සඳහා 2021 මැයි 28 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 20 ක, තෘතීක මට්ටමේ තනතුරු 01 ක, ද්විතීක මට්ටමේ තනතුරු 22 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 11 ක් වශයෙන් පුරප්පාඩු 54 ක් විය.

ඩී.වී. වන්දලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

අයිඩබ්ලිව්.ඒ අයිඩ්.පෙත්/ 2021

2022 ජූනි 15 දින

අධ්‍යක්ෂ ජනරාල්

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටේක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩී.වී. චන්ද්‍රලතා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත : ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්ආර්/ඒ/අයිඩි/එෆ්ඒ/2021
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2022 ජූනි 15 දින

ගණන්දීමේ නිලධාරී
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306 72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්.

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

1.6.1.1 අත්තිකාරම් ගෙවීම්

2021 අගෝස්තු 02 දින සේවය හැර ගොස් සිටි මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කළ රියදුරෙකු වෙත වැරදි ලෙස ගෙවා තිබූ වැටුප රු.74,070 ක් මුදලක් ඇතුලුව අයවිය යුතු රු.192,164 ක් අත්තිකාරම් බී ගිණුමේ වැටුප් රහිත නිවාඩු ලැබ විදේශ ගතවූ නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස හෙලිදරව්කර තිබුණි. වැරදි සහගත ලෙස වැටුප් ගෙවීම සිදු කළ අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

(අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීම සම්බන්ධව ලබාදී ඇති උපදෙස් අනුව සංකේත අංක 61414 යටතේ වැව් ජලාශ ඇලවේලි ආදී මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් 2021 වර්ෂය තුල රු.661,112,174 ක් වැයකර සංවර්ධනය කරන ලද වැව් ජලාශ ඇලවේලි ආදිය නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. තවද මූලධන වියදම් ලෙස දරා තිබූ රු.661,112,174 ක දේපල පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ශුද්ධ වත්කම්/ස්කන්ධය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. එම වියදම දෙපාර්තමේන්තුවේ සමස්ත වියදමින් සියයට 6.56 ක් වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2017 වර්ෂයේ අවසන් කර තිබූ කොන්ත්‍රාත් වටිනාකම රු.185,043,180 ක් වූ ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ නව කාර්යාල ගොඩනැගිල්ල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් අත්පත්කර ගැනීම වෙනුවෙන් රු.5,597,916,828 ක වියදමක් දරා තිබුණු නමුත් භාණ්ඩාගාර සටහන් SA-82 අනුව ප්‍රවර්තන වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් අත්පත්කර ගැනීමේ වටිනාකම රු.3,684,007,764 ක් විය. ඒ අනුව රු.1,913,909,064 වෙනසක් නිරක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යක්ෂ කාර්යාලවල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ඉඩම් අක්කර 4,735 පර්චස් 123 ක් හා බණ්ඩාරවෙල, ගාල්ල, නුවර, පොළොන්නරුව, මොනරාගල, හම්බන්තොට වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පිහිටි ගොඩනැගිලි 392 ක් තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කමේ වටිනාකම රු.92,494,173,747 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම වත්කම්වල 2021 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස රු.95,644,387,556 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව ආරම්භක ශේෂයේ රු.3,150,213,809 ක වෙනසක් නිරීක්ෂණය විය. ආරම්භක ශේෂයට සිදු කරන ලද ගැලපීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

1.6.2.2 තැන්පතු ගිණුම් ශේෂ

(අ) පොදු තැන්පත් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා තිබුණු රු.36,470,067 ක ශේෂයක් වූ අතර මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘතීන් ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු රු.4,194,430 ක මුදල අදාල කාර්යයන් සඳහා යොදවා නොගෙන වර්ෂ ගණනාවක සිට තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ සේවකයෙකු 2020 දෙසැම්බර් මස ආපදා ණය ශේෂය නිරවුල් කිරීම සඳහා ගෙවන ලද රු.155,207ක් අත්තිකාරම් බී ගිණුමට බැරකරනු වෙනුවට තැන්පත් ගිණුමට සටහන් කර තිබුණි.

1.6.2.3 අග්‍රිම ගිණුමේ ශේෂය

2003 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයකු විසින් සිදුකරන ලද රිය අනතුරක් සම්බන්ධයෙන් වූ නඩු තීන්දු දෙකකට අදාලව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අයකර ගන්නා ලද රු.3,608,100 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට, අදාල විශ්‍රාමික නිලධාරියාගෙන් අයවිය යුතුව තිබූ රු.3,908,000 ක මුදලින් නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරියට ගෙනවිත් තිබුණි. 2018 සිට 2021 දක්වා වර්ෂ 3 ක කාලය තුල එම නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකරගත හැකි ප්‍රමාණය අයකර ගෙන නොතිබුණු අතර ඔහුගේ විශ්‍රාම වැටුපින් මාසිකව රු.10,000 ක් වැනි මුදලක් අයකිරීමට දෙපාර්තමේන්තුව විසින් ගෙන තිබූ තීරණය හේතුවෙන් එම කාලය තුල අයකරගෙන තිබූ මුදල රු.300,000 ක් පමණක් විය. 2021 අගෝස්තු මස අදාල නිලධාරියා මියයාම හේතුකොටගෙන ඉහත නොපියවූ අග්‍රිම ශේෂය අය කර ගත නොහැකිව තිබූ අතර එම ශේෂය කපා හැරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් ගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය රු.21,370,794,188ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා එම මුදල දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණු නමුත් ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනය රු.16,334,636,00 ක් විය. එම ලැබී තිබුණු අග්‍රිමය ඉල්ලුම් කරන ලද අග්‍රිමයේ ප්‍රතිශතයක් ලෙස සියයට 76 ක් විය.

2.2. වියදම් කළමනාකරණය

ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හදුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැළසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා රු.14,668,500,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් රු.29,30,772,857 ක් ඉතිරි වී තිබුණි. අය වැය ලේඛනය මගින් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්, යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයයන් යටතේ සංවර්ධන

වැඩසටහන් 05 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොගෙන වෙනත් සංවර්ධන වැඩසටහන් සඳහා 50% කට වැඩි ප්‍රමාණයක් මාරු කර තිබීම නිසා සැලසුම් කර තිබුණු පරිදි එම සංවර්ධන වැඩ සටහන් ඉටු වී නොතිබුණි.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/ 2017 02 (d) ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට ලබා දී තිබූ උපදෙස්වලට පටහැනිව ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී 2021 දෙසැම්බර් 31 දිනට රු.1689,409,606 ක බැරකම් නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ බැදීම් හා බැරකම් ලේඛණය 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මගින් දී ඇති උපදෙස් ප්‍රකාරව බැදීම් හා බැරකම් වෙන් වෙන්ව හඳුනා ගෙන තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

2.4. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය	වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම ප්‍රධාන ගංගා ද්‍රෝණි ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසරයෙන් ජල භාවිතා කිරීම පාලනය කිරීම වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි.
(ආ) 2017 ජූලි 18 දිනැති අංක අමප/17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම සඳහා 2017 වර්ෂයේ දී අනුමැතිය ලබා ගෙන තිබූ නමුත් පසුගිය වසර 05 තුලම ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) XXIV වන පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති	ලබා ගත් ණය සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අය විය යුතුව තිබෙන සියළුම ණය මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට තිබෙන ඕනෑම මුදලකින් අය කර ගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු වුවත් මිය ගිය නිලධාරීන් විසිතුන් දෙනෙකුගෙන් අයවිය

	යුතු රු.2,751,438 ක්, විශ්‍රාම ගොස් තිබූ සේවකයන් 83 දෙනෙකුගෙන් අයවිය යුතු රු.9,013,134 ක් සහ වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගෙන්, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් හා සේවය අත්හිට වූ නිලධාරීන්ගෙන් අය විය යුතු රු.2,522,087 ක් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුල වර්ෂ තුනකට වඩා පැරණි රු.2,521,332 ණය ශේෂයක් හා අවුරුදු පහකට වැඩි රු.1,294,985 ක ණය ශේෂයක් විය.
(ii) XIX වන පරිච්ඡේදයේ 5.2.1හා 5.3.1 වගන්ති	දෙපාර්තමේන්තුවට අයත් කළාප 14 ක පිහිටි නිළ නිවාස වල පදිංචි නිළධාරීන් හා සේවකයින්ගෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් 12 දෙනෙකුගෙන් නියමිත පරිදි නිවාස කුලී අය නොකිරීම නිසා 2021 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු.1,874,578 ක මුදලක් අයවිය යුතුව තිබුණි.
(ඇ) අංක 842 හා 1978 භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ආයතනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඉ) අංක 01/2017 හා 2017 ජුනි 26 දිනැති භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියළුම වත්කම් පිළිබඳ නිවරදි තොරතුරු ලේඛණ ගත කිරීම සඳහා උපදෙස් දී ඇති පරිදි දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කර ඇති තොරතුරු පද්ධතිය නිවරදි ලෙස හා යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

(ඊ)	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීමට ගණන්දීමේ නිලධාරියෙකුට හැකිය. සඳහා ආහාර සැපයීම වෙනුවෙන් 2021 ජනවාරි සිට ජූලි දක්වා කාල සීමාව තුල අවස්ථා 12 ක දී රු.100,000 බැගින් අත්තිකාරම් මුදල් ලබා දී තිබුණු අතර ඒ සියළු අවස්ථාවලදී අත්තිකාරම් මුදල ඉක්මවා රු. 118,838 වියදම් කර එම වැඩිපුර වියදම් කල මුදල් ප්‍රතිපූරණ කරගෙන තිබුණි.

2.6 අවිධිමත් ගණුදෙනු

ගල්ගමුව පුහුණු අභ්‍යාස ආයතනයේ මුළුතැන්ගෙයි අරක්කැමි තනතුර සඳහා බඳවාගෙන තිබුණු අන්‍යම් කම්කරුවන් දෙදෙනෙකුට 2021 වර්ෂයේ වැටුප් ගෙවීම් සඳහා 2021 ජනවාරි 29 දින රු.1,000,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එමගින් වැටුප් ගෙවීම් කර තිබූ නමුත් පුහුණු පාඨමාලාවන්ට අදාළ ඇස්තමේන්තු සකස් කිරීමේදී එක් අරක්කැමියෙකුට දෙනිකව වැටුප් ලෙස රු.1,850 බැගින් අරක්කැමියන් දෙදෙනෙකු සඳහා එම වැඩසටහන් පැවැත් වූ දින ගණන අනුව වැටුප් ඇතුලත් කර මුදල් ලබාගෙන තිබූ අතර එම මුදල් ද වැයකර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සේවක වැටුප් හා අතිකාල දීමනා ගෙවීම් කර තිබියදී වැඩමුළුවලට සම්බන්ධ වූ නිලධාරීන්, රියදුරන්, උදවුකරුවන්, මුළුතැන්ගෙයි සේවකයන්, කාර්යාල කාර්යය සහයකයින්ගේ අතිකාල වෙනුවෙන් වූ වටිනාකම් ද ඇස්තමේන්තුවට ඇතුලත් කර මුදල් ලබාගෙන තිබුණි.

(අ) ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය විසින් බාහිර ආයතනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් සකස් කර තිබූ ඇස්තමේන්තු තුළ එම එක් එක් වැඩ සටහන් සම්බන්ධීකරණ ගාස්තු හා පහසුකම් සැපයීමේ ගාස්තු ලෙස එක් අයෙකුට දිනකට රු.2,500 බැගින් නිලධාරීන් දෙදෙනෙකුට රු.5,000 ක් ඇතුලත් කර තිබුණි. එසේ විධිමත් අනුමැතියකින් තොරව ඇස්තමේන්තුවලට ඇතුලත් කර ගෙවා තිබුණු මුදල රු.87,500 ක් විය.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය අනුව අභ්‍යාස ආයතනයට අනුයුක්තව පූර්ණ කාලීනව සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉංජිනේරුවරුන්ට හා ඉංජිනේරු සහකාරවරුන්ට වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත ඔවුන්ගේ දීමනා රහිත මාසික වැටුපෙන් සියයට 20 දීමනාවක් ගෙවීම සඳහා අධ්‍යක්ෂ විසින් 2011 ජනවාරි 04 දින අනුමතිය ලබාදී තිබුණි. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 05 ක කාලය තුල රු.5,273,189 ක් වූ අධ්‍යයන දීමනා ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගනීම

යාන් ඔය ජලාශය ඉදි කිරීම හේතුවෙන් අහිමි වූ වනාන්තර වෙනුවෙන් නැවත වන වගා ක්‍රියාත්මක කිරීම් සඳහා අනුරාධපුර දිසා වන කාර්යාලයට රු.12,000,000 ක් ලබා දී තිබුණි. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 209.1 ක පැල 200000 ක් රෝපණය කල බවට වාර්තා කර තිබුණද පැල ලක්ෂයක් පමණක් වගාකර තිබුණි. ජලාශයේ FSL හා HFL මට්ටම අතර පිහිටි ඉඩම්වල යෝග්‍යතාවය පිලිබඳ ඇගයීමකින් තොරව පැල සිටුවීම නිසාත් ව්‍යාපෘති පාරිසරික වාර්තාවේ බලපෑම තක්සේරු අවශ්‍යතාවයන්ට අනුකූලව වන වගා කටයුතු සිදු නොකිරීම නිසාත්, ජලාශය පිරිමේදී එම ප්‍රදේශ ජලයෙන් යටවීම හේතුවෙන් සිටුවන ලද පැල වලින් සියයට 90 කට වැඩ ප්‍රමාණයක් විනාශ වී තිබුණි.

3.1.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

වඩමාරච්චි කලපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මගින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී දේශීය අරමුදල් රු.මිලියන 2000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ආරම්භ කර එම වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

3.1.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) බෙන්තර ගඟ දකුණු ඉවුරු ජලාපවාහන කරදිය වැලක්වීමේ ව්‍යාපෘතිය මූලික සැලැස්ම අනුව රු.මිලියන 298 ක දේශීය අරමුදලින් 2015 වසරේ දී ආරම්භ කර 2017 වසරේදී අවසන් කිරීමට නියමිතව තිබුණු අතර පසුව 2021 වර්ෂයේදී අවසන් කිරීම සඳහා කාලය දීර්ඝ කර තිබුණි. 2015 සිට 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය සඳහා රු.මි. 95,194 ක් වැයකර තිබුණු අතර 2021 වර්ෂයේදී රු.මිලියන 100 ක් ලැබී තිබුණි. එම මුදලින් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ව්‍යාපෘති වියදම රු.මිලියන 69.950 ක් වැයකර තිබුණු අතර රු.මිලියන 30.050 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ සිට ප්‍රවර්තන වර්ෂය අවසාන දින වන විට රු. මිලියන 165,144 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 55 ක් වුවත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ දක්වා අත්කර ගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 35 ක් පමණක් විය.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලෙස රු.මිලියන 3,800 ක් බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 මාර්තු 21 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව ගිවිසුම අත්සන් කර වර්ෂ 03 කට වැඩි කාලයක් ගතව තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 560 ක් වැයකර ව්‍යාපෘතියේ ජලනල එතීම හා අනෙකුත් කටයුතුවලින් සියයට 33 ක් පමණක් නිම කොට පැවතුණි. ජල මූලාශ්‍ර ඉදිකිරීම ප්‍රමාදවීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට 2021 දෙසැම්බර් 31 දින දක්වාම නොහැකි වී තිබුණි. ව්‍යාපෘතියට කාර්ය මණ්ඩලය 27 ක් අනුමත කරගෙන තිබුණු අතර 18 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2019 ජූනි මස ජලාශයේ ඉදකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණද, කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනයකින් තොරව ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

3.1.4 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ ආයතනය පිළිබඳ හැඳින්වීමේදී බලතල පැවරී ඇති ප්‍රධාන නෛතික විධිවිධාන පිළිබඳ සඳහන් කර නොතිබීම, ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්

හදුනා ගැනීමේදී වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන යටතේ ආයතනය වෙත බලතල පැවරී ඇති කාර්යයන් ආවරණය වී නොතිබීම, දෙපාර්තමේන්තු ප්‍රධාන අංශ කලාප වාර්මාර්ග අධ්‍යක්ෂ කාර්යාල හා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වෙත පැවරී ඇති කාර්යභාරය පිළිබඳ සාරංශගත තොරතුරු ඉදිරිපත් කර නොතිබීම, උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය බස්නාගොඩ ජලාශය ඉදිකිරීම් ව්‍යාපෘතිය ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පාදන කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු දායකත්වය ඇතුලත් නොවීම ආදී කරුණු නිරීක්ෂණය විය. තවද කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය, දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය, රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය,මැණික් හඟ ඔය ජලාශ ව්‍යාපෘතිය, යෝධ වැව ඔය ජලාශ ව්‍යාපෘතිය, කවුඩුල්ල ඔය ජලාශ ව්‍යාපෘතිය, ගිං හඟ ඔය ජලාශ ව්‍යාපෘතිය, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය, මොරාන ජලාශ ව්‍යාපෘතිය, කොච්චිපතාන ජලාශ ව්‍යාපෘතිය සහ විලක්කන්ඩිය ජලාශ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රතිලාභයන්ගෙන් සත්‍ය වශයෙන් සලසා ඇති ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් එකී ව්‍යාපෘතින්හි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සිදුකළ හැකි පරිදි වාර්තා කර නොතිබුණි.

3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

i. නිකවැරටිය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශය තුළ වැව් 16 ක රොන්මඩ ඉවත් කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 75 කට වඩා අඩු මට්ටමක විය.

ii. වැව් 16 හි රොන්මඩ ඉවත් කර තිබුණද සමහර වැව් වල රොන්මඩ වැව් පතුලේම ගොඩගසා තිබුණි. වර්ෂාවට පෙර රොන්මඩ ඉවත් නොකිරීම හේතුවෙන් නැවත වැවට එකතු වී තිබුණි. ඒ අනුව වැය කල මුදල් නිශ්ක්‍රීය වියදමක් වී තිබුණි. 1/2021 දරන රාජ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව ඉවත් කළ රොන්මඩ හා පස් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

iii. ව්‍යාපෘතියට අවශ්‍ය වැලි හා කලු ගල් රු.18,201,825 ක මිලදීගෙන තිබුණු අතර කුරුණෑගල දිස්ත්‍රික් සම්මත අනුමත මිල ගණන් වලට වඩා මිලදී ගෙන තිබූ මිල ගණන් රු 1,500 සිට 7,500 අතර වෙනසක් පැවතුණි. මේ අනුව සම්මත මිල ගණන් වලට වඩා රු.7,830,200 ක් වැය වී තිබුණි. තවද සාමාන්‍ය වෙළඳපොල මිලට මිලදී ගැනීමට කටයුතු කලේ නම් වැලි හා කලු ගල් මිලදී ගැනීම තුලින් රු.2,480,205 ක් ඉතිරි කර ගත හැකිව තිබුණි.

iv. යන්ත්‍රානුසාරයෙන් සිදුකරන ලද වැව් බැම්ම වල පස් පිරවීමට අදාල මිනිස් ශ්‍රමය පදනම් කරගත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් රු.13,120,788 ක අධි ඇස්තමේන්තුවක් සිදු කර තිබුණි.

v. වැව්වලට අදාල අමුණු කොන්ක්‍රීට් කිරීම නාන පඩි, පිටවාන්, පාලම් ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමිතියෙන් තොර වීම, ඉදිකරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වාහන, යන්ත්‍රසූත්‍ර කාර්ය මණ්ඩලය හා ශ්‍රමිකයන් ප්‍රමානවත් පරිදි සැලසුම් නොකිරීම, සංවර්ධන කටයුතු හේතුවෙන් අධික වර්ෂා කාලවලදී සිදු කිරීම, තත්ව පාලන පරික්ෂාවන් සිදු කර නොතිබීම, ඇබෝගම වැව් සංවර්ධනය යටතේ රු.7,674,975 ක් වැය කර ඉදිකිරීමට නියමිත පාලම් 2 ක් ඉදිනොකිරීම හේතුවෙන් වැඩ බිමෙහි තිබූ කම්බි අනාරක්ෂිතව තිබීම, උගුරැස්සාව වැව් බැම්ම නිසි පරිදි සංගත වී නොතිබීම හේතුවෙන් වැඩ බිම තුලට ජලය ගමන් කිරීම, තත්ව පාලනය සඳහා රු.2,078,088 ක් වෙන් කර තිබුණද නිසි තත්ව පාලන පරික්ෂාවන් සිදු නොකිරීම,ආදී අඩුපාඩු නිරීක්ෂණය විය.

vi. වැව් ප්‍රතිසංස්කරණය සඳහා හරස්කඩ මිනුම් ගැනීම වැඩ ආරම්භ කිරීමට ප්‍රථම සිදු කල යුතු වුවත් වැඩ නිම වූ පසු සිදුකිරීම, වැව් වලට අදාල මිනුම් ගැනීම, සැලසුම් කිරීම වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයට ලක් නොවීම, සියලු ඉදිකිරීම් දෙපාර්තමේන්තු අනුමත ප්‍රමිතීන්ට අනුව සිදුකිරීම සඳහා හැකි සෑම විටම සිවිල් ඉංජිනේරු ද්‍රව්‍ය සමීක්ෂකගේ සේවය ලබාගත යුතු වුවත් වැව් 16 න් එක් වැවක් සඳහා පමණක් එම සේවය ලබාගැනීම, පරීක්ෂණ ඛණ්ඩයක් (Test Section) පරීක්ෂා කර අනුමත ප්‍රමිතීන්ට අදාල ද යුත්ත සිදුකළ යුතු ක්‍රමවේදය මිළි සැදීම ඇණ්ඩිය යුතු වුවත් වැව් 16 සඳහාම එසේ සිදු නොකිරීම, ඉක්ෂත්‍ර පරීක්ෂණ කටයුතු සිදු නොකිරීම, ඉදිකිරීම් ද්‍රව්‍යවලට අදාල ප්‍රමිතිය පරීක්ෂා නොකිරීම, අමුණු ගේට්ටු මිලදී ගැනීම හා බොරළු මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.2,375,000 ක් හා රු.8,895,00 ක් වැය කර තිබුණද ඊට අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා හා නියමිත ප්‍රමිතියට අදාලද යන්න පරීක්ෂා කර නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

vii. තොග ලේඛන පොත් නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඉංජිනේරු සහකාර වරුන්ට ලැබෙන තොග භාවිතයට ගැනීම් පිළිබඳ තොරතුරු ලේඛණ ගත කර නොතිබුණි. තොග පොතට ඇතුලත් නොමැතිව වාචික තොරතුරු මත සටහන් කර තිබුණි. වැඩ බිමෙහි ආරක්ෂක අංශය හෝ අදාල නිළධාරීන් තොග ගෙනඒම් සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3. ප්‍රසම්පාදනය

2021 වර්ෂය තුළ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක කාර්යාල 14 යටතේ වූ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 මගින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩ සම්බන්ධයෙන් විගණනයට කැඳවන ලද තොරතුරු සඳහා කලාප කාර්යාල 09 කට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 ක් මඟින් පමණක් තොරතුරු

ඉදිරිපත් කර තිබුණි. ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය 31 මඟින් රු. මිලියන 6,839 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 1421 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත අතරින් රු.මිලියන 4,077.49ක් වටිනාකමින් යුත් කර්මාන්ත 755 ස්වකීය සේවකයින් හා උපකරණ භාවිත කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි. එම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 හා 4.2 වගන්තිය අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර යාවත්කාලීන කළ යුතු අතර ඒ තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කළ යුතු බවත් 4.2.3(ඇ) වගන්තියට අනුව ප්‍රසම්පාදන කාල සටහන අදාල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතුවුවත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 මඟින් සමාලෝචිත වර්ෂය තුල සිදු කරන ලද රු.මිලියන 6,839.87 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 1421 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු වරයා විසින් නිශ්චය කර තිබුණි.

ii ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.3.2 වගන්තියට අනුකූල නොවන ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා 2021 වර්ෂය තුළ සිදු කරන ලද රු. මිලියන 6,839.87 ක් වටිනාකමින් යුත් ඉදිකිරීම් හා නඩත්තු වැඩ 1421 ක කරන ලද අධීක්ෂණ හා පරිපාලන පිරිවැය අධි ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 154.88 ක් විය.

iii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7 ඡේදයෙහි විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර, වටිනාකම රු.මිලියන 4,077.49 ක කර්මාන්ත 755 ක් ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබූ නමුත් ඒ අතරින් බොහෝ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍රෝපකරණ ගොවි සංවිධාන ඇතුලු බාහිර පාර්ශව මඟින් ලබා ගෙන තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති වටිනාකම ගණනය කළ නොහැකි වාහන 45 ක් වර්ෂ ගණනාවක සිට බාහිර පාර්ශවයන් වෙත එනම් මහවැලි අධිකාරියට වාහන 11 ක් හා වාරිමාර්ග කළමනාකරණ අංශයට වාහන 34ක් ලබා දී තිබුණු අතර එම වාහන දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට හෝ අදාල ආයතන වෙත නීත්‍යානුකූලව පවරා දීමට පියවර ගෙන නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) තිස්ස වැවේ රොන්මඩ ඉවත් කිරීම.

i. වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට විසින් සි/ස.ගජා හෝල්ඩින් (පුද්ගලික) සමාගම සමග 2021 එකී ගිවිසුමට එළඹ තිබුණි. වැවේ වපසරිය වූ අක්කර 120 න් සියයට 17 ක් අනවසරයෙන් වගා කටයුතු සඳහා යොදාගැනීම, වැව වටේ පිහිටි හෝටල්, නිවාස 50 ක් අනවසරයෙන් භාවිතා කරන බව 2019 හඳුනාගෙන තිබුණ ද ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම, වැවේ සීමාවන් හඳුනාගැනීමකින් තොරව ආරම්භ කිරීම, වර්ෂ 10 ක කාලයක් තුළ වැව් පතුලෙහි මට්ටම නිර්ණය නොකිරීම, ජල විදුම් අංශයේ පතුලෙහි මට්ටම සඳහා ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිතයෙන් සිදු කිරීමට ඉල්ලීම සඳහා ක්‍රියාමාර්ග නොගැනීම යන අඩුපාඩු තිබියදී ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. තවද මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇති පාරසරික නිර්දේශ අංක 7.1 වගන්තිය ප්‍රකාරව භූ විද්‍යා සංවර්ධන හා පතල් කාර්යංශයෙන් වෙළඳ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. රොන්මඩ නිස්සාරණය කර ලබාගෙන තිබූ වැලි අලෙවි කිරීමට හැකියාව තිබුණ ද ගිවිසුමේ කොන්දේසි අංක 33 ප්‍රකාරව වාණිජ කටයුත්තක් ලෙස සිදු වූවානම් රාජ්‍ය භාගය අයකුළ යුතු වුවත් එළෙස සිදු කර නොතිබුණි.

ii. යන්ත්‍ර ආධාරයෙන් වැව තුළින් ලබාගන්නා ලද රොන් මඩ කිසිලෙසකින්වත් වැව තුළ සේදීම නොකළ යුතු අතර වැවෙහි හෝ ප්‍රධාන ඇලෙහි ජලය අපවිත්‍ර නොකළ යුතු බව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 10 වගන්තියේ ඇතුලත් වුවද ඊට පටහැනිව තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු විසින් තාවකාලිකව ලබා දී ඇති වැඩ බිම තුළ මෙම ව්‍යාපෘතිය අවසන් වන තෙක් වැලි නිස්සාරණය කිරීම පවත්වාගෙන යාමට එකඟතාවය ලබා දී තිබුණි.

iii. කැලෑ ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු අනුව, ඉවත් කර ගනු ලබන මතුපිට පස් කියුබ් 01 ක් සඳහා රු.1,120 බැගින් වූ ඉඩම් පරිහරණ ගාස්තුවක් අයකිරීමේ හැකියාවක් පැවතියද එම කොන්දේසිය ගිවිසුමට ඇතුළත් කර නොතිබීම නිසා ව්‍යාපෘති වාර්තා අනුව දිනකට කියුබ් 100 බැගින් මාසිකව ඉවත් කිරීමට අපේක්ෂිත කියුබ් 2400 ක් වෙනුවෙන් අයකර ගත හැකිව තිබූ වටිනාකම රු.2,688,000 ක් විය. ඒ අනුව ගිවිසුම් කාලය වූ මාස 12 ක් තුල රජයට අහිමි වී ඇති මුදල රු. 32,265,000 ක් විය.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වහලයෙන් පිටතට යන වැසි ජලය ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රමවේද භාවිතා නොකිරීම, කොන්ක්‍රීට් පුවරුව නිසි පරිදි නඩත්තු නොකිරීම හා අවශ්‍ය අලුත්වැඩියාවන් යාවත්කාලීනව සිදු නොකිරීම නිසා 2010 වසරේ සිට ගොඩනැගිල්ලේ අභ්‍යන්තරයට ජලය කාන්දු වී තිබුණි. එම ජල කාන්දුව නිසා ගොඩනැගිල්ලේ පළමු කොටසේ සියළු මහලයන්හි ඇති අංශ වලට බලපා තිබුණි. ගොඩනැගිල්ලේ සියලු අංශවල පැවති කාර්යාල උපකරණ, පරිගණක පද්ධති, ලිපිගොනු හා පොත්පත් හානිවීම් ඇති වී තිබුණි.

(ඇ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය 7.2.1.2 (ආ) I වගන්තිය අනුව III වන ශ්‍රේණියේ සෘජු බඳවා ගැනීම් සඳහා වෘත්තීය සුදුසුකම් ලෙස ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකයක් ලබා තිබීම පිළිගෙන ඇති අතර එම පාඨමාලාව NVQ 6 මට්ටම විය යුතු බව සඳහන් වේ. සේවා ව්‍යවස්ථාව අනුමත කර වර්ෂ 05 ක් ගතවී ඇතත් මේ දක්වා ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා NVQ 6 මට්ටම අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටුව

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 මැයි 21 හා 2019 ජුනි 24 දිනැති අංක DMA/PRF/10/2019/01 දරන විගණන මාර්ගෝපදේශ ලිපි අනු දේශීය හා විදේශීය මූල්‍යනය සහිතව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපනය කරමින් අවම වශයෙන් වර්ෂයකට කමිටු හතරක්වත් පැවත්විය යුතු බව දක්වා ඇත. එහෙත් දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දේශීය අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘති 25 ක් සම්බන්ධයෙන් විගණන හා කළමනාකරන කමිටු පවත්වා නොතිබීම හේතුවෙන් එම සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් විගණනයට සැහීමට පත්විය නොහැකි විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	ඌන සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	437	361	76
තෘතීය මට්ටම	165	26	139
ද්විතීය මට්ටම	2,707	2,189	518
ප්‍රාථමික මට්ටම	3,720	2,807	913
	7,029	5,383	1,646

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 26 ක් වෙත විශාල ඉදිකිරීම් අංශය මගින් කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම අනුමත කර තිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් එම තනතුර අනුමත කර ගෙන නොතිබුණි. වර්ෂ 1- 5 දක්වා වැඩ බැලීමේ පදනම යටතේ සේවකයින් 13 දෙනෙකු අනුයුක්ත කිරීම් කර තිබුණි.

ඩී.වී. වන්දුලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට